

# ධරණී

සතුටින් ජීවිතය දරන්නී


2022 ජනවාරි 12 වන බදාදා

දෙවන කාණ්ඩය හයවන කලාපය මිල රු. 50 යි


ධරණී ශ්‍රී ලංකාවේ අංක එකේ කාන්තා පුවත්පත

## ගහෙන් වැටුණු දරුවන්ට මීට පස්සේ ගොනා අනින්නේ නෑ

## මම ගෑස් එකක් ගත්තෙත් දවස් හතරක් ඇවිදලා

- මන්ත්‍රිනී ගීතා කුමාරසිංහ

## නෝනලා ලොකු පුටු වලට යද්දි මහත්තුරුන්ට යකා නගින්නෙ ඇයි?

## මගේ හඬින් නිළි දඩයමේ යන පල් හොරා අල්ලන්න

- මහාචාර්ය සුනිල් ආරියරත්න

නිවසේ සිටින කාන්තාවන්ට ස්වයං රැකියාවත් වෙළඳපොළත් දෙකම මුනගස්වන

## ධරණී ස්වයං රැකියා

2021 සංචාරක රූ රැජින

**නලීෂා භානු**

■ ඡායාරූපය - සමන් අබේසිරිවර්ධන

■ පසුතලය - සෝලිස් හොටෙල් පිටකෝට්ටේ

# කෙට්ටු උස යුවතියකට සාම්ප්‍රදායික නොවූ උඩරට විලාසිතාවක්

**'ධරණී'** මනාලියට රට වටෙන්ම ලැබෙන්නේ ඉතා ඉහළ ප්‍රතිචාරයක්. මේ නිසාම අපි අද ගල්ගමුවේ තැපැල් කාර්යාලය ඉදිරිපිට ඇති **'සැලෝන් ඕලු'** රූපලාවන්‍ය ආයතනයේ නිලීමා හේමමාලිව සොයා ගියේ තවත් අපූරු සොඳුරු මනාලියකගේ සුන්දරත්වය දැකගන්න. අද නිලීමා හැඩ කරන්නේ සාම්ප්‍රදායිකත්වයට කොටු නොවූ උඩරට මනාලියක්.



**"මේ මනාලිය කෙට්ටු සිරුරක් තියෙන උස කෙනෙක්. ඒ වගේම ඇයට තියෙන්නේ පැහැපත් සිරුරක්. සාම්ප්‍රදායට කොටු නොවූ උඩරට මනාලියක් ලෙස ඇයව හැඩගන්වන්න හිතුවේ ඒ නිසායි. ඕෆ් වයිට් සාරියට ඉරහඳ, කර මාලය භාවිතා නොකර ජුවලරි අඩු කළේ ඇය තුළ ඇති සරල බව පෙන්නන්නමයි. කට්වර්ක් සාරියක් ඇඳලා ජුවලරි ගොඩක් දැම්මොත් ලස්සන නැහැ. මොකද සාරියේ රෙද්දේ හිඩැස් වගේ ලොකු ඩිසයින් එකක් තියෙනවා. ඒ නිසා සාරිය මේඩප් කරලා ලයිනින් එකක් විතරක් දැම්මා. සාරිය නිර්මාණය කළේ කොටන් රෙද්දෙන්. ඒ වගේම ඒක සම්පූර්ණයෙන්ම අතින් තමයි නිර්මාණය කළේ. සාරියට කිසිම වර්ක් එකක් නොදැම්මේ කට්වර්ක් එකක් තියෙන මෝස්තරය නිසා අලුත් මෝස්තරයක් අවශ්‍ය නැති නිසා. ඒ වගේම සාරියේ අත ළඟ ටිකක් විශාල බෝර්ච්චියක් දලා වෙනසක් ඇති කරලා තියෙනවා. අනෙක් විශේෂම කාරණාව තමයි මනාලියගේ සමේ පැහැපත්කම මතුවෙන්න සාරි ජැකට් එකේ කර ලොකුවට කපලා තියෙනවා.**

**ඒ වගේම මනාලියගේ සමේ පැහැපත් බව නිසාම ඇයට සිම්පල් මේක්අප් එකක් තමයි භාවිතා කළේ.**

**සුදු පාට සාරියක් ඇඳලා ඉන්න නිසා මල් කළඹත් සුදු පාටට ගත්තොත් මනාලියගේ පෙනුම යට යන්න පුළුවන් කියලා මට හිතුණා. ඒ නිසා මල් කළඹට විවිධ පාටවලින් යුතු කලවම් මල් භාවිතා කළා. ඇය උස නිසා මල් කළඹ දිගට සකස් කළා.**

**සාම්ප්‍රදායික මනාලියකට නම් ජුවලරි 24ක් විතර භාවිතා කරනවා. නමුත් මේ මනාලියට ඉන් හරි අඩක් විතරයි භාවිතා කළේ. කෙට්ටු උස සිරුරක් තියෙන යුවතියකට ගැළපෙන විලාසිතාවක් පෙන්වන්න තමයි මට අවශ්‍ය වුණේ. මේ මනාලිය තුළින් එය මනා ලෙස මතුකර පෙන්වන්න මට හැකි වුණා."**









මනාලිය හැඩගැන්වීම -
රූපලාවන්‍ය ශිල්පිනී
**නිලීමා හේමමාලි**



ඡායාරූප -
**පසිඳු විමල**

සම්බන්ධීකරණය -
**ක්‍රිෂාන්ත පුෂ්පකුමාර**
**0763113839**



# මමත් ගෑස් එකක් හොයාගත්තේ දවස් හතරක් ඇවිදලා

## - පාර්ලිමේන්තු මන්ත්‍රිනී ගීතා කුමාරසිංහ

**ගෑස් පෝලිම, පොහොර ගැටලුව මෙන්ම ආහාර ද්‍රව්‍යවල මිල අධික ලෙස ඉහළ යාම හමුවේ, කාන්තාවන් මුහුණදෙන ගැටලු එකම ස්වරූපයක් ගනී. අතේමිටේ මුදල් තිබුණත් දින ගණන් ගෑස් පෝලිම්වල ඉන්නට බොහෝදෙනෙකුට සිදුව ඇත.**

**පාර්ලිමේන්තු මන්ත්‍රිනී ගීතා කුමාරසිංහ මහත්මිය කියන්නේ මේ ඇතැම් ප්‍රශ්න ඈතින් තිබුණු ඒවා බවයි. කඩිගුලකට අත දමනවා මෙන් ඒවා අවුස්සාගෙන ඇතිමුත්, එම තීරණ තවමත් නිවැරදි කරන්නට හැකි බවද ඇය කියන්නීය. මේ ඇය හා ‘ධරණී’ කළ සම්මුඛ සාකච්ඡාවක් ඇසුරින් සැකසුණු ලිපියකි.**

> පුළුවන්නම් එකපාරක් මිනිස්සුන්ට පොහොර ටික නොමිලේ දෙන්න කියලයි මම ඉල්ලන්නේ

> කඩිගුලකට අත දාලා අවුස්සගත්තා වගේ වැඩක් වුණේ

### ආණ්ඩුව පසුගියදා සහන මල්ලක් දුන්නත්, කාන්තාව බත ඉදවගන්න බැරි තැනක හිරවෙලා?

ඇත්තටම ජනතාව පීඩාවට පත්ව ඉන්නා අවස්ථාවක් නිසයි ඒ සහන ලබාදෙන්න බැසිල් රාජපක්ෂ මහතා තීරණය කරන්න ඇත්තේ. එය හොඳ දෙයක්. කොහොම වුණත් එය තාවකාලික පිළියමක් මිස පවතින ප්‍රශ්නවලට විසඳුමක් නොවන බව පැහැදිලියි. මට හිතෙනවා, ගොවි ජනතාවට පොහොර ටික නොමිලේ ලබාදෙන්න කටයුතු කළා නම් එය වැදගත් කියලා.

ගමේ ගොඩේ නම් කොස් ටිකක් තම්බලා, කිරි හොද්දක් එක්ක වුණත් කන්න පුළුවන්. ගමේ කොළ පළා ටික තියෙනවා. එළවලු ලොකුවට හොයන්නේ නැහැ. ඒත් බත කියන්නේ සිංහලයාගේ ප්‍රධාන ආහාරය. පොහොර ප්‍රශ්නය නිසා හාල් ටික නොලැබෙන එකත්, එහෙම නැත්නම් මිල වැඩිවෙන එකත් මිනිස්සුන්ට දැඩිව බලපානවා. ඒ වගේමයි ගෑස් ප්‍රශ්නය නිසා බොහෝදෙනෙක් පීඩාවට පත්වෙලා. සල්ලි තිබුණත් අද බත ඉදවගන්න ගෑස් එක ගන්න ලොකු සටනක් කරන්න වෙලා තියෙනවා.

### ඒ සටන කරලා ගෑස් එකක් අරගත්තත් කොයිවෙලේ පුපුරයිද කියන බයෙනුයි ජනතාවට ඉන්න වෙලා තියෙන්නේ.

ඔව්. මම නම් කියන්නේ මේවායේ වගකීම දරණ පිරිසක් ඉන්නවනේ. ඇමතිද, සභාපතිද වෙනත් නිලධාරියෙක්ද කියන එක නෙවෙයි ප්‍රශ්නෙ. අස්කරනකල් නොඉඳ හරිනම් ඒ අය ඉල්ලා අස්වෙන්න ඕන. කොරෝනා නිසා එදාවේලත් අහිමි වෙච්ච මිනිස්සු ඉන්නේ. ඔවුන් ජීවත්වෙන්න අරගල කරනවා. ඒ වගේම අතේ සල්ලි තිබුණත් නැතත් සෑම තරාතිරමකම කාන්තාවන්ට අද එළවලු ටික ගන්න ගියහම දෙපාරක් හිතන්න වෙනවා. ඒ අරන් ඇවිල්ලත් ගෑස් එක පත්තු කරද්දි කොයිවෙලේ පුපුරයිද කියන තිගැස්ම එනවා. මේ සමහර ප්‍රශ්න පැත්තක යද්දි අපි ඇදලා ඇඟට දාගත්තු ඒවා. පොහොර ප්‍රශ්නයත් අහක තියෙන කඩිගුලකට අත දාලා අපිම අවුස්සගත්තු එකක්. මම ජනාධිපතිතුමාට කියන්නේ, අපිට මේ වෙලාවේ ජනතාවට දෙන්න පුළුවන් හොඳම සහනය තමයි පොහොර ටික ගෙන්වලා, ඊළඟ කන්නය වගා කරගන්න නොමිලේ ලබාදෙන එක. එකපාරක් ජනතාවට නොමිලේ පොහොර ටික දෙන්න කියලයි මම ඉල්ලන්නේ.

කුඩා තේ වතු හිමියෝ රැසක් බෙන්තර ඇල්පිටිය ප්‍රදේශවල ඉන්නවා. තමන්ගේ ගෙවත්තේ එහෙමත් නැත්නම් අක්කර බාගේ, කාලේ, පර්චස් කිහිපයේ තේ වගා කරගෙන එදිනෙදා ජීවිකාව ගෙනයන උදවිය. එදා තේ දළු කිලෝ සීයක් ගත් කෙනාට පොහොර නැතිකම නිසා කිලෝ විස්සයි තිහයි අද ලැබෙන්නේ. කිලෝ පනහ ගත් කෙනාට දහය පහළොවයි ලැබෙන්නේ. කුරුඳු වගා කරන අයටත් එහෙමයි. මම ගමේ ගොඩේ ඇවිදින කෙනෙක් විදියට මේ සත්‍යය දකිනවා. මිනිස්සු හරි වේදනාවෙන් කතා කරන්නේ. කාබනික වගාව නරක නෑ. ඒක හොඳ දෙයක්. ඒත් කොරෝනා නිසා ලෝකෙම වැටිලා ඉන්න මොහොතක මේ ඉන්න තැනින් නැගිටින්නයි අපි බලන්න ඕන. ආණ්ඩුව ජනතාවට එන්නත් ලබාදෙන්න විශාල මුදලක් වැය කළා. අද ඩොලර් ගැටලුවකටත් අපි මැදිවෙලා. රටක් හැටියට නැගිටින්න නම් සාමූහිකව අපි මේවට පිළිතුරු සොයන්න ඕන. කාබනික වගාවට හෙමින් යමු. එහෙම නැති වුණොත් මේ ප්‍රශ්නයෙන් ගොඩ එන්න අපහසුයි.

> තනිකර කාබනික වගාව කරන්න නම් තව අවුරුදු තිහ හතළිහක්වත් යාවි

### කාබනික වගාව සාර්ථක කරගන්න අපි සෑහෙන දුරක් යා යුතුයි කියලද ඔබ කියන්නේ?

ඔව්. තනිකර කාබනික වගාව කරන්න නම් තව අවුරුදු තිහ හතළිහක්වත් යාවි. මේ පොළොව දැන් රසායනික පොහොරට හුරුවෙලා. ඒ තත්ත්වයෙන් මිදෙන්න කාලයත් එක්ක ක්‍රමානුකූල වැඩපිළිවෙලකට යා යුතුයි.

මට මතකයි මම ස්විස්ටර්ලන්තයේ ඉඳිද්දී ඒ ආණ්ඩුව කාබනික පොහොරවලින් වගා කරන්න ඕන කියන යෝජනාව ගෙනැත් ජනමත විචාරණයක් තිබ්බා. තැපැල්පතකින් තමයි ඊට කැමැත්ත අකමැත්ත ප්‍රකාශ කරන්න තිබුණේ. ඒ වෙලාවේ අති බහුතරයක් ඊට අකමැත්ත ප්‍රකාශ කළා. ඒ නිසා එය ක්‍රියාවට නැංවූයේ නැහැ. මොකද ඒ ජනතාව දැනගෙන හිටියා එහි බැරෑරුම්කම. ඔවුන් කාබනික පොහොරට අකමැති නිසා නෙවෙයි එහෙම කළේ. ඒ රටේ හැම ගෙදරකම වගේ පුංචි එළවලු කොරටුවක් තියෙනවා. මාලුමිරිස්, කැරට්, ලීක්ස් වගේ ගෙදර භාවිතයට ගන්න බෝග වගා කරනවා. ඒවට පොහොර විදියට යොදන්නේ මුළුතැන්ගෙයින් ඉවත් කරන එළවලු කැබලි වගේම දිරන අපද්‍රව්‍යයි. ටික කාලයක් ඒවා බඳුනක දාලා තිබුණාම කාබනික පොහොර හැදෙනවා. ඒක වෙනමම දෙයක්. ඒත් මහා පරිමාණයෙන් කාබනික වගාවට යද්දී ඒ ගැන හිතන්න වෙනවා. පොහොර ප්‍රශ්නය විතරක් නෙවෙයිනේ තියෙන්නෙ. ගෑස් ප්‍රශ්නය, බඩු මිල ඉහළ යෑම වගේ මේ සියල්ලෙන්ම වැඩිපුර පීඩා විඳින්නේ කාන්තාවන්.

### ඔබ එහෙම කියන්නේ ඇයි?

අපේ රටේ කාන්තාවෝ, අම්මලා හරිම පව්. ඇයට සැනසීමෙන් ඉන්නම නැහැ. තිස් වසරක යුද්ධය වගේම, දකුණේ භීෂණය නිසා මව්වරු පීඩාවට පත්වුණා. යුද්ධය ඉවරවෙලා හුස්මක් ගන්න හදද්දිම කොරෝනා ඇවිත් ආර්ථිකය එකතැන හිර කළා. ගෑස් ප්‍රශ්න, ඩොලර් ප්‍රශ්න එන්නේ මේ කියන ප්‍රශ්න හමුවෙයි. අද ගෑස් පෝලිම, කිරිපිටි පෝලිම, මේ හැමතැනම කාන්තාවෝ පීඩා විඳිනවා.

### ඔබට මේ කියන ගෑස් ප්‍රශ්නය බලපෑවේ නැද්ද?

මටත් තදින්ම බලපෑවා. බොරු කියන්න ඕන නෑනේ, මම දවස් හතරක් ගෑස් හොයන්න ගියා. මම වාහනෙන් බැස්සේ නෑ. ජනතාව මාව දැක්කොත් ඒ අය අහන දේවල්වලට මට දෙන්න උත්තර නැහැනේ. ඒ නිසා මගේ රියදුරු මහතා තමයි ඒ අවස්ථාවල ගෑස් තියෙනවද කියලා කඩවලින් විමසුවේ. ජනතාව පෝලිම්වල ඉන්න හැටිත් මම දැක්කා. මම අන්තිමට ගෑස් එකක් හොයාගත්තේ හෝටලයක් කරන මගේ යාළුවෙක්ගෙන්. ගෑස් ප්‍රශ්නය මම විසඳගත්තේ එහෙමයි. කොහොම නමුත් මේ ගැටලුව ඉක්මනින්ම විසඳගත යුතුයි.

### ගෑස් ලැබෙනවා වගේම එය පුපුරායාවි කියන බයටත් ඉක්මන් විසඳුමක් අවශ්‍යයි නේද?

ඇත්තටම ඔව්. අර පළවෙනි ගෑස් එක පුපුරලා රූපවාහිනියේ පෙන්වද්දී මම අත්දෙකෙන් මුහුණ වහගත්තා. ඒ ගැන මටත් කටුක අත්දැකීම් තියෙනවා. ඒ කාලෙකට කලින් මගේ ගෙදරත් ගෑස් කාන්දුවක් වෙලා මට රෝහල්ගත වෙන්නත් සිදුවුණු නිසා.

එතැනදී වුණොත් ගෑස් ටැංකිය පිපිරීමක් නෙවෙයි, රෙගියුලේටරයෙන් ගෑස් කාන්දුවීමකුයි වුණේ. සිද්ධිය වෙද්දි මම ටිකක් ඈතින් සිටි නිසා හානිය අවම වුණා. ඒත් අද ගෘහණියෝ බයයි කොයිමොහොතේ ගෑස් එක පුපුරා යයිද කියලා. මීට පිළියම් යොදන එක වගකිව යුත්තන්ගේ වගකීමක්.

ඒ අතරේ සමහරු බලා ඉන්නවා ආණ්ඩුව බිඳ වැටෙනකල්. මම කියන්නේ ආණ්ඩුවේ වැරදි හදාගෙන සාර්ථක ගමනක් යන්න තවම පුළුවන්.

පොහොර ටික එක වරක් හරි නොමිලේ ගෙන්වලා ගොවි ජනතාවට නොමිලේ දෙන්න. ඒ ගොවි, ගෙවිලියන් ඇතුළු පුංචි මිනිහගේ හිත්වල ගින්දර නිවලා දාන්න පුළුවන් එතකොටයි.

**දීපා වසන්ති එදිරිසිංහ**


ගල්කිස්ස මහ හෝටලය එදා

## පෙම අරන් නම තියාගිය

# සුදු මහත්තයා


තෝමස් මේට්ලන්ඩ් ආණ්ඩුකාරවරයා

බ්‍රිතාන්‍ය පාලන සමය තුළ තෝමස් මේට්ලන්ඩ් ආණ්ඩුකාරවරයාගේ නිල නිවස බවට පත්ව තිබුණේ **'මේට්ලන්ඩ් බංගලාව'**යි. සාදයන්ගෙන් අඩුවක් නොවූ මේට්ලන්ඩ් බංගලාවේ එදිනද පැවැත්වෙමින් තිබුණේ රස සාදයකි. කෑමබීමෙන් මධුවිතෙන් පමණක් නොව සාදය රසවත් කරන්නට නර්ථන කණ්ඩායමක්ද පැමිණ තිබුණි. සුරූපී තරුණියන් කීපදෙනෙකුගෙන් සැදුම්ලත් එම කණ්ඩායමේ නර්ථනයන් එද එතැන සිටි සියල්ලන්ගේම සිත් පැහැරගත්තේය. ඇසිපිය නොහෙළා එදෙස බලාසිටින්නට තරම් ඒ නැටුම් සරාගිකය.

මේ අතර නර්තන කණ්ඩායමේ සිටි අතිසුන්දර තරුණියක පිළිබඳව කෙනෙකුගේ හිතේ අමුතු හැඟීමක් කැකෑරෙමින් තිබුණි. ඒ වෙනකෙකුගේ නොව මේට්ලන්ඩ් බංගලාවේ ප්‍රධානියා වූ මේට්ලන්ඩ් ආණ්ඩුකාරවරයාගේ හිතේය. ඉන්පසු කුප්පමේණියා සුවඳ පිටුපස දුවයන බළලෙකු මෙන් ඔහු ඇය පසුපස ගියේය. සුරූපී ඇය පිළිබඳව දිගින් දිගටම විස්තර සෙව්වේය.

දින කිහිපයක් ගතවෙද්දී එම තරුණියගේ නම **'ලොවීනා'** බව ආණ්ඩුකාරවරයාට ආරංචි විය. එසේම ඇය රොඩී කුලයක තරුණියක් බවද දැනගන්නට ලැබුණි. ලන්දේසි පුද්ගලයෙකුට දාව රොඩී කුලයක කාන්තාවකගේ කුසේ ඉපදුණු ඇයට ඒ වනවිට වයස අවුරුදු දහතක් පිරුණා විතරය. වයසින් මඳක් පරිණත වුවද කඩවසම් පෙනුමක් තිබූ මේ ආණ්ඩුකාරවරයා සමඟ පෙමින් වෙළෙන්නට ලොවීනා පසුබට වුණේ නැත. එද පටන් එම කාලය පුරාවටම ආණ්ඩුකාරවරයා ඇයව හඳුන්වා ඇත්තේ **'ලොවීනා'** ලෙස නොව **'ලැවීනියා'** ලෙසය. ඒ ඔහුට උච්චාරණය සම්බන්ධව තිබූ අපහසුව නිසාය.

මේ කාලය තුළ ඔවුන් දෙදෙනාගේ මුණගැසීම් සිදුවූයේ රහසේය. ඒ වෙනුවෙන් ආණ්ඩුකාරවරයා රහස් උපක්‍රම පවා යොදා තිබුණි. ඔහු තම නිල නිවසේ සිට ලොවීනා ජීවත් වූ රොඩී නිවස දක්වා දිවෙන රහස් උමඟක්ද තැනුවේය. නමුත් කාලය ගතවෙද්දී මේ සම්බන්ධය රහසක් ලෙස තබාගැනීමට දෙදෙනාටම නොහැකි විය. එනිසා මේ ආදර කතාවේ පරක් තෙරක් නොදැන සිටි බොහෝදෙනා පැවසුවේ ලොවීනා යනු මේට්ලන්ඩ් ආණ්ඩුකාරවරයාගේ ලිංගික භාණ්ඩයක් බවයි. නමුත් එය හුදෙක්ම වැරදි වටහා ගැනීමක් වූ අතර ආණ්ඩුකාරවරයා සැබෑ ලෙසම ඇයට ආදරය කරමින් තිබුණි.

දෙදෙනා අතර ආදර කතාව මෙසේ ගලායද්දී ආණ්ඩුකාරවරයාගේ නිල නිවසේ සිටි එක් සොල්දාදුවෙකුට ලොවීනා පිළිබඳව පෙම් සිතක් පහළ විය. ඔහු ඇයව හමුවීමටද කිහිපවරක්ම උත්සාහ ගත්තේය. ඒ බව කනවැකුණු වහාම ආණ්ඩුකාරවරයා කළේ ඔහුට වෙඩි තබා මරා දැමීමයි. ඒ ඇය නිසා ඔහු අතින් මියගිය දෙවෙනි සොල්දාදුවා වූ අතර ඊට පළමුවද ඇගේ නිරුවත් උඩුකය දෙස බලා සිටි සොල්දාදුවෙක් ඔහු අතින් මැරුම් කා තිබුණි. එද කුලය අනුව රොඩී කාන්තාවන්ට හිමිව තිබූ තැන මත ඔවුන්ට උඩුකය වැසෙන සේ ඇඳුම් ඇඳීමේ අවසරයක් තිබුණේ නැත. එම සිදුවීමෙන් පසු මේට්ලන්ඩ් ආණ්ඩුකාරවරයා සියලුම කුලහීන කාන්තාවන්ට උඩුකය වසා ගැනීමට ප්‍රසිද්ධියේම අවසර ලබාදුන් බව කියැවේ.


ආණ්ඩුකාර මේට්ලන්ඩ් සහ ලොවීනා දෙපළගේ සිතුවමක්

නමුත් කාලය ගතවෙද්දී මේ ආදර සම්බන්ධය ගැන පුවත එංගලන්තයේ ජෝර්ජ් රජතුමාගේ කනටද ගියේය. ඔහු සිතුවේ, මේට්ලන්ඩ් ලංකාවේ සිට තමාගේ මුදල් කුලහීන රොඩී තරුණියක් වෙනුවෙන් වියදම් කරන බවයි. සත්‍යය එය නොවුණද ජෝර්ජ් රජුට එසේ සිතන්නට ඕනෑවටත් වඩා සාක්ෂි තිබුණි. ඔහු අත වූ ලොකුම සාක්ෂිය වූයේ ඒ වනවිටත් මේට්ලන්ඩ් ආණ්ඩුකාරවරයාට විරුද්ධව රජුට ලැබී තිබූ පෙත්සම් ගණනාවයි. එහි ප්‍රතිඵලය වූයේ මේට්ලන්ඩ් නැවත මව්රටට ගෙන්වා ගැනීමට ජෝර්ජ් රජු කටයුතු කිරීමයි. ඒ අනුව පස් වසරක් පුරාවට ගලා ගිය ආදර කතාවට තිත තබන්නට අකමැත්තෙන් වුවද **'මේට්ලන්ඩ්-ලොවීනා'** දෙදෙනාට සිදුවිය.

ඒ නිසා මේට්ලන්ඩ් නැවත එංගලන්තය බලා ගිය අතර ලංකාවේ ආණ්ඩුකාරවරයා ලෙස ඔහුගේ නිල කාලය සටහන් වූයේ වර්ෂ 1805 සිට 1811 දක්වා කාලයයි. නමුත් මව්රටට යෑමට පෙර ඔහු ජෝර්ජ් රජුගෙන් එක් ඉල්ලීමක් කළේය. සාජහාන් රජුට මෙන් ආදරයේ නාමයෙන් ටජ්මහලක් තැනවීම ප්‍රායෝගික නොවූ නිසාදෝ ඔහු කළ ඉල්ලීම වූයේ තමා විසූ නිල නිවස **'මවුන්ට් ලැවීනියා'** ලෙසින් නම් කරන ලෙසයි.

**කෙල්ලට බැල්ම දාපු කොල්ලො දෙන්නෙක්ව වෙඩි තියලා මරලා**

ඒ අනුව ලොවීනා පිළිබඳව මතකයන් ඇයව මුණගැසුණු මේ බිම මත සදා අමරණීය කිරීමේ අදහසින් කළ ඉල්ලීමට එංගලන්ත රජයේ අනුමැතිය ලැබුණි. එද මේට්ලන්ඩ් බංගලාව ලෙසින් හැඳින්වූ එය පසුව **'මවුන්ට් ලැවීනියා බංගලාව'** ලෙසින් වෙනස් වූ අතර එයින් නොනැවතී එය පිහිටි ගල්කිස්ස නගරයද **'මවුන්ට් ලැවීනියා'** ලෙසින් හඳුන්වන්නටද බොහෝදෙනා හුරුවිය.

**සුදු මහත්තයා එංගලන්තෙට ගියාම ලොවීනා මුහුදට පැනලා**


සියල්ල එසේ සිදුවුවත් තමාට පණ මෙන් පෙම් කළ මේට්ලන්ඩ් සුදු මහත්තයා නොමැතිව ජීවත්වීමේ ඵලක් නැතැයි සිතූ ලොවීනා මුහුදට පැන දිවි නසාගත්තාය.

**'මේට්ලන්ඩ්-ලොවීනා'** ආදර කතාවට වසර දෙසිය ගණනක් ගතවී තිබුණද අදටත් ගල්කිස්ස මුහුදු වෙරළ දෙසින් හමන සුළගේ ඔවුන් තෙපලූ ආදර වදන් දෝංකාර දෙනු ඇසේ. එද තෝමස් මේට්ලන්ඩ් ඉංග්‍රීසි ආණ්ඩුකාරවරයා සිටි මේට්ලන්ඩ් බංගලාව වෙනුවට අද එහි ඇත්තේ ගල්කිස්ස මහහෝටලයයි.

එමෙන්ම අද ගල්කිස්ස බෞද්ධ බාලිකා විද්‍යාලය ඉදිකර ඇත්තේ එද ලොවීනා ජීවත් වූ බව පැවසෙන රොඩී නිවස තිබූ ස්ථානයේය.

එද මේට්ලන්ඩ් බංගලාවත් රොඩී නිවසත් යා කරමින් තිබූ රහස් උමඟ අද සම්පූර්ණයෙන්ම වැසී ගොස් තිබේ. ඒ සියල්ල කාලයත් සමඟ එලෙසින් වෙනස් වුවද තෝමස් මේට්ලන්ඩ් සහ ලොවීනාගේ සොඳුරු වූ ආදර කතාව නම් අදටත් අමරණීයය.

**රුවන් එස්.සෙනවිරත්න**


ගල්කිස්ස මහ හෝටලයේ වර්තමාන දසුනක්

## දැරිය හැකි මිලකට විශ්වාසවන්තව

# ඔබේ විදෙස් අධ්‍යාපන සිහිනය සැබෑ කරගන්න

දවසක හොඳම විශ්වවිද්‍යාලයක අධ්‍යාපනය ලබන එක අපි කාගේත් ජීවිත ඉලක්කයක්. ඒ වගේම තමන්ගේ දුවා දරුවන්ව හොඳම විශ්වවිද්‍යාලයකට යවා අධ්‍යාපනයක් ලබාදීම ඕනෑම දෙමව්පියෙකුගේ හිත්වල කකියන හීනයක්. ඉතින් ඒ හීනයට යන ගමනේදී ඔබට ශිෂ්‍ය වීසා බලපත්‍ර ලබාගැනීමට අතිශය විශ්වසනීය තැනක් අවශය නිසයි අද අපි Benchmark International Consultant Privet Limited ගැන කතා කරන්න හිතුවේ. නුගේගොඩ පිහිටි Benchmark ආායතනය කැනඩාව, ඕස්ට්‍රේලියාව, ඇමෙරිකාව, නවසීලන්තය, එක්සත් රාජධානිය, යුරෝපය සහ රුසියාව ඇතුළු බොහෝ රටවල අධ්‍යාපන අවස්ථා දැයේ දරුවන්ට උදකරදීමට 2007 වසරේදී ආරම්භ වුණා.

ඒ සඳහා අත්දැකීම් බහුල ප්‍රමුඛ පෙළේ කාර්යමණ්ඩලයක්ද Benchmark සමඟ සිටින අතර මේ හරහා විදෙස්ගත වන ඔබට අනෙක් ආායතනයන්ට සාපේක්ෂව ලැබෙන ප්‍රතිලාභ රැසකි. පිළිගත් ජාත්‍යන්තර විශ්වවිද්‍යාලයන් සමඟ සම්බන්ධවීමටත්, උසස් අධ්‍යාපන කටයුතුවලින් පසුව එරට රැකියාවක නිතර වීමටත් මේ හරහා ඔබට අවස්ථාව සැලසෙනු ඇත. එමෙන්ම මේ වනවිට Benchmark නවසීලන්තයේ TNZ Recognize Agency එකක් වශයෙන්ද එම රටවල් සමඟින් ගිවිසුම්ගතව කටයුතු කරන අතර (Direct Agent) 2020 වසරේදී Best Consulting Partner ලෙසත් සම්මානයට පාත්‍රව ඇත.

**"ඇත්තම කිව්වොත් විදෙස්ගත වන දරුවෙකුගේ ආරක්ෂාව හා අනෙකුත් පහසුකම් සැපයීම ගැන බොහෝවිට දෙමව්පියන් පසුවන්නේ චකිතයකින්. නමුත් අප ආායතනය මගින් ඒ සඳහා විශේෂ පහසුකම් සපයනවා වගේම විනිවිදභාවයක් සහිතව විශ්වසනීය සේවයක් සිසුන්ට ලබාදෙනවා.**

**ඒ වගේම අප ආායතනය මගින් විදෙස්ගත වන බොහොමයක් සිසුන් නිතරම අපිට කතා කරනවා. අනික ඒ අය අපිට අපේම පවුලේ අය වගේ. විශේෂයෙන්ම 2007 වසරේ ඉඳන් මේ දක්වා අප ආායතනයේ විශාල ශිෂ්‍ය සංඛ්‍යාවක් විදෙස් අධ්‍යාපනයට ගිහිල්ලා තියෙනවා. එනිසාම අප ආායතනයේ විශ්වසනීයත්වය සම්බන්ධයෙන් විශාල ශිෂ්‍ය සංඛ්‍යාවක් සාක්ෂි දරනවා. මේ වෙනකොට අපි ජාත්‍යන්තරවත් පිළිගත් ආායතනයක් නිසා අප කෙරේ ඇති ඒ විශ්වාසයත් රැකගෙන ඉදිරියට යාම තමයි අපේ මූලිකම අරමුණ."**


Benchmark කළමනාකාර අධ්‍යක්ෂිකා නිලූකා හෙට්ටිආරච්චි

එසේ කියන්නේ Benchmark කළමනාකාර අධ්‍යක්ෂිකා නිලූකා හෙට්ටිආරච්චිය.

එමෙන්ම ඕනෑම විෂය ධාරාවක් සඳහා අවම ගාස්තුවක් යටතේ විදෙස්ගත වීමට මේ හරහා ඔබට අවස්ථාව සැලසෙන අතර ලියාපදිංචියේ සිට ගුවන්ගමන් සඳහා ටිකට්, ගුවන්තොටුපොළේ සිට විශ්වවිද්‍යාලය වෙත රැගෙන යෑම, නවාතැන් පහසුකම් හා අර්ධකාලීන රැකියා සඳහා ද Benchmark සේවා සපයනු ලබයි.

ඔබේ විදෙස් අධ්‍යාපනය සඳහා යොදවන මුදලට උපරිම සේවයක් ලබාදීමට Benchmark කාර්යමණ්ඩලය කටයුතු කරයි. උපාධි පාඨමාලාවන් සම්පූර්ණ කළ සිසුන්ට, උසස් පෙළ, සාමාන්‍ය පෙළ අවසන් කළ සිසුන්ට පමණක් නොව 1 ශ්‍රේණියේ සිට සියලුම සිසුන්ට විදේශ අධ්‍යාපනය ලබාදීමට Benchmark ආායතනය සැදී පැහැදී සිටී.

එමෙන්ම විදෙස් අධ්‍යාපනයකට යාමට බලාපොරොත්තුවෙන් සිටින ඔබට මේ වනවිට ගෝලීය වශයෙන් පැතිරෙන Covid-19 වසංගතය විශාල බාධකයක් වී ඇති බවට සැකයක් නැත. එනමුත් ඔබගේ අධ්‍යාපන කටයුතු අතරමග නවතාගත යුතු නැත. පවතින වත්මන් තත්ත්වය අනුව මේ වනවිට විදේශ අධ්‍යාපනයක් ලබාගැනීමට අත්වැල් බැඳගත හැකි හොඳම ආායතනය Benchmark ආායතනයයි.

වසර 15ක ඉතිහාසය තුළ විශාල සිසුන් සංඛ්‍යාවක් උසස් අධ්‍යාපනයට විශ්වාසවන්තව හා ආරක්ෂාකාරීව විදෙස්ගත කිරීමට Benchmark කටයුතු කර ඇත.

ඒ පිළිබඳව එහි සභාපති කුමා හේවගේ මහතා කියා සිටියේ මෙවැනි කතාවකි.

**"රටක සංවර්ධන මැනිය හැකි ප්‍රධාන මිනුම් දණ්ඩ තමයි අධ්‍යාපනය කියන්නේ. එමගින් රටට දැනුම මෙන්ම විනිමයද ගලාඑනු ඇති. බොහොමයක් අප සිසුන් හැදෑරීමෙන් පසුව ඒ ඒ රටවල්වල උසස් රැකියාවල නිරත වෙන අතර එය සෘජුවම ඔවුන්ගේ අනාගත දියුණුවටත් හේතු වෙනවා. එමෙන්ම එමගින් ඔවුන්ට අතිශය සැපපහසු ජීවිතයක්ද ළඟාකරගත හැකි වෙනවා. ඉතින් ඔබත් සොයන්නේ අත්දැකීම්බහුල, කාර්යක්ෂම සේවයක් නම් ඊට සුදුසුම තැන Benchmark International Consultant ආායතනය බව මම විශ්වාසයෙන් යුතුව කියන්න කැමතියි."**

දැරිය හැකි පහසු පිරිවැයක් යටතේ ස්ථාවරත්වයෙන්, පහසුවෙන් සහ ඉතාමත් ඉක්මණින් ඔබේ විදෙස් අධ්‍යාපන සිහිනය සැබෑ කරගැනීමට දැන් Benchmark තුළින් අනඟි අවස්ථාවක් උදා වී ඇත.

https://benchmarklk.co.nz වෙබ් අඩවියට පිවිස හෝ 0113 024 986/ 0777 520 080 දුරකතන අංක මඟින් මේ පිළිබඳ වැඩි විස්තර ලබාගැනීමට ඔබට හැකිය.



# ගහෙන් වැටුණු දරුවන්ට මීට පස්සෙ ගොනා අනින්නෙ නෑ

**"උසාවි ගානේ ගිහින් රටේ ලෝකේ මිනිස්සු ඉස්සරහ ඕවා කියලා උඩ බලාගෙන කෙළ ගහගහන්න පුළුවන් කාටද? ඊළඟට රට්ටුන්ට මූණ දීගන්න බැරුව වහ කාලා මැරෙන්නයි වෙන්නෙ."**

ලිංගික අතවරයන්ට පත් දරුවන්ගේ දෙමව්පියන් සහ භාරකරුවන් බොහෝවිට මුනිවත රකින්නට තීරණය කරන්නේ එහෙම කියාය.

ඊට හේතුව අතවරයකට ලක්වුණු දරුවෙකු සම්බන්ධයෙන් අධිකරණයේ ප්‍රසිද්ධියේ නඩුව විභාග වනවිට පිරිසක් ඉදිරියේ දරුවා නැවත අපහසුතාවයට පත්වන නිසාය. එය හඳුන්වන්නේ නව නින්දිතභාවයකට පත්වීමක් ලෙසය. නමුත් එහෙමයි කියා දරුවෙකු අතවරයකට ලක්වූ විට නිහඬව සිටීම කළ නොයුත්තකි. මේ නිසා අපවාදයට බියෙන් නිහඬ වන එවැනි අය වෙනුවෙන් විධිමත් වැඩපිළිවෙලක් ක්‍රියාත්මක කිරීමට ජාතික ළමා රක්ෂණ අධිකාරිය පෙරමුණ ගෙන ඇත. එම අධිකාරියේ නීතිය බලගැන්වීමේ උපදේශිකා 'සජීවනී අබේකෝන්' මහත්මිය සමඟ ඒ පිළිබඳව අප කළ සංවාදයේ සටහනයි මේ.

**"මම උදාහරණයක් එක්කම මේ කතාව පටන්ගන්නම්. ටික කාලෙකට කලින් අවුරුදු 16ක විතර අතවරයකට පත්වුණ ගෑනු දරුවෙකුට සාධාරණයක් බලාපොරොත්තුවෙන් නීතිමය පියවරකට යන්න දෙමව්පියන්ට අවශ්‍ය වුණා. ඒත් මේ දරුවා හරස් ප්‍රශ්න අහනකොට ලැජ්ජාවට පත්වෙයි කියන බයට උසාවි කූඩුවට නගින්නම බෑ කියලා, අන්තිමට නඩුවත් එපා කියන තත්ත්වෙට පත්වුණා. බොහෝවෙලාවට මේ අපචාරවලට ලක්වෙලා එන්නෙ අවුරුදු 10-16ත් අතර දරුවො. ඒකත් තමන්ගෙම තාත්තගෙන්, සීයාගෙන්, ඥාතියෙකුගෙන් එහෙමත් නැත්නම් මවගේ අනියම් සැමියාගෙන්. එතකොට ගෙඩාක් අය ඉස්සරහ තමන්ට සිද්ධ වෙච්ච දේ කියන්න එයාලා ලැජ්ජා වෙනවා. අනිත් එක පවුලේ නම්බුව, එයාලගේ ආත්මගරුත්වය නැතිවෙයි කියලා වැඩිහිටියො බය වෙනවා."**

ළමා අපයෝජන සම්බන්ධව අධිකරණයට සාක්ෂි ඉදිරිපත් කිරීමට 'ජාතික ළමා රක්ෂණ අධිකාරිය' නව වැඩපිළිවෙලක් ක්‍රියාවට නැංවීමට යන්නේ මේ ගැටලුවට විසඳුම් ලබාදීමටය.

**"මේකෙදි කරන්නෙ දරුවාව උසාවියට ගෙනියන්නෙ නැතුව දරුවාගේ සාක්ෂිය විතරක් පටිගත කරලා උසාවියට ඉදිරිපත් කරන එක. ඇත්තම කිව්වොත් වීඩියෝ සාක්ෂි පටිගත කිරීම ළමා රක්ෂණ අධිකාරියට අලුත් දෙයක් නෙවෙයි. 2004 අවුරුද්දෙ ඉඳලම මේ ක්‍රමය ළමා රක්ෂණ අධිකාරියේ තලවතුගොඩ ප්‍රධාන කාර්යාලයේදී ක්‍රියාත්මක වුණා. නමුත් මුළු රටටම තියෙන්නෙ එතැන තියෙන පටිගත කිරීමේ මැදිරිය විතරයි. එතකොට එතැන තියාගෙන මුළු රටේම දරුවන්ගෙ සාක්ෂි පටිගත කරද්දි නඩු ප්‍රමාදයට ලක්වෙනවා. ඒක නිසා මේ ක්‍රමය රටේ පළාත් නවයෙම රෝහල් නවයක ස්ථාපිත කරන්න තමයි කටයුතු කරන්නේ."**

මෙම පටිගත කිරීමේ මධ්‍යස්ථාන පොලිස් ස්ථාන තුළ ස්ථාපිත නොකර රෝහල් තුළ ස්ථාපිත කරන්නේ, ළමා මිතුරු පරිසරයක නඩු ඇසීමට අවශ්‍ය නිසාවෙන් බවයි ඇය කීවේ. තවද මෙම වසරේ පෙබරවාරි මාසය අවසන් වනවිට මෙහි මුල් පියවර වශයෙන් රාගම ශික්ෂණ රෝහලේ සහ කරාපිටිය ශික්ෂණ රෝහලේ මෙම මැදිරි ස්ථාපිත කරන බවත් මේ වනවිට එයට කැබිනට් අනුමැතියද හිමිව ඇති බව ඇය පැවසීය.



ජාතික ළමා රක්ෂණ අධිකාරියේ සභාපති උදය කුමාර අමරසිංහ



ජාතික ළමා රක්ෂණ අධිකාරියේ නීතිය බලගැන්වීමේ උපදේශිකා සජීවනී අබේකෝන්

**"හැබැයි මෙහෙමයි. මේ ක්‍රමයෙන් පුළුවන් දරුවාගේ මූලිකම සාක්ෂිය පටිගත කරලා උසාවියට ගෙනියන්න විතරයි. නමුත් හරස් ප්‍රශ්නවලට සාක්ෂි සපයන්න දරුවන්ට උසාවියේ පෙනී හිටින්න වෙනවා. ඒකට පිළියම් විදියට දරුවන්ව සජීවී දුරස්ථ පාලක මැදිරියක තියලා උසාවියට සම්බන්ධ කරවන්න අපි යෝජනා ඉදිරිපත් කරලා තියෙනවා (දුරස්ථ සාක්ෂි ලබාදීමේ මධ්‍යස්ථාන)."**

> **පොඩි හරි වැරදීමක් වුණොත් ඒකෙන් වාසි අරගෙන විත්තියේ පාර්ශවය ක්‍රියාත්මක වෙන්න පුළුවන්. ඒ නිසා මේක ආවට ගියාට කරන්න පුළුවන් දෙයක් නෙවෙයි**

දරුවන්ගේ වීඩියෝ සාක්ෂි පටිගත කිරීම්වල නිරවද්‍යතාවය මෙන්ම සුරක්ෂිතභාවය ගැනද ඇය පැහැදිලි කළාය.

**"අපි පටිගත කරන සාක්ෂිය ජාතික ළමා රක්ෂණ අධිකාරියේ සෝදුපත් නිලධාරියා විසින් ලිඛිතවත් සටහන් කරගන්නවා. එතැනින් එහාට සෝදුපත් නිලධාරියාත්, සාක්ෂිය පටිගත කරන තාක්ෂණික නිලධාරියාත් උසාවියට ගිහිල්ලා මේ වීඩියෝ සාක්ෂි නිරවද්‍යයි කියලා සාක්ෂි සපයනවා."**

> **කාලයක් යද්දි දරුවන්ට අතවරයේ ස්වභාවය අමතක වෙලා. එහෙම නැත්නම් විත්තියේ පර්ශවයෙන් සාක්ෂිවලට බලපෑම් එල්ල වෙලා**

පසුව එම වීඩියෝ සාක්ෂි පට නඩුභාණ්ඩ වශයෙන් උසාවියේ සළකුණුකොට, ආරක්ෂිතව තබන බවත්, අවශ්‍ය නම් පමණක් උසාවියට සහ නීතිපති දෙපාර්තමේන්තුවට ඉදිරිපත් කරන බවත් ඇය කීවාය. ඒ හැර වෙනත් කිසිඳු හේතුවක් නිසාවෙන් තුන්වෙනි පාර්ශවයකට ඒවා ලබා නොදන බවයි ඇය කීවේ.

**"විශේෂයෙන්ම මේකත් කියන්න ඕන. අධිචෝදනා ගොනු කරලා මහාධිකරණයට නඩුවක් භාරදෙනකොට අවුරුද්දක් හෝ දෙකක දීර්ඝ කාලයක් ගතවෙනවා. ඒ තරම් කාලයක් යද්දි දරුවන්ට එයාලට සිදුවුණ අතවරයේ ස්වභාවය අමතක වෙලා යන්න පුළුවන්. ඒ වගේම විරුද්ධ පාර්ශවවලින් සාක්ෂිවලට යම් යම් බලපෑම් ඇතිවෙන්නත් පුළුවන්. ඒත් මේ වගේ තාක්ෂණික ක්‍රමවේදයක් තුළින් මේ කටයුත්ත කරද්දි ඒවගේ ප්‍රශ්න බාධකත් මග ඇරවගන්න පුළුවන්."**

යම්හෙයකින් දූෂිත තත්ත්වයකට පත් වුවහොත් පොලිසියට, උසාවියට යාම ප්‍රසිද්ධියේ දූෂණයට ලක්වනවාට සමාන යැයි කියනා අය අප අතර ඕනෑතරම්ය.

**"යම්කිසි හේතුවක් නිසා දරුවෙක් දූෂිත තත්ත්වයකට පත්වෙලා නම්, කිසිම පැකිළීමකින්, බියකින් තොරව නීතිය ඉදිරියට එන්න කියලයි මම කියන්නේ. මොකද ජාතික ළමාරක්ෂණ අධිකාරිය විදියට අපි බොහොමත් වගකීමකින් මේ කටයුතු ඉටු කරනවා කියන එකත් අවසාන වශයෙන් කියන්න ඕන."**

පසුව අප ජාතික ළමා රක්ෂණ අධිකාරියේ සභාපති උදය කුමාර අමරසිංහ මහතාවද සම්බන්ධ කරගත්තේ මේ පිළිබඳ වැඩිදුර තොරතුරු දැනගැනීමටය.

**"අපේ රටේ අපරාධ නීතියට අනුව ළමයින්ට එරෙහිව සිදුකරන අපරාධ අතරින් දරුණුම අපරාධ ලෙස සැළකෙන්නේ ළමයින් කෲරත්වයට භාජනය කිරීම සහ ලිංගික අපයෝජනයට ගොදුරු කරගැනීම. එවැනි ළමා අපයෝජන සිද්ධියකදී මුලින්ම පොලිසිය ප්‍රකාශයක් සටහන් කරගෙන තමයි දරුවෙක්ව අධිකරණ වෛද්‍ය නිලධාරියාට යොමු කරන්නෙ. ඊටපස්සෙ තමයි මහේස්ත්‍රාත් අධිකරණයේ නඩුවක් ආරම්භ කරන්නෙ. එහෙම නඩු විභාගයක ප්‍රධාන සාක්ෂිකරුවා බවට පත්වෙන්නෙ දූෂිතභාවයට පත්වෙච්ච දරුවා. එතකොට ඒ දරුවාට විත්තියේ හරස් ප්‍රශ්නවලට පෙනී සිටින්න වරින්වර උසාවියට යන්න වෙනවා. එහෙම අවස්ථාවලදී ඒ දරුවව මාධ්‍යට නිරාවරණය වෙන්න තියෙන ඉඩකඩ වැඩියි. අනික දරුවගේ අනාගතයට වුණත් බලපෑමක් වෙන්න පුළුවන්. අපේ මේ වීඩියෝ සාක්ෂි පටිගත කිරීමේ ක්‍රියාවලියේ මූලිකම අරමුණ වෙන්නේ දරුවන්ව ඒ අපහසුතාවන්ගෙන් මුදවාගැනීම.**

**ඊළඟ කාරණාව මේ සාක්ෂි පටිගත කිරීමේ නිල නීතිමය බලය පැවරිලා තියෙන්නෙ ජාතික ළමා රක්ෂණ අධිකාරියට නිසා පොලිසි උසාවිවලින් ඒ සාක්ෂි ලබාගන්න ඉල්ලීම් කරනවා. නමුත් එන්න එන්නම ළමා අපචාර වැඩිවෙද්දි ඉල්ලන පමාවට අපිට ඒවා ලබාදෙන්න බැරිවෙලා තියෙනවා. ඒ නිසයි රටේ පළාත් නවයෙම පටිගත කිරීමේ මැදිරි ස්ථාපිත කරන්න කැබිනට් අනුමැතිය හිමිවුණේ. මේ වෙද්දි අපි ඒ වෙනුවෙන් පලපුරුදු කාර්යමණ්ඩලයක් බඳවාගන්න පටන් අරන් තියෙන්නෙ. මොකද මේ සාක්ෂි පටිගත කිරීම් බොහොම වගකීමෙන් කරන්න ඕන දෙයක්. පොඩි හරි වැරදීමක් වුණොත් සැකයේ වාසිය අරන් විත්තියේ පාර්ශවය ක්‍රියාත්මක වුණොත් දරුවට අසාධාරණයක් වෙන්න පුළුවන්. අන්න ඒ අවධානම නොගන්න තමයි ජාතික ළමා රක්ෂණ අධිකාරියේ අපි මුලින්ම දරුවන්ව මනෝ උපදේශනවලට යොමු කරලා මනස සැහැල්ලු කරලා සාක්ෂි පටිගත කරන්නේ. මේ ක්‍රියාවලිය සාර්ථකව වුණොත් අසරණ වුණු අහිංසක දරුවන්ට අධිකරණයේදී සිදුවෙන අපහසුතාවයන් මගහරවාගන්න ජාතික ළමා රක්ෂණ අධිකාරියට පුළුවන් වෙයි කියලා අපි විශ්වාස කරනවා."**

ලිහිණි මධුෂිකා

# නෝනලා ලොකු පුටුවලට යද්දී මහත්තුරුන්ට යකා නගින්නෙ ඇයි?



**නොදන්නවා වුණත් ඊර්ෂ්‍යාවෙන් පෙළෙන කෙනාටත් ඒක මානසික වදයක්**

ඊර්ෂ්‍යාව කියන්නේ ස්වභාවික මනුස්ස හැඟීමක් කියන එක ඇත්ත. හැබැයි ඊර්ෂ්‍යාව කියන හැඟීම කෙනෙක්ගේ හිතේ ඕනවට වඩා පැලදියම් වුණාම ඒක එයාට වගේම එයා අවට අයටත් බොහොම දරුණුවට බලපානවා. මම අද කියන්න යන්නේ තමන්ගේම සැමියාට ඊර්ෂ්‍යා කළ එහෙම බිරිඳකගේ කතාවක්.

මේ කියන යුවළ තරමක් මැදිවියට ළංවෙලා විවාහපත් වුණු දෙපළක්. දෙමාපිය වැඩිහිටියන් ගෙනාපු මඟුල් යෝජනාවකින් තමයි ඔවුන් මුණගැහිලා තිබුණේ. මේ දෙන්නම මූල්‍ය ක්ෂේත්‍රයේ රැකියාවල නිරත වුණු උදවිය. ඒ වගේම දෙන්නම එක වගේ දැනඋගත්කම්, වත්පොහොසත්කම් තිබුණු අය.

විවාහ වෙලා මාසයක් දෙකක් යනකොට තමන්ගේ බිරිඳ නොසෑහෙන්න වෙනස් වුණා කියලා මේ සැමියා මාත් එක්ක කිව්වා.

ඔහු ලස්සනට මැදලා කරලා ඇඳුමක් ඇඳගෙන යන එක මුලින්ම ඇයට රුස්සන්නේ නැති වුණාලු. අනික මේ කාන්තාව මිතුරන් සහ පවුලේ උදවිය සමඟ වැඩි ඇයිහොඳයිකම් පැවැත්වූ කාන්තාවක් නෙවෙයි. ඉතින් සැමියා යහළුවන් සහ පවුලේ උදවිය ආශ්‍රය කරනවට ඇය තුළ ලොකු ඊර්ෂ්‍යාවක්, අකමැත්තක් ඇතිවෙලා තියෙනවා. බිරිඳගේ කීම අහලා මේ සැමියා එවන් දෙයින් පවා ඈත්වෙලා තියෙනවා.ඉතින් ඔහොම කාලයක් යනකොට දෙන්නටම ඉදිරිපත් වෙන්න පුළුවන් මූල්‍ය ක්ෂේත්‍රයේ විභාග කිහිපයක් තිබිලා තියෙනවා.

**“අපි දෙන්නටම ඕවා එකපාර කරන්න බැහැනේ... මුලින්ම මම කරලා ඉන්නම්.”** කියලා ඇය ඔහුගේ මග අහුරලා තියෙනවා.

ඔය විදියට එක් වතාවක් නෙවෙයි, කිහිපවතාවක්ම ඇය ඔහුට උසස්වීම්වලට යන්න තිබුණු අවස්ථා නැති කරලා දලා. ඒ විතරක් නෙමෙයි ඇය ඔහුට වඩා තනතුරු කිහිපයක් උසස් වෙලා ඒ ගැන නිතර උදම් අනන්නත් පටන් ගත්තලු.කාලයත් එක්ක ඇගේ මේ ඊර්ෂ්‍යාසහගත හැසිරීම් එන්න එන්නම වැඩිවෙලා තියෙනවා. කොටින්ම කිව්වොත් සැමියා හිනාවෙලා සතුටින් ඉන්න එක පවා ඇයගේ හිතට තරහක්, ඊර්ෂ්‍යාවක් මතුකරන දෙයක් බවට පත්වුණාලු.

ඇගේ මේ ඊර්ෂ්‍යාව සාමාන්‍ය එකක් නොවුණු බව දැනුණ නිසා තමයි මේ සැමියා ඇයව මගේ ළඟට එක්කරගෙන ආවේ.

තමන්ගේ සැමියගේ දියුණුව ඔහුගේ විතරක් නෙමෙයි මුළු පවුලේම දියුණුවට බලපානවා. ඉතින් ඔහුට ලැබෙන අගය, සාර්ථකත්වය ගැන හිතලා ඔහු පිටුපසින් හෙවණැල්ලක් වගේ ඉඳගෙන අත්පුඩි ගහන එක බිරිඳකගේ වගකීමක්. සාර්ථක මිනිසෙක් පිටිපස්සේ ගැහැනියක් ඉන්නවා කියලා කතාවටත් කියන්නේ ඒකනේ.

සාර්ථකත්වයට යන මිනිස්සුන්ට රැකියා ස්ථානයේ වගේම බාහිර සමාජයෙත් ඊර්ෂ්‍යාකාරකම් කරන උදවිය වැඩියි. ඒක ඉතින් බොහොම සාමාන්‍ය දෙයක්. හැබැයි තමන්ගේ ගෙදර ඉන්න බිරිඳ නැත්නම් සැමියාම සහකරුවගේ කකුලෙන් ඇදලා පොළාවේ ගහන ජාතියේ කෙනෙක්නම් ඉතින් ඒක ඉතාම සංකීර්ණ ගැටලුවක්.

> **කවුරුහරි කෙනෙක් සැමියාගේ බිරිඳගේ හොඳක් කිව්වොත් සමහරුන්ට ඒකත් ඇති එතැන පදයක් හදන්න**

තමන්ගේ සැමියාගේ දියුණුව දකින්න අකමැති ගෑනුන්ට වඩා තමන්ගේ බිරිඳගේ දියුණුව දකින්න අකමැති සැමියෝ සාපේක්ෂව වැඩියි කියන කාරණාවත් නොකියාම බැහැ.

කසාදෙට කලින් ඩෙනිම් කලිසමක් ඇඳගෙන ගිය කෙල්ල කසාදෙන් පස්සේ දිග බාච්චු සායකට බස්සන පිරිමි වැඩිවෙලා තියෙන්නෙ ඒ නිසයි. බිරිඳ ඉහළ තනතුරුවලට ගියහම තමන්ට කන්ට්‍රෝල් නැහැ කියලා හිතන ඇත් තොත් ඉන්නවා. කසාද බැඳපු හැටියේ ජොබ් එකෙන් අයින් වෙන්න කියලා නීති හැටහුටාමාරක් පණවන්නේ අන්න එහෙම මහත්තුරු.

කවුරුහරි කෙනෙක් සැමියාගේ බිරිඳගේ හොඳක් කිව්වොත් සමහරුන්ට ඒකත් ඇති එතැන පදයක් හදන්න. සැමියා නැත්නම් බිරිඳ තවත් පිරිමි කෙනෙක් එක්ක ගැහැනු කෙනෙක් එක්ක කතා කරද්දි හිතේ පුංචි නෝක්කාඩුවක් ඇතිවෙන්න පුළුවන් තමයි. ඒක හරි. හැබැයි ඒ දේවල් වුණාත් ඕනෑවට වඩා දුරදිග ගෙනියන්න ඕනෑ දේවල් නෙවෙයි කියලයි මම නම් කියන්නේ.

**‘න වාක්කරණමත්තෙන-**
**වණ්ණපොක්ඛරතාය වා**
**සාධුරූපො නරො හොති-**
**ඉස්සුකී මච්ඡරී සඨො’**

මේක ධම්ම පදයේ එන ගාථාවක්. අනුන්ට ඊර්ෂ්‍යා කරන පුද්ගලයා මිහිරි වචන කතා කළ පමණින්වත් ශරීර ශෝභාවය ඇති පමණින්වත් හොඳ මිනිසෙකු වෙන්නේ නැහැ කියන එක තමයි ඒකේ තේරුම.

ඊර්ෂ්‍යාව කියන්නේ තව කෙනෙක්ගේ දියුණුව, සතුට, දක්ෂකම දකිනකොට ඒක ඉවසලා ඉන්න බැරිතරමට හිතට දැනෙන අසතුටට, තරහට. ඊර්ෂ්‍යාව කියන එකත් එක්ක තමන්ගේ බිරිඳ සැමියා වෙනත් සම්බන්ධයක් ඇති කරගනී කියලා බයකුත් ඉබේටම වගේ ඇතිවෙනවා. එතැනදී තමයි ඔය සීමා කිරිල්ල ඇති වෙන්නේ.

මේ ලෝකේ තියෙන හැම සතුටක්ම, වරප්‍රසාදයක්ම, ජයග්‍රහණයක්ම මේ හැම සබ්බසකලමනාවක්ම මට විතරයි අනිත් අයට එපා කියලා හිතන අයත් ඉන්නවනේ. අන්න එතකොටත් අනිත් අය ගැන ඊර්ෂ්‍යා හිතෙනවා. ඒ අයට ඇතිවෙන්නේ අනිත් හැමකෙනාම තමන්ට වඩා පහලින් සිටිය යුතුයි කියන සිතුවිල්ල.

ඊර්ෂ්‍යාව ඇති තැන ආදරයක් නැහැ. එතැන තියෙන්නෙම හිමිකාරීත්වයක් වගේ හැඟීමක්. ඊටපස්සේ වෙන්නේ ඒ කෙනා සැමියාව, බිරිඳව පාලනය කරන්න පටන්ගන්න එක. ඉතින් අරක කරන්න එපා, මේක කරන්න එපා කියන සබඳතා ඇති වෙන්න මූලිකම හේතුව තමයි ඊර්ෂ්‍යාව. පාලනය විතරක් නෙමෙයි කායික හිරිහැර දක්වා වුණාත් මේ ගැටලු දුරදිග යන්න පුළුවන්. අනිත් කාරණාව තමයි ඊර්ෂ්‍යාව තිබෙන සබඳතාවල අගය කිරීම් නැහැ. අනෙකාගේ හොඳ දෙයක් දැක්කම ඒක වචනවලට පෙරළලා ප්‍රකාශ කරන්න මේ අය බොහොම අකමැතියි. මම කිව්ව මේ හැම කාරණාවකම අවසානය වෙන්නේ සංකීර්ණ පවුල් ආරවුල් ඇතිවෙන එකයි.

**“අපෝ ඔයා මට ඊර්ෂ්‍යාකම් කරන්න එපා!”** කියලා කටින් කියලා මේ හැඟීම් යටපත් කරන්න බැහැ. ඒ නිසා සැමියා බිරිඳ උවමනාවට වඩා ඊර්සියයි කියලා හිතෙනවා නම් තමන්ටම නෙවේ වෙන අයට වුණාත් හොඳම දේ තමයි ඔවුන්ව උපදේශනයට යොමු කරන එක. මොකද නොදන්නවා වුණාත් ඊර්ෂ්‍යාවෙන් පෙළෙන කෙනාටත් ඒක මානසික වදයක්.


ඉතින් කොහොමහරි මම අර කිව්ව බිරිඳගේ හැසිරීම් රටාව වෙනස් කරන්න මට පුළුවන් වුණා. ඒ දෙපළ දැන් මූල්‍ය ක්ෂේත්‍රයේ හොඳ ගමනක් ගිය සාර්ථක දෙපළක් කියලත් මෑතකදි මට ආරංචි වුණා.

සම්පූර්ණ කතාව අහන්න මෙම QR කෝඩ් එක ස්කෑන් කරන්න



මානව හැකියා ප්‍රවර්ධන විශේෂඥ හා ජ්‍යෙෂ්ඨ මනෝවිද්‍යා උපදේශිකා
**රත්නා පුෂ්ප කුමාරි**

**සෙව්වන්දි හෙට්ටිආරච්චි**



# මගේ හඬින් නිළියන් දඩයම් කරන පල්හොරාව අල්ලන්න

## - මහාචාර්ය සුනිල් ආරියරත්න

මහාචාර්ය සුනිල් ආරියරත්න මහතා ලෙස පෙනී සිටිමින් ප්‍රකට නිළියන්ගේ සහ නිරූපිකාවන්ගේ ලිංගික දර්ශන, හඬපට ලබාගන්නා පුද්ගලයෙකු සම්බන්ධව ගාලු වරාය පොලිසියට පැමිණිල්ලක් ලැබී තිබුණේ මීට මාස කිහිපයකට ඉහතදීය. ලද තොරතුරු මත පරීක්ෂණ ආරම්භ කළ පොලිසියට පසුගිය ජූලි මාසයේදී සැකකරුවෙකු අත්අඩංගුවට ගැනීමට හැකි වී තිබුණි.

මෙම සැකකරු වත්තෝරු තන්ත්‍රිගේ රවීන්ද්‍ර නමැති 47 හැවිරිදි සහාය අධ්‍යක්ෂවරයෙකි.

මහාචාර්ය සුනිල් ආරියරත්න ලෙස පෙනී සිටිමින් පුද්ගලයන් නොමග යවන මේ සිද්ධිය පිළිබඳ කසුකුසුව වසර දෙකක් පමණ කාලයක් තිස්සේ සමාජ මාධ්‍යවල උඩ යට යමින් තිබූ අතර, මෑතකදී එය යළි කරළියට පැමිණියේය. ඒ ප්‍රවීණ ටෙලිනාට්‍ය සහ චිත්‍රපට නිළියක වන නිර්ධා උයන්හේවා ගාලු වරාය පොලිසියට කළ එම පැමිණිල්ලෙන් පසුවය.

එම සිදුවීම ගැන අපි කළ කතාබහකදී ඇය කීවේ මෙහෙමය.

**"රවීන්ද්‍ර කියන්නේ මම කලින් වැඩ කරපු 'නෑනලා' ටෙලිනාට්‍යයේ සහාය අධ්‍යක්ෂවරයා. ඔහු මේ මෑතකදී මට කතා කරලා කිව්වා 'නිර්ධා අක්කෙ සුනිල් ආරියරත්න මහත්තයට ඔයත් එක්ක ෆිල්ම් එකක් ගැන කතා කරගන්න ඕන කියනවා' කියලා. මම කලින් සුනිල් ආරියරත්න මහත්මයත් එක්ක වැඩ කරලා නොතිබුණාට එතුමාට මම පුද්ගලිකව ගොඩක් ගරු කළා. ඒ නිසාම මම රවීන්ද්‍ර කරපු ඉල්ලීම අහක දැම්මෙ නෑ."**

එතැන් පටන් ඇයට එම ඇමතුම ලැබෙනතුරු ඉවසිල්ලක් තිබුණේ නැත. ඒ අන් කිසිවක් නිසා නොව සුනිල් ආරියරත්නයන් වැනි ස්වර්ණමය කලාකරුවෙකුගේ නිර්මාණයකට දායක වීමට ලැබීමේ සතුට නිසාවෙනි.

සහාය අධ්‍යක්ෂවරයා කී ආකාරටම මාර්ගගත ක්‍රමවේදය (Online) ඔස්සේ ඇයට ඇමතුමක් ලැබිණි. එහෙත් එක්තැනකදී ඇයට ඔහු පිළිබඳව සැකයක් පහළ විය. ඊට හේතුව කතා කළ පුද්ගලයා ඔහුව නොපෙනෙන සේ කැමරාව අක්‍රිය කරගෙන සිටීමයි. එනිසාම ඇය සමඟ කතා කරන්නේ සුනිල් ආරියරත්න මහතා බව හොඳකාරවම දන්නේද යන්න ඇය රවීන්ද්‍ර නමැත්තාගෙන් කිහිපවරක් අසා ඇත.

පසුව ඇගේ සැකය නැති කිරීම සඳහාද මෙම උපාය දූතයා ඉතාම සූක්ෂමශීලීව කටයුතු කර ඇත. ඒ සුනිල් ආරියරත්නයන්ගේ චිත්‍රපට, ගේය පද නිර්මාණ සහ අනෙකුත් කලා නිර්මාණ ගැන ගැඹුරින් කතා කරමිනි. එසේ කළේ අල්පමාත්‍ර හෝ සැකයක් ඇත්නම් එයද මඟහරවාගෙන ලිස්සා යාමට සිතාගෙන විය යුතුය. එනිසාම ඇය කතා කරන්නේ ව්‍යාජ පුද්ගලයෙකු සමඟ බවට කිසිසේත්ම සැකයක් නොසිතුණ බව නිර්ධා අප සමඟ කීවාය.

**"නිර්ධා මම කතා කරන්නේ වට්ස්ඇප් කෝල්වලින් විතරයි. අනික මගේ පැත්තෙන් කැමරාව ඕෆ් කරගෙන ඉන්නේ ඒකට මම අකැමති නිසා. මම මේ චිත්‍රපටයට ඔයත් එක්ක තවත් නිළියො දෙන්නෙක් තෝරගෙන ඉන්නවා. හැබැයි ඔයාව මම තෝරගෙන ඉන්නෙ ප්‍රධාන චරිතෙට. මම අනිත් දෙන්නවත් සම්බන්ධ කරගෙන රෑ 11ට විතර ඔයාට කෝල් එකක් ගන්නම්."**

සුනිල් ආරියරත්න මහතා ලෙසින් පෙනී සිටි පුද්ගලයා පවසා තිබුණේ එසේය.

එසේම නිර්ධා උයන්හේවා කියන ආකාරයට ඔහු විසින් එම චිත්‍රපටය සඳහා ඇයට ලක්ෂ 35ක් වැනි විශාල මුදලක් ලබාදීමට පොරොන්දු වී ඇත.

කීවාක් මෙන්ම රාත්‍රී එකොළහ වනවිට ඇයට නැවතත් දුරකතන ඇමතුමක් ලැබිනි. සුනිල් ආරියරත්නයන්ගේ කාර්යබහුලත්වය ගැන හොඳ හැටි දන්නා බැවින් රෑ මැදියමේ කතා කිරීම ගැනද කිසිඳු සැකයක් නොතිබුණ බවයි ඇය අපට කීවේ.

**"මගෙන් මුලින්ම ඇහුවෙ කලා ක්ෂේත්‍රයට ආවේ කොහොමද කියලා. පස්සේ මම රඟපාලා තියෙන චිත්‍රපට ගැනයි, ටෙලිනාට්‍ය ගැනයි කතා කළා."**

කතාව අතුරතුරදී ඇයව මුරුංගා අත්තේ මුදුනටම ගෙන යන්නටද මොහු විසින් අමතකකොට නැත. ඒ දීර්ඝ කාලයක් තිස්සේ කරගෙන ආ මෙම ක්‍රියාව ඔහුට නුපුරුදු දෙයක් නොවුණු නිසාය. ඇයට හොඳ සිනමා අවබෝධයක් සහ අත්දැකීම් රාශියක් ඇති බව පවසා ඇති මොහු ඊළඟට අසන පැනයන්ට සෘජු පිළිතුරු ලබාදෙන ලෙසද කියා ඇත.

### සුනිල් සර්ගෙ කාර්යබහුලකමත් එක්ක මහ රෑ කතා කරන එක ගැන මට සැකයක් තිබුණේ නෑ




**"පස්සේ ඔහු මට කිව්වා මුඩුක්කු ජීවිතයක් ගතකරන කෙනෙක් විදියට රඟපාලා කතා කරලා පෙන්නන්න කියලා. එතැනදිත් මට ඔහු ගැන කිසිම සැකයක් හිතුණෙ නෑ. මොකද අපේ ක්ෂේත්‍රයේ ඕනෑම කෙනෙක් දන්නවා මම ගොඩක් සැර චරිත රඟපාලා තියෙන නිළියක් කියලා. අනිත් එක ඔහුගේ නිර්මාණයට අවශ්‍ය දේ මගෙන් ගන්න උත්සාහ කරනවා ඇති කියලයි මම හිතුවෙ."**

කතාවේ හොඳම හරිය දැන්ය. හීන්සීරුවේ තම සිතැඟියාවන්ට ළංවෙමින් සිටි මොහු ඇයට පවසා ඇත්තේ තමන්ට 'සර්' නොකියා සුනිල් කියා කතා කරන ලෙසය.

**"පස්සේ ඔහු මගෙන් ඇහුවා සමලිංගික ජීවිතේ දැකලා තියෙනවාද කියලා. ඒ වගේ අයව ආශ්‍රය කරලා තියෙනවද ඇහුවා. එතැනදී මම අපහසුතාවයට පත්වුණා. නමුත් මට පුළුවන් සීමාවෙ ඉඳගෙන මම උත්තර දුන්නා. ඒත් ඒ පුද්ගලයා මම දීපු උත්තරවලින් සෑහීමකට පත්වුණේ නෑ. ඔහු මට කිව්වා ඒ විදියට කතා කරලා රඟපාලා පෙන්නන්න කියලා. මුලින්ම පිරිමින්ගේ සමලිංගිකත්වයට කියන වචනයක් ඔහු මට කියලා පෙන්නුවා. පස්සේ මටත් ඒක කියන්න කිව්වම මම කිව්වා. ඊටස්සේ ගෑනු ළමයි සමලිංගිකව හැසිරෙන විදියට කතා කරලා පෙන්නන්න කිව්වා."**

ගොනා හැරෙන්නේ පොල් පැළයට බව තේරුම් ගිය වහාම ඇමතුම විසන්ධි කර දුරකතනය ක්‍රියා විරහිත කරදැමීමට කටයුතු කර ඇති ඇය, මෙම සිදුවීම නිසා බොහෝසෙයින් බියට පත්වූ බව කියන්නීය.

පසුදු උදෑසන ඇය නැවතත් එම පුද්ගලයාගේ දුරකතන අංක පරීක්ෂා කරද්දී අනන්‍යතාවය තහවුරු කිරීමට යොදාගෙන තිබූ සුනිල් ආරියරත්නයන්ගේ ඡායාරූප සියල්ල ඉවත් කරගෙන තිබූ බව දැනගන්නට ලැබී ඇත. පසුව මේ පිළිබඳව වහාම ගාල්ල වරාය පොලිසියට පැමිණිලි කළ ඇය සුනිල් ආරියරත්න මහතාවද අමතා ඒ ගැන දැනුවත් කර තිබුණි. පසුව ගාල්ල පොලිසියට පැමිණි මහාචාර්ය සුනිල් ආරියරත්න මහතා පවසා තිබුණේ සැකකරුවන්ට එරෙහිව තදින් නීතිය ක්‍රියාත්මක කරන ලෙසය.

**"ඇත්තටම ඔය කියන පල් හොරා දැන් සෑහෙන කාලෙක ඉඳලම මං විදියට රඟපාලා ගොඩක් නිළියන්ව, නිරූපිකාවන්ව රවට්ටලා තියෙනවා. ඒ මිනිහා හැමෝටම කියන්නේ එකම කතාවක්. ඒ තමයි චිත්‍රපටයක ප්‍රධාන චරිතෙකට තෝරගෙන තියෙනවා කියන එකයි, ලක්ෂ 35ක් වගේ ලොකු මුදලක් ගෙවනවා කියන එකයි. ඒ වගේම ඒ පොරොන්දුව පිට ඒ අයගෙන් අසභ්‍ය හඬපට වගේම අසභ්‍ය ඡායාරූපත් ගෙන්නගන්න කටයුතු කරලා තියෙනවා කියලා ආරංචියි."**

ඒ මහාචාර්ය සුනිල් ආරියරත්නයන් අපිට ඒ ගැන කී කතාවය. එතුමා වැඩිදුරටත් පවසා සිටියේ කවුරුන් කෙසේ කීවද සිහිබුද්ධියෙන් යුතුව කටයුතු කිරීමට අනෙක් පාර්ශවයන්ටද වගකීමක් ඇති බවය.

**"ටිකක් බුද්ධිය පාවිච්චි කරලා හිතුවොත් ඕනම කෙනෙකුට තේරෙනවා අපේ කලා ක්ෂේත්‍රය ඇතුළේ නවක නිළියෙකුටවත් නිරූපිකාවකටවත් ලක්ෂ 35ක ලොකු මුදලක් ගෙවන්නේ නෑ කියලා. පහුගිය කාලේ ගොඩක්දෙනෙක් මේ මිනිහව නීතියට කොටු කරගන්න හැදුවත් රහස් පොලිසියේ ඇහැට වැලි ගහලා මිනිහා හැංගුණා. ඒ වගේම තාමත් සැරින් සැරේට එළියට ඇවිත් තවත් අයව රවට්ටනවා. මේ ගැන නීතිමය ක්‍රියාමාර්ගයක් ගන්න පුළුවන් වුණෙත් නිර්ධා උයන්හේවා ගාල්ල වරාය පොලිසියට පැමිණිලි කරපු නිසා. දැනට අත්අඩංගුවට අරන් තියෙන රවින්ද්‍ර කියන සහාය අධ්‍යක්ෂවරයා කියන්නෙත් ඔහුටත් ඒ ගැන කිව්වෙ ඔහුගේ හිතවතෙක් කියලා."**

තවද මෙම ව්‍යාජ පුද්ගලයාව නීතියේ රැහැනට කොටු කරගන්නාතුරු ඔහුට නොරැවටී සිටීමට වගබලාගන්නා ලෙස සුනිල් ආරියරත්න මහතා කියා සිටියේය. එමෙන්ම ඕනෑම අයෙකුට අවශ්‍ය විටකදී මේ ගැන සැකහැර දැනගැනීමට තමන්ව අමතන ලෙසට කියා සිටි ඒ මහතා ඔහුගේ පෞද්ගලික දුරකතන අංකයද මෙම ලිපිය සමඟ පළකරන ලෙස ඉල්ලා සිටියේය.

**0777370225 - මහාචාර්ය සුනිල් ආරියරත්න මහතාගේ පෞද්ගලික දුරකතන අංකය.**

ලිහිණි මධුෂිකා



# තට්ටු දෙකේ ගෙයක් හදලා, මගෙම වාහනයක් ගන්න පුළුවන් වුණේ මේ රස්සාව නිසා



## නීලා ශාන්ති
### බඩල්ගම 'සිරියෝ' ඇඟලුම් ආයතනය

සති කිහිපයක් පුරාවට මේ ඉඩකඩ වෙන්වුණේ **'ඔමේගා ලයින්'** සමූහයට අනුබද්ධ ආයතනවල ඇඟලුම් වීරවරියන් වෙනුවෙනි. කොවිඩ් නිසා ඇතැමුන්ගේ ස්ථිර රැකියා පවා අහිමි වෙද්දී ඔමේගා ලයින් සමූහයේ සාමාජික සාමාජිකාවන්ගේ රැකියා සුරක්ෂිත වූ අයුරු ඔවුහු අපට කීහ. කොවිඩ් හමුවේ රටේ ආර්ථිකය නගා සිටුවීමට කැපවෙන අන්දම ගැනද ඔවුන් අප සමඟ කතා කළේ මහත් වූ සතුටකිනි. රටට විදේශ විනිමය සපයන පුරෝගාමීන් වීමට ලැබීම ගැන ඔවුන්ට තිබුණේ පුදුමාකාර ආඩම්බරයකි. **'ධරණී'** ගිය ඒ ඇඟලුම් චාරිකාවේ අවසන් ඇඟලුම් ආයතනය බඩල්ගම **'සිරියෝ'** ආයතනයයි. මේ එහි ඇඟලුම් වීරවරියක් වන සඳලංකාව, ඉරබඩගම පදිංචි නීලා ශාන්ති කියූ කතාවයි.

කුඩා කල සිටම මැහුම් ගෙතුම්වලට දැක්වූ සමර්ථකම නිසාම නීලා දෙවරක් නොසිතාම ආවේ **'ඔමේගා ලයින්'** ආයතනයටයි. ඒ 1999 වසරේය. ආයතනය තම නිවස ආසන්නයේම පිහිටා තිබීම ඇයට අමතර පහසුවක් විය. මෙලෙස වසර කීපයක් සේවය කරද්දී කණ්ඩායම් නායිකාවක් වූ ඇයට ඇගේ දක්ෂතාවය මත බඩල්ගම **'සිරියෝ'** ආයතනයට මාරුවීමක් ලැබුණි. හුරුපුරුදු පාරක වුවද එතැන් සිට නීලා ගියේ අලුත්ම ගමනකි.

**"මේ ආයතනයට ආවට පස්සෙ මට හොඳ පුහුණුවක් ලැබුණා. ඒ අතර විදේශ රටවල පවා පුහුණුවීම් තිබුණා. කොච්චර මුදල් තිබුණත් ඉතාලිය වගේ රටකට යන්න ලේසියෙන් කෙනෙක්ට බෑ. ඒත් මට ඉතාලියට ගිහින් ඇඟලුම් ක්ෂේත්‍රය ගැන පුහුණුව ලබන්න ආයතනයෙන් අවස්ථාවක් දුන්නා. ඉතින් ඇඳුමක සම්පූර්ණ නිෂ්පාදන ක්‍රියාවලිය ගැන අද මට පුළුල් අවබෝධයක් තියෙනවා."**

රැකියාවක වුවද සාර්ථකත්වය ඇත්තේ පියවරෙන් පියවර ඉදිරියට යාම තුළය. ඒ වෙනුවෙන් වෙහෙසිය යුත්තේ තමාමය. මුලින් සාමාන්‍ය මැහුම් සේවිකාවක ලෙස ඇඟලුම් ක්ෂේත්‍රයට එන ඇය අද තාක්ෂණික නිලධාරිනියක් බවට උසස්වීම් ලබා තිබෙන්නේ ඒ නිසාය.

**"මේ හැමදේම මට ලැබුණේ කැපවීමත් දක්ෂතාවයත් නිසා. කැපවීමයි, දක්ෂතාවයයි තියෙන ඕනම කෙනෙකුට මේ ක්ෂේත්‍රයේ ලොකු දුරක් යන්න පුළුවන්. මං හිතනවා මගේ රැකියාව දැන් සුරක්ෂිතයි කියලා."**

රාජ්‍ය හා පෞද්ගලික අංශයේ කොතරම් රැකියා තිබුණද ඒ රැකියාවල වැටුපට අමතරව ලැබෙන වරප්‍රසාද බොහෝවිට අඩුය. ඇය පවසන්නේ තම ආයතනයෙන් ලබාදෙන වරප්‍රසාද වෙනත් කිසිඳු රැකියාවක නියැලෙන්නෙකුට නොලැබෙනු ඇති බවයි.

**"වැටුපට අමතරව පොලී රහිතව ලැබෙන ණය මුදල අපේ පෞද්ගලික ජීවිතයට ගොඩක් වටිනවා. නොමිලේ ලැබෙන වෛද්‍ය පහසුකම්, ජීවිත රක්ෂණාවරණ, වාර්ෂික ප්‍රසාද දීමනා විතරක් නෙවෙයි ආහාර සහ ප්‍රවාහන පහසුකම් පවා නොමිලේ ලැබෙනවා. ඒ නිසා වැටුප ඉතුරු වෙනවා. මං මේ වෙනකොට මගේම කියලා ඉඩමක් අරගෙන අංග සම්පූර්ණ දෙමහල් ගෙයක් හදලා තියෙනවා. මටම කියලා වාහනයක් අරගෙන තියෙනවා. මගේ මහත්තයත්, දරුවෝ දෙන්නත් එක්ක මම ලස්සන පවුල් ජීවිතයක් ගත කරනවා. ඉතින් මං අද සතුටින් ජීවිතය විඳිනවා."**

මීට දශකයකට පමණ ඉහත නම් ඇඟලුම් ක්ෂේත්‍රය ගැන එතරම් සුබවාදී කතා ඇසුනේ නැත. නමුත් අද එහෙම නැත. ඒ නිසාම කොවිඩ් වසංගතය මැද වුවද ඔවුහු රටට විදේශ විනිමය ගෙන එන්නට උපරිම දායකත්වය ලබා දුන්හ. අදටත් එය එසේමය.

**"මීට අවුරුදු කීපයකට කලින් ඇඟලුම් ක්ෂේත්‍රය ගැන විවිධ කතා තිබුණා. ඒත් ඒක වැරදියි. මොකද මට නම් මේ ආයතනය මගේ පවුල වගේ. ගෙදර තියෙන සුහදශීලී පරිසරයම මෙතැනත් තියෙනවා. කොවිඩ් නිසා අපේ රටේ ආර්ථිකය බිංදුවට බැහැලා තියෙද්දී කිසිම බයක් නැතුව අපි හැමදාම වැඩට ආවා. රටට විදේශ විනිමය ගෙනෙන ප්‍රධානම ක්ෂේත්‍රයක සේවය කිරීමට ලැබීම ගැන ආඩම්බරයි."**

අවසානයේ ඈ තම ආයතනය ගැන මෙවන් සහතිකයක් දුන්නාය.

**"මං දැන් දීර්ඝ කාලෙක ඉඳන් ඇඟලුම් ක්ෂේත්‍රයේ ඉන්නේ. කවුරුත් මේ ක්ෂේත්‍රයේ රැකියා තෝරාගන්න බයවෙන්න එපා. ජීවිතය ජයගන්න හීනයක් තියෙනවා නම් 'සිරියෝ' තමයි ඒකට හොඳම තැන. ඒ ගැන මං සහතික වෙනවා."**



# අම්මා ගහන පදේට නටන්න බලාගෙන නම් ගෑනු ගන්න එපා මයෙ පුතේ

සාරංගයි, නිමාලියි මුණගැහුණේ යෝජනාවකින්. පවුල් දෙකේම අය එකඟතාවයකට ආවත් නිමාලිට ඕනෙ වුණේ තවත් ටික කාලයක් සාරංගව ඇසුරු කරලම තීරණයක් ගන්න. මොකද අහම්බෙන් වගේ සාරංගගේ නැන්ද කෙනෙක් කියපු කතාවක් නිමාලිගේ කනට වැටිලා තිබුණා.

**"ඇති යන්තම් අර කෙල්ලගෙන් අපේ දරුවා ගැලවුණා."**

ඒ කතාවෙ තේරුම දැන ගන්න ලොකු උවමනාවක් තිබුණ නිසා නිමාලි ඉවසිල්ලේ බලන් ඉන්න තීරණය කළා.

සාරංගගේ කඩවසම්කමට යටින් හැමවෙලාවෙම වගේ මොකද්දෝ දුකක් හැංගිලා තියෙනවා කියලා නිමාලිට හිතිලා තිබුණා.

**"අපි දවසක විනූ පාර්ක් එකට ගිහින් කතා කරමුද?"**

නිමාලි සාරංගගෙන් ඇහුවේ දුරකතන ඇමතුමක් ලබාදීලා.

එවේලේ කැමති වුණත් පසුව සාරංග ඇමතුමක් ලබාදුන්නේ තීරණය වෙනස් කළ බව පවසමින්.

**"නිමාලි අපි විනූ පාර්ක් එකට නොයා දළද මාලිගාවට යමුද?"**

> **අම්මා නෙවේනේ සාරංග මම වෙනුවෙන් පෙනී හිටින්න ඕනේ ඔයා**

සාරංග ඇහුවා.

**"ඇයි ඒ?"**

**"අම්මා කිව්වා දළද මාලිගාවට යන්න කියලා. පාර්ක් ගානේ යනවට වඩා ඒක හොඳයිලු."**

සාරංග කියද්දී නිමාලිගේ මුහුණේ ඇඳුනේ හිනාවක්. සාරංගගේ ප්‍රශ්නය මොකද්ද කියලා යන්තමට වගේ නිමාලිට තේරුණා.

දළද මාලිගාවට ගිහින් දවල්ට කන්න අවන්හලකට ගොඩ වැදෙනකම් නිමාලි ඉවසීමෙන් බලාගෙන හිටියා.

**"ඔයාට කලින් අෆෙයාර් එකක් තිබ්බද?"**

නිමාලි එහෙම අහද්දි සාරංගගේ මුහුණ තවත් දුක්බර අතට හැරුණා.

**"ඔව්, ඒ ගැන දැන් කතා කරලා තේරුමක් නැහැ."**

සාරංග කිව්වේ සුසුමකුත් හෙලන ගමන්.

**"අම්මද අකමැති වුණේ?"**

නිමාලිත් පරාජය භාරගන්න ලෑස්ති වුණේ නැහැ. භාරවුස්සලා ඒ ගැන ඇහුවේ ඒ නිසයි. සාරංගගේ දෙනෙත් නිමාලි දිහාට යා වුණා.

> **ඔයා කියන්නේ ඇත්ත නිමාලි. මම ඔයාට කැමැත්ත දුන්නේ අම්මගේ බල කිරීමට**

**"ඔව් නිමාලි. එයා අමන්ද. එයාගේ තාත්තා දැන් පොල් මුදලාලි කෙනෙක්. ඒත් මුල් කාලෙදි අමන්දගේ තාත්තා පොල් කඩපු කෙනෙක්. අපේ පොල් වතුවල පොල් කඩන්නත් ඒ අන්කල් ඇවිත් තියෙනවලු. මම ඕවා නොදැන අමන්ද එක්ක යාළු වුණේ කම්පියුටර් ක්ලාස් එකේදි."**

**"ඉතින්?"**

**"අමන්ද ගැන ගෙදරට කිව්වම අපි අමන්දලාගේ ගෙදරට ගියානේ. එතකොට තමා අපේ අම්මයි තාත්තයි අමන්දගේ තාත්තව අඳුනගත්තේ. අපේ තාත්තා නම් කිව්වේ මිනිහෙක් හිටිය තැන නෙවෙයි, දැන් ඉන්න තැන තමයි වැදගත් කියලා. ඒත් අම්මා පොඩ්ඩක්වත් කැමති වුණේ නැහැ."**

සාරංග කිව්වේ දුක්බර හඬකින්.

**"ඔයාලා අවුරුදු කීයක් යාළුවෙලා හිටියාද?"**

නිමාලි ආයෙමත් ඇහුවා.

**"අවුරුදු 5යි මාස 4යි. අමන්ද හරිම හොඳයි. අම්මා නිසයි මෙහෙම වුණේ."**

**"සාරංග මෙතන තියෙන්නේ අමන්දගේ තාත්තා සම්බන්ධ ප්‍රශ්නයක් නෙවෙයි. ඔයාගේ අම්මගෙයි, ඔයාගෙයි ප්‍රශ්නයක්. මට නම් ඔයාලගේ පවුලට සම්බන්ධ වෙන්න ඇත්තටම බයයි. ඔයාගෙ අම්මා නිසා අපේ පවුල් ජීවිතෙත් අවුල් වෙයි."**

නිමාලි කියද්දි සාරංග කලබල වුණා.

**"එහෙම කියන්න එපා. අපේ අම්මා ඔයාට කැමතියි."**

සාරංග කියද්දි නිමාලි මුවේ ඇඳගත්තේ හිනාවක්.

**"අම්මා නෙවේනේ සාරංග මම වෙනුවෙන් පෙනී හිටින්න ඕනේ ඔයා. ඔයාට බැරි වුණා නම් අවුරුදු 5ක් ආදරේ කළ කෙල්ල වෙනුවෙන් පෙනී ඉන්න, යෝජනාවකින් අඳුනගත්තු මම වෙනුවෙන් පෙනී හිටීවිද? තමන්ට ඕනෙ විදිහටම දරුවෝ හැමදේම කරන්න ඕනෙ කියලා දෙමාපියෝ හිතන එක එච්චර හොඳ නැහැ. වැඩිහිටියෙක් වුණු ඔයාගේ තීරණ පාලනය කරන එක ඔයාලගේ අම්මගේ පුරුද්දක්. අම්මා කිව්ව ගමන් තමන්ගේ තීරණ අකුල ගන්න එක ඔයාගේ පුරුද්දක්. අදත් අපි කතා වුණේ පාර්ක් එකට යන්න. අම්මා කියපු ගමන් ඔයාගේ තීරණය වෙනස් වුණා. ඒක පොඩි සිද්ධියක් තමයි සාරංග. ඒත් ඒක මට අනගාතේ ගැන පෙන්වන සංඥවක්."**

නිමාලි කිව්වම සාරංග කල්පනාවට වැටුණා.

**"ඔයා කියන්නේ ඇත්ත නිමාලි. මම ඔයාට කැමැත්ත දුන්නේ අම්මගේ බල කිරීමට. ඇත්තටම මගේ හිතේ ඉන්නේ අමන්ද. අමන්දයි, මායි එක වගේම විඳවනවා. ඔයා හිතන්නේ මම අම්මට විරුද්ධ වුණාට පව් නැද්ද?"**

ආයෙමත් සාරංග ඇහුවා.

**"කැමති දෙයක් කරන්න කලින් බලන්න ඒක ආගමට ධර්මයට අනුව පවක්ද කියලා. ඊටපස්සෙ බලන්න ඒක නීතිවිරෝධීද කියලා. ඒක පවක් නෙවෙයි නම්, නීතිවිරෝධී දේකුත් නෙවෙයි නම් කවුරු එපා කිව්වත් බය වෙන්නේ මොකටද? පොල් කඩන රස්සාව නීතිවිරෝධී රස්සාවක්වත්, පවක්වත් නෙවෙයි. අනිත් එක ඒ මනුස්සයා ටික ටික දියුණු වෙලා. ඒ වගේම ඔයා බඳින්නේ ඒ මනුස්සයව නෙවේ. ඒ මනුස්සයගේ දුවව. තාත්තා අවුරුදු ගාණකට කලින් කරපු රස්සාව ගැන කියලා කිසිම වරදක් නොකරපු අහිංසක කෙල්ලෙක්ව අත් අරින එක නේද ඇත්තටම වැරදි?"**

නිමාලි අහද්දි සාරංගගේ මුහුණේ හිනාවක් මැවුණා.

**"ඔයා හරියටම හරි නිමාලි. මට හැමෝම කිව්වේ අම්මගේ හිත රිද්දන්න එපා කියලා. ඒත් ඒ කවුරුවත් දැක්කේ නැහැ ඇත්තටම රිදෙන්නේ මගේ හිත කියලා. ඇත්ත. අමන්ද කියන්නේ කිසිම වරදක් නැති අහිංසක ගෑනු ළමයෙක්. මම එයාව බඳිනවා."**

අවන්හලෙන් පිටතට එද්දි සාරංග කිව්වේ හරිම සතුටින්.

ගෙදරට ආපු නිමාලිත් හිටියේ හිතේ සතුටින්. දවස් තුනක් යද්දිම නිමාලිට ලැබුණේ සාරංග හදිසියේම හිතුවක්කාර විදිහට විවාහ වුණා කියන ආරංචිය. ඇත්ත විස්තරේ නොදැන නිමාලිගේ අම්මයි, තාත්තයි සාරංගට බණිනවා ඇහුණත් නිමාලි නම් කැඩෙන්න ගිය කුරුළු කූඩුවක් එකතු කරන්න ලැබුණු එක ගැන ගොඩක් සතුටු වුණා.



**සමාධි ඩයස්**

අවුරුදු 14 දරුවන් නැතිව
දුකින් ගෙවූ කාලය අවසන් කර
අපට දරු පැටවකු ලබා දුන්
වෛද්‍ය කුසුම්සිරි ද සිල්වා
මැතිතුමාටත්, පොදුවේ
ෆර්ටි ඒඩ් ආයතනයට සහ
එහි කාර්ය මණ්ඩලයටත්
අනේක වාරයක් පින්
දෙන්නෙමු.

**කුමාර වර්ණසූරිය, තලතා යශෝධරා,**
ප්‍රදීපාගාර මාවත, දෙවිනුවර.

# ලංකාවේ දරුපල පමාව සඳහා වඩාත් සාර්ථකව ප්‍රතිකාර කරන

# ෆර්ටි ඒඩ් ආයතනය

## අවුරුදු 25 සපුරා

SILVER JUBILEE

## 26 වන වසරට පා තැබූ වගයි...

අපගේ ජීවිතයේ කිසි
දිනක අපේම දරුවකු
ලබන්නට වාසනාව නැති
වේ යැයි සිතූ අපට එක්
දරුවකු නොව දරුවන්
තිදෙනෙකු ලබාදුන් ෆර්ටි
ඒඩ් ආයතනය මතු මතුවටත්
අපගේ ජීවිත පවතින
තාක්කල් අමතක නොවනු ඇත.
අපවගේම දුකට පත්වූ
අයට දරුවන් ලබා දී,
ඔවුන් සුබිත මුදිත කරන්නට
වාසනාව ලැබේවා.

**කිංස්ලි මනතුංග, සමන්මලී රත්නායක**
කඩපහනහා, අනුරාධපුර

නළදරු උපත් ක්‍රමයෙන් මිස
දරුවන් ලබාගත නොහැකි
යැයි හංවඩු ගසා ප්‍රතිකාර
කිරීම පවා ප්‍රතික්ෂේප කර
සිටි අපට නිසි ප්‍රතිකාර
වලින් ම දරුවකු ලබාදුන්
ඔබ තුමාටත්, ඔබතුමාගේ
රන් දොවොල ෆර්ටි ඒඩ්
ආයතනයටත් තවත් වසර
ගණනාවක් අප වැනි දුකට
පත්වූවන්ට පිහිට වන්නට
ශක්තිය ධෛර්ය ලැබේවායි
මේ අවුරුද්දක් ගතවී අලුත්
අවුරුද්දකට පා තබන
මොහොතේ හදවතින්ම
පතන්නෙමු.

**තුෂාර හල්පිටගෙදර, ස්වර්ණා වික්‍රමසිංහ**
පොල්පිතිගම, කුරුණෑගල

ලක්ෂ ගණනින් මුදල්
වියදම් කර ගෙන, අවුරුදු
12 ක් පුරා දරු පල නැතිව
අසරණ ව සිටිට ජීවිතාවබෝධය
ලබා දී මාස තුනක් වැනි
කෙටි කලකදී මව්පිය පදවිය
ප්‍රදානය කළ දෙවියෙකුට සමාන
වෛද්‍යතුමන්ටත් ෆර්ටි ඒඩ්
ආයතනයටත්, එහි කාර්ය
මණ්ඩලයටත් තිසරණ සරණින්
දෙව් රැකවරණින් තවත්
බොහෝ කලක් වෛද්‍ය
සේවාවන් ලබාදෙන්නට
වාසනාව අත් වේවා.

**විශ්ව ගුණවීර, අලෝකා සමන්මලී,**
වාද්දුව, පානදුර.

ගතවූ වසර 25 ක කාලය
තුළ ලංකාවේ සිව් දෙසින්
පැමිණ සාර්ථක ප්‍රතිඵල
ලැබූ ඔබ වසරක්
වසරක් පාසා ආදරණීය
මතක අලුත් කර
අප වෙත එවන සුබ පැතුම්
ඉදිරියටත් ඔබ වැනි දුකට
පත්වූ දරුපල නැති
විවාහකයින්ගේ
සිහින සචල කරන්නට
ධෛර්යක් ගෙන දෙනු ඇත

උගත් කමත්, දක්ෂතාවයත්
පරයා මතු වන මානව
හිත වාදය උපරිමයෙන් දරා
අපගේ දුකට පිහිට වන්නට
මෙලොවට ජනිත වූ ඔබතුමා
තවත් වසර ගණනාවක්
යෙහෙන් වැජඹේවා.
දුකට පත් දස දහසක් දෙනාට
පිහිට වන්නට වාසනාව
උදාවේවා.

**ජයරුවන් ඒකනායක, උපේක්ෂා ඒකනායක**
ගොනාගොල්ල, අම්පාර

හරි හැටි සොයා බලා
වැරැද්ද හඳුනා ගෙන
නිවැරදි ප්‍රතිකාර ලබා දෙන
ඔබත්, ඔබ ආයතනයත්
ගොම රිටි අතර දිලෙනා
අගනා මැණිකකි.
අද අපි දරු සුරතල් විඳින්නේ
ඔබට පින් සිදු වන්නටයි.

**වත්සලා අරුන්දතී, ගාමිණී ලොකුහෙට්ටිගේ**
දිගන, මහනුවර

**මහනුවර**
පේරාදෙණිය පාරේ
කිංස්වුඩ් විද්‍යාලය ඉදිරිපිට
අඟහරුවාදා
බ්‍රහස්පතින්දා
ඉරිදා

**කඩවත**
කඩවත නුවර පාරේ 198
ESESS Health Care
ගොඩනැගිල්ලේ
බදාදා
සෙනසුරාදා

ප්‍රතිකාර පිළිබඳ වැඩිදුර විමසීම් :
**077 3015122 081 2224672**



වසරක් ගෙවී වසරක් ලබන මේ මොහොතේ
අප හා එක්වූ සහෝදර ඔබත්,
ලක්වාසී සියළුම දෙනාටත්,
පසුගිය වසරේ වන් රෝ දුක් බිය වලින් තොර,
**වාසනාවන්ත නව වසරක් වේවා.**

**ප්‍රසව හා නාරිවේදී විශේෂඥ කුසුම්සිරි ද. සිල්වා**

# බුරන බල්ලන්ට මැරෙන්නම ගහන ගම්භාර දෙයියෝ

**කටින් සෙම හලා මියයන බලුරාළලා දෙස බලා අපි දෙවියන් වුවත් ඔහුට ශාප කළෙමු**



සිංහල ජන සමාජයේ ගම්භාර දෙවියන් ගැන නම් නොඇසූ කෙනෙකුන් නැති තරම්ය. එසේම මෙකී **'ගම්භාර'** දෙවියන්ගේ නම සමඟ කියැවෙන **'සූනියම්'** යන නමද ඔබ අසා ඇතුවාට සැක නැත. එනිසාම සමහරු සූනියම් සහ ගම්භාර යනු එකම දේවත්වයක් ලෙසින්ද සළකති. මීට අමතරව එක් එක් ගම්මානවලට මෙන්ම විවිධ පවුල් පරම්පරාවලටද අධිගෘහිත දෙවි දේවතාවන් සිටින බවටද විශ්වාසයක් තිබේ. ඒ සම්බන්ධයෙන් ශාස්ත්‍රීය විමර්ශන කළ පිරිස් පවසන අන්දමට **'ගමේ මුත්තා'**, **'පරවේණි දේවතා'** ආදී වශයෙන් හැඳින්වෙන ඒ දෙවිවරුන්ද පොදුවේ **'ගම්භාර'** නාමයෙන් හඳුන්වනු ලැබේ.

මා ඉපිද, හැදී වැඩී අද දක්වා ජීවත්වන ගම්පහ දිස්ත්‍රික්කයට අයත් ගණේමුල්ලේ තිබ්බටුගොඩ ග්‍රාමය මුල්කරගත් එබඳු **'ගම්භාර දේවතා'** සංකල්පයක් තිබේ. ඒ අපේ ගමට යාබද හොරගොල්ල ගමටද එක සේ පොදු ගම්භාර දෙවියෙකු පිළිබඳ රමණීය පුරාවෘත්තයකි.

**'ආඬිගේ'** සහ **'සන්‍යාසිගේ'** යනු අපේ ගම්මානය වන තිබ්බටුගොඩ හා ඊට යාබද හොරගොල්ල ග්‍රාමයේ ජීවත්වන ගැමියන්ගේ පාරම්පරික පෙළපත් නාමයන්ය. පසුව **'සන්‍යාසිගේ'** යන පෙළපත් නාමය **'සේනාසිගේ'** වශයෙන්ද, ඊටත් පසුව එය **'සේනාසිංහ'** යනුවෙන්ද පරිණාමය වී ඇත.

මුඛ පරම්පරානුගත කතාවලට අනුව මෙම ආඬිගේ සහ සේනාසිගේ යන පෙළපත් හිමි ජන කොටස මීට සියවස් පහ හයකට ඉහත ඉන්දියාවේ කේරලයෙන් සංක්‍රමණය වී තිබේ. මලයාලම් බස කතා කළ මොවුහු මන්ත්‍ර ගුරුකම් සඳහා ද ප්‍රසිද්ධියට පත් ජන කොටසකි.

පළමුව අප රටට පැමිණ එම ගම් ප්‍රදේශය මැදින් වක්‍ර ස්වරූපයකින් ගලාබසින ඌරුවල් ඔය ආශ්‍රිතව වී ගොවිතැන ආරම්භ කළ මෙම පිරිසේ නායකයා වී ඇත්තේ **'සිද්ධි ගුරු'** නම් මහා පෞරුෂයකින් හා කලබලයකින් යුතු පුද්ගලයෙකි. කෝට්ටේ රාජධානි සමයේ හොරගොල්ල ගම්මානයේ එවකට නාගස් අල්ලිය නම් උස්බිමේ නා වදුලක් යට ජීවත් වූ ඔහු තිබ්බටුගොඩ, හොරගොල්ල යන ගම්මානවල ජනතාවගේ කෘෂිකාර්මික කටයුතු සඳහා නායකත්වය දුන් බව පැවසෙයි. ඔහු ජීවත් වූ නාගස් අල්ලිය මුල්කොට පසුකාලීනව ශ්‍රී බෙත්තාරාම විහාරය ගොඩනගා ඇත.

මෙම සිද්ධි ගුරු එවක ගමේ මුත්තා ලෙස හඳුන්වා ඇති බවත්, ඔහු ජීවත් වූ ගම් කොටුව **'මහගම'** ලෙස හැඳින්වුණු බවත් කියනු ලැබේ. අදද ශ්‍රී බෙත්තාරාම පුරාණ විහාරය අද්දර ප්‍රදේශය, පැරණි ගැමියන් විසින් හඳුන්වන්නේ **'මහගම'** ලෙසිනි.

ගණේමුල්ල, හොරගොල්ලේ පදිංචි රජයේ විශ්‍රාමික කුඩා කර්මාන්ත උපදේශිකාවක වූ එස්.කර්ලැයින් සිල්වා මහත්මිය මෙම සිද්ධි ගුරු හෙවත් ගමේ මුත්තා පිළිබඳ මුඛ පරම්පරාගත කතා ප්‍රවෘත්තීන් රැසක් දැන සිටි කාන්තාවකි. ඇය ඒවා එවක බාලවියේ සිටි අපට කියා දී තිබේ.

ඇය පවසන අන්දමට අප කුඩා කාලයේ පවා ඒ ගමේ මුත්තා හෙවත් ගම්භාර දෙවියන් බදාදා සහ සෙනසුරාදා යන කෙම්මුර දිනවල සැඳෑ යාමයේ තමන්ට අයත් ගම්බිම් බලනු පිණිස පා ගමනින් වැඩම කරයි. දිගු රැවුලකින් සහ නිරාවරණ උඩුකයකින් යුතු ඒ ගමේ මුත්තාට ළය තෙක් පැතිරගත් ජටාවක් බඳු සුදු පැහැති රැවුලක් තිබේ. ඔහුගේ ගෙලෙහි ජප මාලයක් හෙවත් නවගුණ වැලකි. අතේ සෝලු ලීයක් හෙවත් සැරයටියකි. සුදු වස්ත්‍රයක් හැඳ සිටියි.

මෙසේ තමන් විසින් කෘෂි ශිෂ්ඨාචාරයක් ඇරඹූ ගම්බිම් බලන්නට පා ගමනින් වැඩම කරන ගමේ මුත්තා නම් ගම්භාර දෙවියන් අපගේ පියැවි ඇසට නොපෙනේ. එහෙත් අප ගම්මානයේ නිවෙස්වල ඇතිදැඩි වන බලුරාළලාට නම් එම ගම්භාර දෙවියන් හොඳින් පෙනෙයි. එහෙත්, අප මෙන් දෙවියන් පිළිබඳ විශ්වාස නොකරන බලුරාළලා කරනුයේ ගමේ මුත්තාගේ රුව දුටු පමණින් බුරාගෙන පැනීමය. බල්ලන් බුරද්දී දෙවි කෙනෙකුන් වුව ගමේ මුත්තාද නිකම් ඉන්නේ නැත. එතුමන් කරනුයේ එසේ බුරා පනින බලුරාළලාගේ පසුපස ගාතයට හැකි වෙර යොදා පා පහරක් එල්ල කිරීමය.

**බදාදා සහ සෙනසුරාදා දිනවල දෙවියො වඩිද්දි සේපාලිකා මල් සුවඳක් හමනවා**

මෙසේ ගමේ මුත්තාගේ වැඩම කරවීම පියැවි ඇසට නොපෙනුණත් එය සමන් පිච්ච හෝ සේපාලිකා මල් සුවඳක් සේ අපගේ නාසයට දැනෙන බවටද එවක ජන විශ්වාසයක් විය. ඒ අනුව සතියේ අන් දිනයක එවැනි සුවඳක් අත්විඳීමට සිදුවුවහොත් එය සාමාන්‍ය මල් සුවඳක් ලෙසත් බදාදා හෝ සෙනසුරාදා ගොම්මන් යාමයක එවැනි සුවඳක් විඳීමට හැකි වුවහොත් එය ගමේ මුත්තා අපේ නිවස අද්දරින් වැඩම කිරීමක් ලෙසත් කුඩා කල අපි විශ්වාස කළෙමු. අපගේ සහ අවට නිවෙස්වල බලුරාළලාගේ බිරීම් සම්බන්ධයෙන් අප තුළ පැවැති විශ්වාසයද එපරිද්දෙන්ම විය.

එමෙන්ම අප ප්‍රදේශයේ බලුරාළලා හිටි ගමන් තමන්ගේ පසුපස ගාතය පණ නැතිව ඇදවැටෙන අන්දමත් ඉන්පසු ඔවුන් තම ඉදිරි ගාත් දෙකින් අසීරුවෙන් ගමන්කොට එයද නොහැකිව තැන තැන වැටී දින කිහිපයක් ගැහෙමින් සිට මියයන අන්දමත් එවක අපට අතිශය සුලබ අත්දැකීමක් විය.

ඉන්පසුව කටින් සෙම හලමින් මහත් වේදනාවෙන් යුතුව මියයන බලුරාළලා දෙස කඳුළු සළමින් බලා සිටි අප මොවුන් නොදැන කළ වරදට එතරම් බිහිසුණු දඬුවමක් දීම ගැන **'ගමේ මුත්තාට'** යටිසිතින් ශාප කළෙමු.

එහෙත්, වෙලාවක් කලාවක් නොමැතිව බිරුසන් දෙන බලුරාළලා කෙම්මුර දිනවල සැන්දෑ භාගයේ එසේ බිරීම ගම්භාර දෙවියන්ගේ වැඩමවීමක් නිසා බව සිතීම තර්කානුකූල නොවන බව අපට වැටහී ගියේ ළමාවිය ඉක්ම දැනුම් තේරුම් ඇති වයසට පැමිණෙන විටය.

එමෙන්ම අප ගමේ සිටි බලුරාළලාගේ පශ්චාත් භාගය පණ නැති වී දින ගණන් වේදනාවෙන් පසුවීමට හේතුව සුනඛ ප්‍රජාව අතරේ පැතිර යන සුනඛ ඩිස්ටෙම්පර් **(Canine Distemper)** නම් වෛරස් රෝගය බව අප දැනගත්තේ ඊටත් කලකට පසුවය. එම රෝගය වැළඳුනු පසු ඉතා කලාතුරකින් මිස සුනඛයෙකු ජීවත් නොවන බැවින් සුනඛයන් ඉන් මුදාගැනීමට ඇති එකම මග ඒ රෝගය සඳහා වන ප්‍රතිශක්ති එන්නත කල් ඇතිව ලබාදීම බවත් වටහාගැනීමෙන් පසු ගමේ මුත්තා නම් ගම්භාර දෙවියන් ඒ චෝදනාවෙන් නිදෙස්කොට නිදහස් කරන්නට මට හැකි විය. ඒ එය අප පරපුරේ අප්‍රකට යුග පුරුෂයෙකු මුල්කොට ගැමි විඥානයේ ස්ථාපිත වී ඇති යථාර්ථයෙන් ඉඳුරාම බැහැර ගුප්ත විශ්වාසයක් පමණක් බව මේ වනවිට මා හට මනාව පසක් වී ඇති බැවිනි.



මාධ්‍යවේදී
තිලක් සේනාසිංහ

ධරණී

# ඔබේ ලපයට මගෙන් පලතුරු!



පිංකි කොණ්ඩ කිරිල්ලිගේ මේසය අසළට ගොස් ලියුම් කවරයක් ඇගේ මේසය මතට දමා ගැසුවා.

‘‘මොකද පිංකියෝ ඩෝං ගිහිල්ලා? හබී වෙන කෙල්ලෙකුට කෝල් එකක් ගන්නවා දැක්කද?’’

‘‘ඒක ඉවසන්න තිබුණා. ඒකට කියන්නේ මානව නිදහස කියලානේ. ඉස්සර මාත් නැටුවා තමයි මල්වතු, ෆිල්ම් හෝල් ගානේ. හැබැයි චූටික්කා මැරි කළාට පස්සේ ඒවා ක්ලෝස්. අනික මගේ මූණේ ලපයක් තියෙනවා තමයි. මගේ ලපයට මොකටද පලතුරු? කවුදෝ මාව ජෝක් එකට අරන්.’’ පිංකි දත්මිටි කමින් දැඟලුවේ ගැංගම් ඩාන්ස් සිස්ටම් එකට.

‘‘මොකක්ද උඹ ඔය කියන්නේ?’’ කොණ්ඩි කරකවා අතහැරී ගානයි.

‘‘ඔය ලියුම් කවරේ බලපන්කෝ. ඒක අපේ සිකුරුටි එකට දීලා ගිහින් මට දෙන්න කියලා. කවරේ ලියලා තියෙන එක බැලුවාම මට ලියුම කියවන්න හිතුනෙත් නෑ.’’

කොණ්ඩි ලිපිය අතට ගත්තා.

‘‘පිංකි නටයි. ඔබේ ලපයට මගෙන් පලතුරු.’’ යනුවෙන් කවරයේ ලියා තිබුණා.

‘‘මොකක්ද බං මේ හරුපේ? හිටපන් මං මේ ලියුම කියවලා බලන්න.’’

ලියුම කියවූ කොණ්ඩි ‘බක බක’ ගා සිනාසෙන්න වුණේ බෝංචි කරල් දෙකක් නොමිලේ ලැබුණු පාරිභෝගිකයෙක් වගේ සතුටින්.

‘‘මේක ලව් ලෙටර් එකක්නෙ බං. උඹ කාටහරි ෆුල් ලව් ටෝක් එකක් දැම්මද?’’

‘‘මං හැමදම වැඩ ඇරිලා යනකොට කොල්ලෙක්. එස්.පී.බී.ආර්. ඒ කියන්නේ සත්‍ය ප්‍රේම භෘංග රාජයා වෙලා දියුම් දික් කර කර මගෙනුත් ලියුමක් ඉල්ලනවා. මං ජොලියටත් එක්ක මෑන්ස්ට ලියුමක් දුන්නා.’’ පිංකි පැවසුවේ යෞවනයේ පොපියන චමත්කාරයෙන්.

‘‘හරිනේ! මෑන්ස් ඒ ලියුමට රිප්ලයි එකක් දීලා තියෙන්නේ. මේකේ ලියලා තියෙන්නේ, ‘පිංකිගේ නමටයි! ඔබේ ලිපියට මගෙන් පිළිතුරු’ කියලා. මෑන්ස්ට සිංහල හරියට ලියන්න බෑ. අකුරු වැරදියි. ඉස්පිලි, පාපිලි, හැලිලා.’’ කොණ්ඩි බඳ නළවා උකුලු මුකුළු හඬින් කීවා.

**ලබන සතියේත් හමුවෙමු.**

**සංඛ සඳරුවන්**


**වෙන්ඩෝල්**
**අශ්වබල වර්ධනී**

විවාහක පුරුෂයින් ගෙවී යන ශක්තිය නැවත ලබා ගත යුතුයි.
ඒ සඳහා ආහාර වලින් නොලැබෙන දිනපතාම වුවද ගත හැකි 100%ක් ස්වභාවික අතිරේක පෝෂණීය සංයෝගය වෙන්ඩෝල් අශ්වබල වර්ධනී
**අති ප්‍රබල වාජීකරණය**
**කරල් 80ක් 890/=**
**කස්තූරි කරල් 4ක් 490/=**




0774 525 425
සියළුම සිංහල, ඉංග්‍රීසි බෙහෙත් වෙළඳසැල් වලින්



# උකසට තබා බේරා ගැනීමට නොහැකිවූ ඔබේ රන් භාණ්ඩ නැවතත් ඔබේ අතටම

ඔබ දැනට උකස්තබා ඇති රිසිට් පත අපට 0767 888 222 අංකයට WhatsApp කරන්න

**වැඩි විස්තර සඳහා අමතන්න**

| | | | |
|---|---|---|---|
| කොළඹ | 0771 408 547 | වැල්ලවත්ත | 0710 870 686 |
| මොරටුව | 0766 227 059 | කළුතර | 0776 167 149 |
| මීගමුව | 0766 227 056 | ගම්පහ | 0779 230 549 |
| වෙන්නප්පුව | 0710 869 378 | හලාවත | 0779 256 191 |
| ගාල්ල | 0705 979 274 | මාතර | 0705 979 237 |
| කුරුණෑගල | 0766 227 061 | ගම්පොල | 0710 870 735 |
| දිගන | 0778 156 738 | නාවලපිටිය | 0710 870 706 |
| තලවකැලේ | 0710 871 009 | හැටන් | 0778 790 372 |
| මාතලේ | 0702 539 389 | කෑගල්ල | 0703 583 363 |
| බේරුවල | 0772 999 934 | පූඩළුඔය | 0777 683 889 |
| මතුගම | 0772 206 413 | රාගල | 0710 870 703 |
| වව්නියාව | 0740 920 313 | උඩප්පුව | 0771 201 851 |
| මොණරාගල | 0771 201 852 | ත්‍රිකුණාමලය | 0771 201 854 |
| බදුල්ල | 0771 201 863 | පුත්තලම | 0771 201 861 |
| කොටහේන | 0702 539 382 | මහියංගනය | 0771 201 862 |
| කල්පිටිය | 0761 605 803 | මස්කෙලිය | 0760 909 822 |
| කටුගස්තොට | 0779 476 206 | පානදුර | 0776 157 119 |
| නාඋල | 0763 226 230 | | |

F.A.Ads

කවරයේ කතාව

# මම ගිනි කන හැටි දැකලා යුරෝපයේ අය පුදුම වුණා

## 2021 ලෝක සංචාරක රූ රැජින කිරුළ දිනූ නලීෂා භානු






මෙවර සංචාරක රූ රැජින තරඟය පැවැත්වූයේ පිලිපීනයේය. කොවිඩ්-19 වසංගතය හේතුවෙන් තරඟය පැවැත්වුණේ මාර්ගගත ක්‍රමයටයි. තරඟය සඳහා රටවල් 30ක් නියෝජනය කරමින් සුරූපිනියන් තිස්දෙනෙකු සහභාගී වූ අතර, ඒ සියලු සුරූපිනියන් පරදවා ජයගැනීමට 22 හැවිරිදි මේ සුරූපිනිය සමත් වූවාය. එසේම ආර්ථික දුෂ්කරතා සහිත පවුල්වල දරුවන් වෙනුවෙන් සමාජ සුබසාධන කටයුතු කිහිපයක් සංවිධානය කිරීමටත් ඇය සූදානමින් සිටියි.

**"රූපරාජිනියක් වෙන්න රූපය විතරක් ප්‍රමාණවත්ද?"**

**"කොහෙත්ම නැහැ... ඒක බාහිර රූපය විතරක් බලලා තීරණය කරන්න පුළුවන් දෙයක් නෙවෙයි. රූපරාජිනියක් කියන්නේ රූපය, දැනුම, හැකියාව, ගුණයහපත්කම් මේ සියල්ලේම එකතුවට කියලයි මම හිතන්නේ..."**

ඒ විනිශ්චය මණ්ඩලයේ අවසාන පැනයට ඈ ලබාදුන් පිළිතුරයි.

ඇත්තය. රුව තිබූ පමණින් රූ රැජිනක වීමට කාටත් බැරිය. ඒ සඳහා ගුණෝන් මෙන්ම හැකියාවෙන්ද පිරිපුන් විය යුතුය.

ඇය මේ සියල් ගුණයන්ගෙන් පරිපූර්ණ සොඳුරු තරුණියකි. ශ්‍රී ලංකාවට ප්‍රථම වරට සංචාරක රූ රැජින කිරුළ දිනාදීමට ඈ සමත් වූයේ ඒ නිසාය.

**"ජයග්‍රහණය කාටද කියන වෙලාවේ මම තදින් ඇස් වහගෙනයි හිටියේ. පළමුවැනි ස්ථානය 'ශ්‍රී ලංකාවට' කිව්ව වෙලාවේ හිතට දැනුණ ඒ හැඟීම විස්තර කරන්න මට වචන නැහැ. 2020 වසරේදී ශ්‍රී ලංකාව සංචාරක රූ රැජින තරඟයේ තුන්වැනි ස්ථානය ජයග්‍රහණය කළා.**

**ඒත් මීට කලින් ප්‍රථම ස්ථානයක් දිනාගන්න අවස්ථාව ලැබිලා නැහැ. ඉතින් ලංකාවට ඒ ජයග්‍රහණය දිනා දෙන්න ලැබුණු එක මට ලොකු ගෞරවයක්.**

**මේ වසරේ 'Mr and Miss Teen Sri Lanka' තරඟයේ තුන්වැනි ස්ථානය දිනාගන්න මට අවස්ථාව ලැබුණා. ඒ ජයග්‍රහණයත් එක්කයි මට මේ තරඟයට ඉදිරිපත් වෙන්න අවස්ථාව ලැබුණේ."**

සුන්දරත්වය තුළින් ජාත්‍යන්තරය නියෝජනය කරන්නට මඟපෑදුනු අයුරු ගැන ඈ සිය මතකය අවදි කළේ එසේයි.

**"පිලිපීනය ඇතුළු බොහෝ රටවල යුවතියන් රූපරාජිනී තරඟ සඳහා සූදානම් වෙන්නෙ පුංචි කාලේ ඉඳලා. ඒත් මේ තරඟයට මාව ඉදිරිපත් කරනවා කියලා දැනුම් දෙනකොට තරඟයට තිබුණේ මාසයකටත් අඩු කාලයක්. ඉතින් උපරිම කැපකිරීමකින් ඒ කාලසීමාව ඇතුළත තරඟයට සූදානම් වෙන්න මට සිද්ධ වුණා."**

ඉදිරිපත් කිරීමේ අංගය වෙනුවෙන් ඈ තෝරාගෙන තිබුණේ සිංහල අභිමානය හොඳින් ඉස්මතු කරන අංගම්පොර සහ ගිනි නර්තනය සම්මිශ්‍රිත ඉදිරිපත් කිරීමකි.



**"ඒ දේවල් මම කලින් හඳුරලා තිබුණේ නැහැ. ඉතින් අංගම්පොර ඉගෙනගන්න ලැබුණේ දවස් හතරක වගේ කාලයක්. ඒ වගේම ගිනි කෑම සහ ගිනි නර්තනය ඉගෙනගත්තේ එක දවසකින්. ගිනි කෑම වගේ දේවල් දැක්කම යුරෝපීය රටවල අයට හරි පුදුමයි. මම ඒක කළේ කොහොමද කියන එක එයාලා කීපසැරයක්ම ඇහුවා. මේ තරඟය ගැන විකාශය කරන වෙළෙඳ දැන්වීම්වල පවා වැඩි වශයෙන් තිබුණේ මගේ ඉදිරිපත් කිරීම්. ඉතින් සිංහල අපේ දේවල් ගැන ලෝකේ අනිත් අය කොච්චර පුදුමයට පත්වෙනවාද කියන එක මමත් මේකෙන් තමයි දැනගත්තේ."**

සංචාරක ලෝක රූ රැජින තරඟ ජයග්‍රහණයට පසුව බොහෝදෙනා අතර කතාබහට ලක්වුවද නිරූපණ ශිල්පිනියක ලෙස ඇගේ රුව ඊට පෙර සිට හුරුපුරුදුය.

**"මම වේරගල ඥානවිමල කනිෂ්ඨ විද්‍යාලයේ වගේම හංවැල්ල රාජසිංහ විද්‍යාලයේත් ආදි ශිෂ්‍යාවක්. උසස් පෙළ කරන අතරතුරේදීම නර්තනය, වේදිකා නාට්‍ය, නිරූපණය වගේ අංශවලටත් සම්බන්ධ වුණා. උසස් පෙළින් පස්සේ නිරූපණය ගැන හැදෑරීමක් කළා. ඊටපස්සේ තමයි නිරූපණ ක්ෂේත්‍රයේ වැඩ කටයුතුවලට සම්බන්ධ වුණේ. නිරූපණ ක්ෂේත්‍රය ගැහැනු ළමයෙක්ට නුසුදුසු ක්ෂේත්‍රයක් කියලත් කතාවක් තියෙනවනේ. මම නම් ඒක පිළිගන්නේ නැහැ. අර කතාවක් තියෙනවනේ 'හිටියොත් හොඳට හැඳී දෙවියොත් නමට වඳී' කියලා. ඒවගේම තමයි ඕනම තැනක හරි විදියට ඉන්න දන්න කෙනෙක්ට මේ ක්ෂේත්‍රයේ විතරක් නෙවේ ඕනම ක්ෂේත්‍රයක දුර ගමනක් යන්න පුළුවන්."**

ඇගේ කතාව ඇයගේම හඬින් අහන්න මෙම **QR** කෝඩ් එක ස්කෑන් කරන්න



නිරූපිකාවක ලෙස පමණක් නොව ලෝකය දිනූ මේ රූපරාජිනිය රූපලාවණ්‍යාගාරයක් සහ ඇඳුම් නිර්මාණ ආයතනයක් හිමි සාර්ථක ව්‍යාපාරිකාවක් බවත් කිව යුතුය.

**"අම්මයි, අයියලා දෙන්නයි තමයි මට ඉන්නේ. මගේ හැම ජයග්‍රහණයකම පිටිපස්සේ එයාලගෙත් දිරිගැන්වීම්, කැපවීම් තියෙනවා.**

**ඒ වගේම මේ තරඟයට මාව සූදානම් කළ රුක්මාල් සේනානායක මහත්මයාව මේ මොහොතේ මතක් කරන්නම ඕනේ. ඒ වගේම ඉසුරු ගුණසේකර, චරිත් ගුණසේකර, චන්දිමාල් ජයසිංහ, යසංග සිගේරා යන මහත්වරුන් වගේම මාව ලස්සනට හැඩගැන්නුව මලීශා ක්‍රිෂාන්තිවත් වචනයකින් හරි උදව් කළ හැමදෙනාටත් ස්තූතිවන්ත වෙන්න මම මේක අවස්ථාවක් කරගන්නවා."**

**"මට අනිත් අය වෙනුවෙන් කියන්න වචනයක් තියෙනවා. 'ඔය තරඟයට යන්න එපා, ඔයා දිනන්නේ නැහැ' කියලා ගොඩක් අය මට කිව්වා. 'අපෝ ඔන්ලයින් ක්‍රමයට තරඟය තිබුණේ නැත්නම් කවදවත් ඔයා දිනන්නේ නැහැ' කියලා ජයග්‍රහණය කළාට පස්සෙ සමහරු කිව්වා. මම නම් ඒවා ගනන් ගත්තේ නැහැ. මම අනිත් අයටත් කියන්නේ අනුන් කියන දේ නෙවෙයි හැමවෙලේම තමන්ව විශ්වාස කරන්න. සොබාදහම විශ්වාස කරන්න. ඊට වඩා දෙයක් මේ ලෝකේ කොහෙවත් නැහැ...."**

හිත් රිදවීම් ජයග්‍රහණයට හොඳම පන්නරය බව ඈ කීවේ සිනහ මුවින්ය. අද 'ධරණී' කවරය නැවත වරක් පෙරළා බැලිය හැකි නම් ලක්මවට අභිමානය ගෙන ආ සංචාරක ලෝක රූ රැජිනිය නලීෂා හානු නම් ඇයගේ ඒ සොඳුරු සිනහව ඔබට නැවත වරක් දැකගත හැකිවනු ඇත.

**සෙව්වන්දි හෙට්ටිආරච්චි**

**ඡායාරූප - සමන් අබේසිරිවර්ධන**

**හැඩගැන්වීම - මහසෙන් විජයමාන්න, සැලෝන් මහසෙන්, හංවැල්ල**

**පසුතලය - සෝලිස් හොටෙල් පිටකෝට්ටේ**







# නිවේදක සිහිනයට සිනාසුණු ගුරුතුමීට තෑගිවලින් දඬුවම් දුන් සුපිරි නිවේදකයා

# ස්ටීව් හාවි

**ඔබට විසල් සිහින තිබේනම්, පිළිගන්න ඔබට සාර්ථක විය හැකියි**

'Volcano' යන වචනය නිසිපරිදි උච්චාරණය කිරීමට තිබූ අපහසුව නිසා පාසල් ළමුන් අතර නිරන්තරයෙන් සමච්චලයට ලක්වූ සිසුවෙක් සිටියේය. අප්‍රිකානු-ඇමරිකානු සම්භවයක් ඇතිව ඉපදුණු ඔහුගේ නම ස්ටීව් ය. කථන අපහසුතා නිසා ඔහුගේ ගමන සුබ සහ සුවදායී එකක් නොවුණත් කිසිවෙකුට නොකී විසල් සිහිනයකුයි ඔහුගේ හිතේ තිබුණේ.

හයවන ශ්‍රේණියේ උගනිමින් සිටියදී දිනක් ඔහුගේ පන්තිභාර ගුරුතුමිය පන්තියේ සිසුන්ට පැවරුමක් ලබාදුන්නාය. තම තමන්ගේ අනාගත අපේක්ෂාවන් කඩදාසියක සටහන් කර නැවතත් ගුරුතුමියගේ අතට දීමය පැවරුම වූයේ. සැබෑම අරමුණ එහි සටහන් කළ යුතු බවටද ගුරුතුමියගෙන් උපදෙස් ලැබුණි. ස්ටීව්ට දෙවරක් සිතීමට දෙයක් නොතිබිණි. ඔහු තම සිහිනය පැහැදිලි අකුරින් සුදු කඩදාසිය මත අකුරු කළේය.

**"මට රූපවාහිනියේ පෙනී සිටීමට අවශ්‍යයි."**

ඒ, කඩදාසියේ ලියැවුණු ස්ටීව්ගේ හීනයයි. නියමිත වේලාවෙන් පසු ගුරුවරිය පැවරුම් එකතු කළාය. ස්ටීව්ගේ පිළිතුර දුටු ඇය පුදුමයටත්, කේන්තියටත් පත් විය. ඇයට අනුව එය විකාරයකි. අනිත් ළමුන් මෙන් පැහැදිලිව අදහසක් ප්‍රකාශ කිරීමටවත් නොහැකි සිසුවකු එලෙස ලිවීම පැවරුම විහිළුවට ගැනීමක් ලෙසයි ඈ සැළකුවේ. එබැවින් ස්ටීව් හාවි පන්තිය ඉදිරියට කැඳවූ ගුරුවරිය ඔහුට චෝදනා කරමින් එම කඩදාසිය ඉරා දැමුවාය. ඔහු මෙවැනි බහුබූත සිහින දැකීමේ භයානකකම ඇය හාවිගේ මවටද දුරකතන මාර්ගයෙන් දැනුම් දුන්නාය.

ස්ටීව් එදින නිවසට ගියේම කෝටුපහර කිහිපයක් අපේක්ෂාවෙනි. ගුරුවරිය කී දේ ගැන කණස්සල්ලට පත්ව සිටි මව, පියා නිවසට පැමිණි වහාම ඔහුටද ඒ බව දැනුම් දුන්නාය. එහෙත් ඔහුගේ ප්‍රතිචාරය වෙනස්ය.

**"ඉතින්, මොකද්ද ඒකෙ වැරැද්ද?"**

මවත් පියාත් අතර සංවාදය මතගැටුමක් බවට හැරෙද්දී ස්ටීව්ට කාමරයට යන ලෙස අණ ලැබිණි. ටික වේලාවකින් එහි පැමිණි පියා ස්ටීව් සමඟ කතා කළේය.

**"ඔයාගෙ කොළය ලාච්චුවට දාන්න. හැම උදේම නැගිට්ට ගමන් ඒ කොළේ කියවන්න. හැමදාම නිදියන්න කලින් ඒ කොළේ කියවන්න. ඒක තමා ඔයාගෙ කොළේ."**

පියා තමාට ඉගැන්වූ සාර්ථකත්වයේ මූලධර්මය එය බව ස්ටීව් හාවි පවසයි.


**"මනසින් දකින දේ ලියා තබා නැවත නැවත දැකිය හැකි නම්, ඒවා ඔබේ දෑතේ රඳවා තබාගත හැකියි. ඔබට විසල් සිහින තිබේනම්, පිළිගන්න ඔබට සාර්ථක විය හැකියි."**



ස්ටීව් කුඩා කාලයේදී

තමා කෙරෙහි විශ්වාසය තැබූ පියාට අමතරව තවත් විශේෂ පුද්ගලයෙකු ස්ටීව්ගේ මතකයේ සිටී. ඒ අසල්වැසියෙකි. කථන දුර්වලතා මගහරවා ගැනීමට හෙතෙම ස්ටීව් උනන්දු කරවීය. ඔහු ස්ටීව්ට ලබාදුන් උපදෙස මෙයයි.

**"කිසිවක් ප්‍රකාශ කිරීමට පෙර එය තුන්වරක් ඔබටම කියාගන්න. ඔබට අවශ්‍ය කාලය ලබාගන්න. පසුව වචනය පිටකරන්න."**



ස්ටීව් සිය බිරිඳ සමඟ

නිවැරදිව කතා කරන සෑම අවස්ථාවකම අසල්වැසියා ස්ටීව් අගය කළේ රසකැවිල්ලක් ලබාදෙමිනි.

වසර ගණනක කැපවීම, මහන්සිය වැටීම් නැගිටීම් අතරින් ස්ටීව් හාවි සිය අරමුණට ළඟාවිය. දැන් රූපවාහිනී ක්ෂේත්‍රයෙහි ඔහු නොදත් අයෙකු නැති තරම්ය. එහෙත් කටුක ළමා විය ඔහුට අමතක නැත. හදවත හූරා දැමූ ගුරුවරිය පිළිබඳ කේන්තියක්ද ඔහුට නැත. එහෙත් තමා රූපවාහිනියේ සිටින බව ඇයට දැනුම් දීමට ඔහුට අවශ්‍ය විය. ඒ වෙනුවෙන් හරි අපූරු උපක්‍රමයකි ඔහු අනුගමනය කළේ.

**"ඇය ජීවත්ව සිටිතාක් හැම නත්තලටම මම ඇයට රූපවාහිනියක් තෑගි ලෙස යැව්වා. කලක් ගත වෙද්දි ඇයගෙන් චෝදනා එල්ල වුණා රූපවාහිනී යන්ත්‍ර තබාගැනීමට ඉඩක් නැති බවට. ඒත් මම ඒක ගනන් ගත්තෙ නෑ. මට ඕන වුණේ පුංචි කාලේ මගේ හීනයට හිනාවුණු ඇයට දින හතේම මා රූපවාහිනියේ පෙනී සිටීම පෙන්වීම පමණයි."**



**නිවැරදිව වචන උච්චාරණය කරන හැම මොහොතකම ඔහු මට රසකැවිල්ලක් දුන්නා**

අද වනවිට අභිප්‍රේරකයකු ලෙසද ලොව පුරා ප්‍රසිද්ධියට පත්ව සිටින ස්ටීව් ඒ ස්ථානයට ළඟාවූයේ දැඩි කැපකිරීම්වල ප්‍රතිඵලයක් ලෙසිනි. සිහිනය හඹායාම වෙහෙසකර වුවද ඔහු එය අත් නොහැරීය. ඇතැම් කාලයක ඔහුගේ නිවහන වූයේ මෝටර රථය පමණි. වීථි පුරා එහි නැගී යමින් රාත්‍රිය එහිම නිදමින් ඔහු සිහිනයට ළඟාවිය.

**"දුප්පත්කම මාව මේ තැනට තල්ලු කළා. මට ඒක එපාවෙලා තිබුණෙ. කුඩා කාලයේදී මට කිරීමට අවශ්‍ය වූ දේ කළ නොහැකි වුණා. මම කොන් වී සිටියා. ඒත්, මනසින් වැඩෙත්ම මම මගේ තැන, කළ යුතු දේ තෝරාගත්තා. මට වේදිකා භීතිය තිබුණා. එය ජයගැනීමට මා සමත් වුණා. තවමත් ඕනෑම සංදර්ශනයකට පෙර මානසිකව සූදානම් වීමට මම වෙලාව ගන්නවා. මගේ අදහස් මිනිසුන් අතරට ගෙනියන්න මම ඒ විශේෂ කාලය තවමත් මට දෙනවා."**

සැබැවින්ම ස්ටීව් හාවි අපූරු මනුෂ්‍යයෙකි. සැමවිටම තමා කරනා කාර්යයෙහි වගකීම ඔහු බාරගත්තේය. 2015 විශ්ව රූ රැජින අවසන් තරඟ රාත්‍රිය ඊට කදිම උදාහරණයකි. එහි නිවේදන කටයුතු සිදුකරනු ලැබුවේ ඔහුය. ජයග්‍රාහිකාව ප්‍රකාශ කරන මොහොත එළැඹිණ. බොහෝ පරිණත නිවේදකයාට බරපතළ අත්වැරැදීමක් විය. ජයග්‍රාහිකාව ලෙස ඔහු ප්‍රකාශ කළේ වැරදි නමයි. වැරැද්ද අවබෝධ වනවිට දෙවෙනියා විය යුතුව සිටි කොලොම්බියා රූමතිය විශ්ව රූ රැජින ලෙස කිරුළු පැළඳ අවසන්ය. එහෙත් සැබෑ ජයග්‍රාහිකාව පිලිපීන රූ රැජිනයි. සමස්ත ලෝකය බලා සිටියදී නිවැරදි කිරීම නුසුදුසු බව සිතන විනිසුරු මඬුල්ල එය පසුදට කල්තැබීමට තීරණය කළේය. මෙය ස්ටීව් හාවිගේ වෘත්තීය ජීවිතයටද බලපෑමකි. එහෙත් තමාගේ වෘත්තියට කුමක් වුවද, ක්‍රියාවේ වගකීම තමා බාරගත යුතු බව ස්ටීව් විශ්වාස කළේය. එබැවින් ඒ මොහොතේම ස්ටීව් හාවි වේදනාකාරී වුවද සිය වැරැද්ද එම වේදිකාවේ දීම නිවැරදි කළේය. වෘත්තීය අභාවයට යාම වෙනුවට ඔහුගේ නිවේදන දිවිය තවත් වර්ණවත් කිරීමට එම සිදුවීම හේතුවිය. සියලුදෙනා ඔහු අගය කළහ. ඔහුගේ වගකීම් සහගත බව, වරද නිවැරදි කිරීමේ සැබෑ උවමනාව බොහෝ පිරිසකගේ අවධානයට ලක්විය.

1957 ජනවාරි 17 වනදා ඇමරිකාවේ බටහිර වර්ජිනියාවේ ඔහු උපත ලැබුවේ පවුලේ බාලයා ලෙසිනි. මේසා දුරක් එන්නට ඔහුව උනන්දු කළ ඔහුගේ පියා වෘත්තියෙන් ගල්අඟුරු පතල් සේවකයෙකි. මව ඉරිදා පාසල් ගුරුවරියක වූවාය.

අද වනවිට ඔහු විකට ශිල්පියකු, රූපවාහිනී සහ ගුවන්විදුලි නිවේදකයකු, නිෂ්පාදකයකු, නළුවකු සහ ලේඛකයෙකු ලෙසද ජනාදරයට පාත්‍ර වී ඇත. නමින් හඳුනා නොගත්තද ඔහුගේ රුව අපට හුරු ඒ නිසාය.

**රෂ්නිකා ලියනගේ**



# මඤ්ඤොක්කා රොටී

## අවශ්‍ය ද්‍රව්‍ය

- මඤ්ඤොක්කා (සුද්දකරගත්) 1kg
- බිත්තර කහමද 2
- ගාගත් පොල් 100g
- ගම්මිරිස් රස අනුව
- ලුණු රස අනුව

## සාදන ක්‍රමය

- මඤ්ඤොක්කා ග්‍රේට් කරගන්න.
- ග්‍රේට් කරගත් මඤ්ඤොක්කා වතුරෙන් සෝදා මිරිකාගන්න.
- ඉන්පසු එයට බිත්තර කහමද, ගාගත් පොල්, ලුණු, ගම්මිරිස් දමා හොඳින් මිශ්‍ර කරගන්න.
- මිශ්‍රණයෙන් ග්‍රෑම් 100ක් පමණ වළලු ආකාරයේ අච්චුවකට දමා තදකර දෙපැත්ත හරවමින් පුළුස්සා ගන්න.
- එසේ නොමැති නම් ඔබ කැමැති පරිදි හැඩකර දෙපැත්ත හරවමින් පුළුස්සා ගන්න.

# දන්දිල රොටී

## අවශ්‍ය ද්‍රව්‍ය

- දන්දිල අල 1kg
- ලූනු (රන්වන් පැහැයට බැදගත්) මේස හැඳි 1
- බේකන් (පොඩියට කපා බැදගත්) 40g
- බිත්තර 1
- බටර් මේස හැඳි 1
- ඩෙසිකේටඩ් කොකනට් 5g
- පොල්කිරි මේස හැඳි 1
- ගම්මිරිස් රස අනුව
- ලුණු රස අනුව

## සාදන ක්‍රමය

- අල සුද්දකර තම්බා කැබලි නොමැති වන පරිදි පොඩිකර ගන්න.
- බටර් හැර අන් සියල්ල අලවලට දමා මිශ්‍ර කරගන්න.
- තරමක කුඩා බෝල සාදා තරමක් පැතැලි කරගන්න.
- තැටියකට බටර් දමා ඒ මතට සාදගත් රොටී දමා දෙපැත්ත හරවමින් පුළුස්සා ගන්න.



# කරවල කරිය

## අවශ්‍ය ද්‍රව්‍ය

- කරවල (කට්ටා/තලපත්/බල/තෝරා) 150g
- තක්කාලි (තීරු කපාගත්) 50g
- මාලුමිරිස් (තරමක කැබලි කපාගත්) 50g
- සුදුලූනු (දෙකට පළාගත්) මේස හැඳි 1
- කරපිංචා (කපාගත්) මේස හැඳි 1
- රම්පේ අඟල් 1/2
- කුරුඳුපොතු අඟල් 1/2
- අමුමිරිස් (දෙකට පළාගත්) කරල් 3
- කහකුඩු තේ හැඳි 1/2
- මිරිස් කුඩු තේ හැඳි 1
- කරිකුඩු තේ හැඳි 1
- ලුණු රස අනුව
- මිටිකිරි අඬුකොප්ප 1
- දියකිරි අඬුකොප්ප 1/4

## සාදන ක්‍රමය

- කරවල අඟල් 3/4 පමණ කැබලි කපාගන්න.
- උණුවතුරේ/පොල්වතුරේ කපාගත් කරවල දමා විනාඩි 10ක් තබා, ඇල්වතුරින් දෙතුන් වරක් සෝදගන්න.
- භාජනයක් ගෙන මේ සියල්ල එකට දමා ලිප තබා උතුරනතුරු හැඳිගාන්න.
- හොඳින් ඉතිරූ පසු ගින්දර අඩුකර පියනකින් වසා තරමක් සිඳුවාගන්න.





# පරිප්පු මිරිසට

## අවශ්‍ය ද්‍රව්‍ය

- පරිප්පු 250g
- ලූනු (ලියාගත්) 30g
- අමුමිරිස් (ලියාගත්) කරල් 2
- සුදුලූනු (ලියාගත්) තේ හැඳි 2
- කරපිංචා (ලියාගත්) මේස හැඳි 1
- කෑලි මිරිස් තේ හැඳි 2
- අබ ඇට තේ හැඳි 1/2
- කහකුඩු තේ හැඳි 1/2
- මිරිස් කුඩු තේ හැඳි 1
- ලුණු රස අනුව
- වියලි මිරිස් කරල් 2
- තෙල් මේස හැඳි 2
- වතුර අඩු කෝප්ප 2
- රම්පේ අඟල් 1/4
- කුරුඳු පොතු අඟල් 1/4

## සාදන ක්‍රමය

- පරිප්පු සෝදා පසෙකින් තබන්න.
- භාජනයක් ලිප තබා තෙල් දමා තෙල් රත් වනවිට අබ ඇට දමා බැදෙන විට මිරිස් කරල් කඩා දමන්න. රතු ලූනු, සුදුලූනු, අමුමිරිස්, රම්පේ, කරපිංචා, කුරුඳු පොතු එක්කර රන්වන් පැහැය වනතුරු බැදගන්න.
- පසුව කෑලි මිරිස්, කහ එකතු කර තරමක් බැදෙන්න හැර ලුණු සහ පරිප්පු දමා වතුර අඬුකෝප්ප 2 ක් දමා මද ගින්නේ තම්බා ගන්න.
- අවශ්‍යනම් උම්බලකඩ එක්කර ගත හැක.



# කුරක්කන් තලප

### අවශ්‍ය ද්‍රව්‍ය

- කුරක්කන් පිටි 250g
- වතුර අවශ්‍ය ප්‍රමාණයට
- ලුණු රස අනුව

### සාදන ක්‍රමය

- භාජනයකට වතුර දමා ලිප තබන්න.
- එය උතුරන විට ලුණු මිශ්‍ර කර බාගන්න.
- කුරක්කන් පිටි භාජනයකට දමා උණුකරගත් වතුර දමමින් දිය කර ඉතිරි වතුර පැත්තකින් තබන්න.
- එය ලිප තබා මද ගින්දරේ පතුගාමින් තම්බා ගන්න.
- තැම්බී මදිනම් ඉතුරු වතුර ටිකින් ටික වටේට භාජනය තුළට දමමින්, අමු කැට හොඳින් තැම්බෙන තුරු අතේ නොඇලෙන පරිදි තම්බා ගන්න.

# කේජු සහ කොස් මදුළු පයි

### අවශ්‍ය ද්‍රව්‍ය

- පැසුණු කොස් මදුළු (වරකා) 500g
- නැවුම් කිරි අඩුකොප්ප 1
- බිත්තර 3
- චීස් 50g
- අබ ක්‍රීම් තේ හැඳි 1/4
- කහකුඩු තේ හැඳි 1/4
- ගම්මිරිස් රස අනුව
- ලුණු රස අනුව

### සාදන ක්‍රමය

- කොස් මදුළු හීනියට තීරු අඟල් 3/4 කැබලි කපාගන්න.
- වතුර ලිප තබා කහ, ලුණු එක්කර උතුරන විට කොස් මදුළු දමා තත්පර 30ක් තම්බා ඇල්වතුරෙහි දමා සෝදගන්න.
- බිත්තර සහ කිරි එකට මිශ්‍ර කර අබ, ලුණු සහ ගම්මිරිස් සමග චීස් 1/2ක් දමා කවලම් කරගන්න.
- උණුංගස්සවා ගත් කොස් මදුළු එම මිශ්‍රණයට දමාගන්න.
- මෙය උඳුනක (Oven) දැමිය හැකි භාජනයකට දමා උඩින් ඉතුරු කරගත් චීස් දමාගන්න.
- සෙල්සියස් අංශක 160 උෂ්ණත්වයේ විනාඩි 10ක් පමණ බේක් කරගන්න.



# රුහුණු අච්චාරු



## අවශ්‍ය ද්‍රව්‍ය

| | |
|---|---|
| රතුලූනු (ගෙඩි පිටින්) | 200g |
| අමුමිරිස් (දෙකට පලා) | 200g |
| වියළි හාල්මැස්සන් | 75g |
| අබ විනාකිරෙන් අඹරා මේස හැඳි | 5 |
| ගම්මිරිස් කුඩු තේ හැඳි | 2 |
| කහකුඩු තේ හැඳි | 1 |
| ලුණු රස අනුව | |
| සීනි මේස හැඳි | 1 |
| තෙල් ලීටර් | 1/2 |

## සාදන ක්‍රමය

- තෙල් රත්කර ලූනු සහ අමුමිරිස් වෙන වෙනම උණුං ගස්සවා ගන්න.
- හාල්මැස්සන් සුද්දකර සෝද ගැඹුරු තෙලේ බැදගන්න.
- පිරිසිදු භාජනයක් ගෙන අබ, විනාකිරි, සිනී, ගම්මිරිස්, කහ, ලුණු දමා මිශ්‍රකරගන්න.
- එයට අන් සියල්ල එක්කර හොඳින් මිශ්‍රකර වසා තබා දවසකට පසු පාවිච්චියට ගන්න.




# පස්තෑල පේස්ට්‍රි (බදින) මිශ්‍රණය

## අවශ්‍ය ද්‍රව්‍ය

| | |
|---|---|
| පිටි | 1kg |
| බිත්තර | 1 |
| බේකින් පවුඩර් තේ හැඳි | 1 |
| සීනි තේ හැඳි | 1 |
| ලුණු තේ හැඳි | 1 |
| බටර් මේස හැඳි | 2 |
| දෙහි යුෂ තේ හැඳි | 2 |
| මිටිකිරි අඩුකෝප්ප | 2 |

## සාදන ක්‍රමය

- මේ සියල්ල අතේ නොඇලෙන පදමට හොඳින් අනා තෙත රෙද්දකින් වසා තබන්න. පැයකට පසු පාවිච්චියට ගන්න.



ගල්කිස්ස මහ හෝටලයේ ආහාර හා ප්‍රවර්ධක අධ්‍යක්ෂ
**ආචාර්ය පබ්ලිස් සිල්වා**
ඉදිරිපත් කරයි.

සම්බන්ධීකරණය
ගල්කිස්ස මහ හෝටලයේ
**නිමාකෝ ද සිල්වා**

# මාළු පස්තෑල

## අවශ්‍ය ද්‍රව්‍ය

| | |
|---|---|
| මාළු (පොඩියට කපාගත්) | 500g |
| ලූනු (කපාගත්) | 40g |
| තෙල් මේස හැඳි | 2 |
| කරි කුඩු මේස හැඳි | 1 |
| අමුබිලිං/අමු තක්කාලි (පොඩියට කපාගත්) මේස හැඳි | 1 1/2 |
| කරාබුනැටි කරල් | 2 |
| කරපිංචා (සිහින්ව කපාගත්) මේස හැඳි | 1 |
| කරදමුංගු කරල් | 2 |
| අමුමිරිස් (කපාගත්) කරල් | 2 |
| කහකුඩු තේ හැඳි | 1/2 |
| මිරිස් කුඩු තේ හැඳි | 1 |
| සුදුලූනු (පොඩියට කපාගත්) තේ හැඳි | 1 |
| කුරුඳු කුඩු තේ හැඳි | 1/2 |
| ඉඟුරු (ඉතා කුඩාවට කපාගත්) තේ හැඳි | 1/2 |
| රම්පෙ අඟල් | 1/2 |
| ගම්මිරිස් තේ හැඳි | 1 |
| බිත්තර (තම්බා පොඩියට කපාගත්) | 1 |
| අල (පොඩියට කපා බැදගත්) | 100g |
| දුරු කොළ (කපාගත්) මේස හැඳි | 1/2 |
| පේස්ට්‍රි (පස්තෑල) | 1kg |
| බිත්තර | 1 |
| ලුණු රස අනුව | |

## සාදන ක්‍රමය

- භාජනයක් ලිප තබා තෙල් දමා රත්කර ලූනු, රම්පේ, අමුමිරිස්, කරාබුනැටි, කරදමුංගු, කුරුඳුපොතු, කරපිංචා දමා බැදෙන්නට හරින්න.
- රන්වන් පැහැයට බැදෙන විට සුදුලූනු, අමු ඉඟුරු, කරි කුඩු, කහ, ගම්මිරිස්, මිරිස්, ලුණු දමා තරමක් බැදගන්න.
- එයට බිලිං /තක්කාලි සහ මාළු දමා කළවම් කර මද ගින්නේ හිඳෙන්නට හරින්න.
- තැම්බුණාට පසු ලිපෙන් බා තම්බා පොඩියට කපාගත් බිත්තර හා බැදගත් අල, දුරු කොළ උඩින් දමාගන්න.
- පස්තෑල පේස්ට්‍රි මිශ්‍රණය ගෙන එය තුනී කර හතරැස් හැඩයට කපා බිත්තර සාරු ගා මැදට මාළු මිශ්‍රණය තබා දෙකට නවා පිරවුම එළියට නොඑන සේ ගෑරුප්පුවකින් ලස්සනට තදකොට බැදගන්න.



05 කොටස

ලංකාවේ දේශපාලනික කාන්තාවන් ගැන කියනවිට එකවර අපේ මතකයට එන්නේ සිරිමාවෝ බණ්ඩාරනායක මැතිනියයි. එතුමිය ගැන නොදන්නා කෙනෙක් නැත. නමුත් මේ කියන්නට යන්නේ එතුමිය ගැන බොහෝදෙනා නොදත් කතාය. ඒ කතා අපිට කියන්නට භාරගත්තේ ශ්‍රීලනිපයේ යකඩ ගැහැනිය ලෙස හැඳින්වූ කමලා රණතුංගය. දශක ගණනාවක් මැතිනිය සමීපයේ රැඳී සිටි ඕ වරෙක ඇගේ ආරක්ෂිකාව වූවාය. විටෙක පරිවාර කාන්තාව වූවාය. මැතිනිය වෙනුවෙන් දේශපාලන වේදිකාවේ කවි, විරිඳු කීවේ ඇයයි. චන්ද්‍රිකා, සුනේත්‍රා දියණියන් තරම්ම මැතිනිය සමීපයේ සිටියේද ඇයයි. දේශපාලනය කරන්නට ගොස් මැරයන් අතින් ගුටි කෑවත් ඇය මැතිනිය අතනොහැරියාය. අද පටන් ‘ධරණී’ වෙතින් ගෙන එන්නේ මේ යකඩ ගැහැනිය සහ මැතිනි ගැන ඈ කියන කතාවයි.

# කමලා අක්කා උඩ ගියා දැන් බිම වැටිලා මැරේවි

ශ්‍රී ලංකාවේ මෙන්ම ලෝකයේ ප්‍රථම කාන්තා අගමැති ලෙස සිරිමා බණ්ඩාරනායක මහත්මිය පත්වීම සමස්ත කාන්තා පරපුරේ ජයග්‍රහණයක් ලෙස ඇතැම් ජාත්‍යන්තර සංවිධාන පවා එකළ පිළිගත්හ. එනිසාම මැතිනියගේ නායකත්වයෙන් ඇරඹි ශ්‍රී.ල.නි.ප. කාන්තා සංවිධානයටද ඉහළ පිළිගැනීමක් ලැබිණි.

**“කාන්තා සමිතියේ සම ලේකම්වරියන් තුන්දෙනෙක් හිටියට මම තමයි ලේකම් ධුරයේ ගොඩක් වැඩ කළේ. ඒ නිසා ටික දවසක් යනකොට මම ප්‍රධාන ලේකම් තනතුරට පත්වුණා. ඉතින් මට පැවරුණ රාජකාරිය මම හරියටම කළා. ඔහොම ඉද්දි දවසක අරලියගහ මන්දිරයට එන්න කියලා මට පණිවිඩයක් එවලා තිබුණා. මමත් හනිකට සූදානම් වෙලා ගියා. මම හිතුවේ කාන්තා සමිතියේ මොකක්හරි වැඩක් කියලා. ඒ කාලේ දැන් වගේ තරුණ ගෑනු ළමයි ගමන් යනවා අඩුයි. ඒ නිසා මම ගමනක් යද්දි ඥාති දියණියක් එක්ක තමයි ගොඩක් වෙලාවට ගියේ. ඒ ළමයට වයස අවුරුදු 10ක් විතර ඇති. මම අරලියගහ මන්දිරයට යද්දි මැතිනිය හිටියා. මාව පිළිඅරගෙන ඉන්න ගමන් මාත් එක්ක ගියපු පොඩි ළමයට හුරතල් කතා කියලා විහිළු කළා. ඊටපස්සේ විශේෂ කාරණාවක් කියන්න තියෙනවා කියලා මට කතා කළා. මමත් බැලුවා මොකක්ද මේ විශේෂ කාරණාව කියලා.**

**‘චීනයේ තියෙන මැයි දිනයට සහභාගී වෙන්න යවන්න ඔයාව තෝරාගෙන තියෙනවා. යවන්න අම්මා කැමති වේවිද?’’ මැතිනිය ඇහුවා. මට ඒ කියපු දේ හිතාගන්නත් බැරිවුණා. ඒ කාලයේ අහස්යාත්‍රාවකින් යනවා කියන්නේ පරම්පරාවටම ආඩම්බරයක්. සතුටට අම්මගේ කැමැත්ත ගැනත් මට අමතක වුණා.**

**‘ප්‍රශ්නයක් නැහැ, අම්මගෙ කැමැත්ත ලැබෙනවා!’ කියලා මම කීවා. කෝකටත් ගෙදර ගිය ගමන් අම්මට විස්තරය කීවා. අම්මටත් සතුටුයි. කැමැත්තත් ලැබුණා.’’**

වර්තමානයේදී චීනය ලෝකයේ ආර්ථිකය අතින් දැවැන්තයෙකු වුවද 1960 දශකය වනවිට චීනය සංවර්ධනය කරා යමින් සිටි රටක් විය. දේශපාලනික වශයෙන් එකල ශ්‍රී ලංකාව මධ්‍යස්ථ රටක් ලෙස පෙනී සිටියද සමාජවාදී කඳවුර එනම් චීනය, රුසියාව වැනි රාජ්‍යයන්හි දේශපාලනය කෙරෙහි වැඩි නැඹුරුතාවයක් දැක්වීය. එහි ප්‍රතිඵලයක් ලෙස ජාත්‍යන්තර කම්කරු දිනය යෙදී තිබෙන මැයි 01 දින සැමරුම් උත්සවය සඳහා ශ්‍රී ලංකාවේ කාන්තා සංවිධානයටද ආරාධනා කර තිබිණි.

**“චීන සංචාරයට ශ්‍රී.ල.නි.ප. කාන්තා සංවිධානයේ ලේකම් හැටියට මාවත්, උප සභාපති තමාරා කුමාරි ඉලංගරත්න (අමාත්‍ය ටී.බී. ඉලංගරත්නගේ බිරිඳ) සහ භාණ්ඩාගාරික මානෙල් සිරිවර්ධන (අමාත්‍ය මයිකල් සිරිවර්ධනගේ බිරිඳ) තෝරාගන තිබුණා. මගේ මතකයේ හැටියට සංචාරය සතියක වගේ කාලයක් තිබුණා. මුලින්ම යන්න තිබුණේ චීනයේ අගනුවර පීකිං (වර්තමාන බීජිං) ගුවන්තොටුපොළට. කටුනායකින් තමයි අහස්යාත්‍රාවට නගින්න තිබුණේ. අපි යන දවසෙ පවුල්වල අයත් ගුන්තොටුපොළට ආවා. බෝධි පූජා තියලා භාරහාර වෙලා තමයි ගමන යන්න සූදානම් වුණේ. ගුවන්තොටුපොළේ දැන් වගේ නීතිරීති තද නැහැ. සාමාන්‍ය දුම්රිය ස්ථානයකට ඇතුළු වෙනවා වගේ ඕනම කෙනෙකුට ඇතුළුවෙන්න පුළුවන්. එහෙම ගිහින් ධාවන පථය අයිනෙ කට්ටිය ඉන්නවා. යන කෙනා විතරක් පයින් ගිහින් ගුවන්යානයට නගින්න ඕන. මගේ ගෙදර අයත් ආවා. අනිත් අයගේත් පවුල්වල අය ඇවිත් හිටියා.**

**ගොඩක් අය අණ්ඩ දාලා මහපු කලිසම් ඇඳගෙන හිටියා**

**අපි පීකිංවල ගුවන්තොටුපොළෙන් බහිද්දි චීන රජයෙන් අපිව පිළිගන්න කීපදෙනෙක් එවලා තිබුණා. මල් කළඹ අපිට දීලා බොහොම ආදරයෙන් පිළිගත්තා. අපට මග පෙන්වන්න චීන තරුණියක් පත් කරලා තිබුණා. ඒ ළමයා හරිම ලස්සනයි වගේම සිංහල භාෂාවත් හොඳට පුළුවන්. චීනෙ ගොඩක් අය ලංකාව ගැන කීවම ‘බණ්ඩාරනායකලගෙ රටද?’ කියලා අහනවා. අපිත් බණ්ඩාරනායකලගෙ කට්ටිය නිසා ආඩම්බරයි. අපේ සංචාරයේදී මැයි දින පෙළපාලි, සැමරුම්වලට සහභාගී වෙනවට අමතරව තවත් වැඩසටහන් කීපයක්ම අපි වෙනුවෙන් සූදානම් කරලා තිබුණා.’’**

වෙඩි බෙහෙත් තාක්ෂණය හා අලංකාර මල් වෙඩි තාක්ෂණය ලෝකයට හඳුන්වා දුන් රට ලෙස සළකන්නේ චීනයයි. මැයි දිනය වෙනුවෙන් එක් දිනක මල් වෙඩි සංදර්ශනයක්ද සූදානම් කර තිබිණි. ශ්‍රී ලංකාවෙන් ගිය දූත කණ්ඩායමට මල් වෙඩි සංදර්ශනය නැරඹීමේ අවස්ථාව සලසා තිබිණි. මල් වෙඩි සංදර්ශනයේ අත්දැකීම විස්තර කළ කමලා රණතුංග;

**“අපි ගමේදි දැකලා තිබුණේ රතිඤ්ඤාවලට අමතරව අහස්කුරු වගේ පොඩි පොඩි ගිනිකෙළි ගැන විතරයි. එහෙදි අපි දැකපු ගිනිකෙළි සංදර්ශනය ගැන අපට හිතාගන්නත් බැහැ. එයාලා අහසේ සුරපුරයක් මැව්වා. අපි ගිය කට්ටිය කතා කළේම කොහොමද මේ වගේ දේවල් කරන්නේ කියලා. කම්කරු රැලිය හොඳට තිබුණා. කොමියුනිස්ට් රටක් නිසා රතු පාටට තමයි ලොකු තැනක් දීලා තිබුණේ. ගොඩක්ම අපට බලන්න සූදානම් කරලා තිබුණේ කාන්තාවන්ගෙ ව්‍යාපාති, එයාලගෙ මැහුම් ගෙතුම්, ස්වයං රැකියා වගේ දේවල්. කාන්තාවන් වැඩ කරන ගොවිපොළවල් කීපයකටම ගියා. එතැනදී දැක්ක පොදු දේ තමයි එයාලා එකම වගේ කපු රෙද්දෙන් මහපු ඇඳුම් ඇඳගෙන හිටියේ. ගොඩක් අයගේ කලිසම් අණ්ඩ දලා මහලා හදපු පරණ කලිසම්. අපේ රටේ වුණා නම් විදේශිකයන් එද්දි අලුත් ඇඳුම් අන්දවලානෙ මුණගස්වන්නේ. නමුත් එයාලා එහෙම නැහැ. සැබෑ තත්ත්වය පෙන්නුවා. දශක 04කට විතර පස්සේ චීනෙට මම ගියා. එතකොට දැක්කෙ එයාලා දුක් විඳපු එකේ ප්‍රතිඵලය. හිතාගන්නත් බැරි වුණා මම කලින් දැකපු චීනෙද මේ කියලා. ඒ තරමට හැමදේම දියුණුයි. විනෝද වෙන්න ‘යැංසිකියැං’ ගඟේ බෝට්ටු සවාරියකුත් සූදානම් කරලා තිබුණා. ඒකත් හරිම විනෝදජනකයි.’’**

චීනය යනු තම රටේ මව් භාෂාව එනම් චීන භාෂාවට ප්‍රමුඛතාවය ලබාදී තිබෙන රටකි. ජාත්‍යන්තර භාෂාව වූ ඉංගීසි භාෂාවට එතරම් සැළකීමක් එහි නැත.

**“ඒ කාලයේ චීන ජාතිකයන්ගේ ඉංග්‍රීසි භාෂා දැනුම ඉතාම දුර්වලයි. ඒ නිසාම ගොඩක් වෙලාවට අපේ මගපෙන්වන චීන තරුණියගේ උදව් ගන්න සිදුවුණා. එක දවසක් හෝටලයේ කෑම ගනිද්දී ඒ තිබුණු කෑමවල මිරිස් සැරක් තිබුණෙ නැහැ. ඒ නිසා අපි අතර ඉඳපු කෙනෙක් එතැන ඉඳපු වේටර් කෙනෙකුට කතා කළා. ඒ ළමයත් බොහොම ලස්සනට ඇඳලා හිටියේ. එයාට කීවා Pepper (ගම්මිරිස් කුඩු) ටිකක් අරගෙන එන්න කියලා. ඒ ළමයත් ඔලුව වනලා ගියා. අපි දැන් ගම්මිරිස් කුඩු ගේනකම් බලාගෙන ඉන්නවා. ඒ ළමයා ටික වෙලාවකින් පත්තර මිටියකුත් අරගෙන ආවා. එයා හිතලා තියෙන්නෙ පත්තර ගේන්න කීවා කියලා. අංගචලනවලින් පැහැදිලි කරලා දුන්නට පස්සේ ගම්මිරිස් කුඩු ගෙනාවා. කොහොමින් කොහොමහරි සංචාරය බොහෝම සාර්ථකව කෙරුණා. අපිත් ගොඩක් දේවල් ඉගෙනගත්තා. ලංකාවට එන දිනයත් ළංවුණා. හරිම දුකයි. ඒත් ලංකාවට එන්න පිටත් වුණා.’’**

**ගම්මිරිස් ටිකක් ඉල්ලුවම වේටර් කෙනෙක් පත්තර මිටියක් උස්සගෙන ආවා**

කමලාගේ ආපසු ගුවන්ගමනද අපූරු එකක් විය. ගුවන්ගමන්වලදී බොහෝවිට මුහුණදෙන ප්‍රශ්නයක් වන්නේ Air Pocket නම් තත්ත්වයයි. එහිදී ගුවන්යානය එක්වරම අඩි සියදහස් ගණනක් පහලට යාම සිදුවේ. එවැනි අත්දැකීමකට කමලාද මුහුණ දුන්නාය.

**“ලංකා සීමාවට ඇතුළු වුණාට පස්සේ යානය එකපාරට පහලට වැටෙන්න ගත්තා. අපි ළඟ හිටපු ඇමරිකානු කාන්තාවක් බයවෙලා කෑගැහුවා. මටත් පොඩි බයක් හිතුණා. ඒත් හිත හදගත්තා මව්බිමටනේ වැටෙන්නෙ කියලා. ගුවන්තොටුපොළේදි පිළිගන්න මගේ පවුලේ අය වගේම ඇමතිවරුන් වන මයිකල් සිරිවර්ධන, ටී.බී.ඉලංගරත්න එහෙම ඇවිත් හිටියා. එතැනදී ගෙදර අය අපූරු කතාවක් කීවා. මාව ඇරලවන්න ආපු දවසෙ අපේ ඥාති පොඩි පුතෙකුත් ගුවන්තොටුපොළට ආවා. ගුවන්යානය ඉහළට යද්දී එයා කෑගහලා තිබුණා ‘කමලා අක්කා උඩට ගියා, දැන් වැටිලා මැරේවි’ කියලා.’’**

**සනත් ප්‍රියන්ත**




චීනයේ පැවති මැයි දින පෙළපාලිය

# නයින්ට කිරි පොවන වැඩේ මේ අවුරුද්දෙ ඉඳලා නොකර ඉමු



**ඔයා යන්න හැදුවොත් එයා පැනඩෝල් බීලා මැරෙනවා කියයි**

**එයාලා ඉර පෙන්නලා, හඳ කියලා කිව්වත් ඒක පිළිගන්නම වෙනවා**

අලුත් අවුරුද්දේ සාර්ථකත්වය හඹා යන ඔබ අනිවාර්යයෙන්ම සැළකිලිමත් විය යුතු අංගයක් ගැන කතා කිරීමයි අද ලිපියේ අරමුණ. අපේ ජීවිතයේ මුණගැහෙන මිනිස්සු කොට්ඨාස දෙකක් ඉන්නවා. ඒ තමයි හොඳ සහ නරක මිනිස්සු. සුබවාදීව හිතන, නිතරම අනිත් අයට උදව් කරන, අනිත් මිනිස්සුන්ගේ දුක දැනෙන **'හොඳ'** මිනිස්සු ළඟ හිටියත් පුදුම සනීපයි.

හැබැයි නිතරම අසුබවාදීව හිතන, මොන වැඩේ කරන්න ගියත් කකුලෙන් අදින, විෂ සහිත මිනිස්සු ළඟ ඉන්නකොට කිසිම යාදීමක් නෑ.

ඔබ කොච්චර හොඳ මිනිස්සු ආශ්‍රය කළත්, අනවශ්‍ය හිස් මිනිස්සුන්ව ඔබේ ජීවිතයෙන් අයින් කරන තාක් ඔබේ ජීවිතයේ මල්සමය උදාවෙන්නෙ නෑ. ඒ නිසා අන්න ඒ වගේ විෂ සහිත මිනිස්සු අඳුරගන්නේ කොහොමද සහ ඒ අයව ජීවිතෙන් ඈත් කරන්නෙ කොහොමද කියන කාරණය පිළිබඳව අද අපි කතා කරමු.

බොහොමයක් විෂ සහිත මිනිස්සු පෙන්වන එක්තරා පොදු ගුණාංගයක් තමයි අධික තරහව. ඕනෑම මනුස්සයෙක් ආතතියට පත් වුණහම තරහ යන එක සාමාන්‍ය දෙයක්. හැබැයි මේ තරහ නම් එහෙම එසේ මෙසේ එකක් නෙමෙයි. විෂ සහිත මිනිසුන් ගොඩක් වෙලාවට හේතුවක් ඇතුව හෝ නැතුව තරහ ගන්නවා. කිසි තේරුමක් නැති පොඩි දේවල්වලට පවා යක්ෂාවේශ වෙනවා.

ඒ නිසා එහෙම කෙනෙක් ආශ්‍රය කරද්දි කාලයක් යනකොට ඔවුන් මොක්කමහරි දේකට තරහ ගනීවි කියන බය නිසාම ඔබ ආතතියට පත්වෙන්න පටන් ගන්නවා. ඔබ කැමති දේවල් සියල්ල අතහැරලා ඔවුන් කියන විදිහට සහ ඔවුන් ආස කරන විදිහට ජීවත් වෙන්න පටන් ගන්නවා. කාලයක් යද්දි ඔබට ඔබවම නැතිවෙලා යනවා.

දැන් ඔබට හිතෙන්න පුළුවන් විෂ සහිත මිනිසුන් කියන්නේ හැමවෙලාවෙම තරහා ගිහින් කෑගහන අයට කියලා. අපොයි එහෙම නෑ. සමහර විෂ සහිත මිනිස්සු හිනාවෙවී කරටත් අතදාගෙන අපි ළඟම ඉන්න අය.

ළඟින් ඉන්න ගමන් හෙමින් සීරුවේ අපිටත් නොදැනෙන්න ඔවුන් අපේ කොන්ද කඩලා දානවා. හිතේ විෂ සහිත මිනිස්සු බොහෝවිට අන් අයගේ හිත රිදෙන විහිළු කරන්න හරි කැමතියි.

එකපාරක් දෙපාරක් නෙවෙයි දිගින් දිගටම ඔවුන්ගේ මෙවැනි කුරිරු විහිළු නිසා කාලයක් යද්දි ඔබව මානසිකව වැටෙන්න පටන් ගන්නවා. **"අම්මෝ මම හිතන්නේ ඔයාට ඌරෙක්ට වඩා කන්න පුළුවන්! පුදුම බඩක්නේ අනේ ඔයාට තියෙන්නේ! කමක් නෑ කොහොමත් ඈගේ සයිස් එකට කන්න ඕනනේ!"** මේ වගේ විහිළු තහළු නිසා කෙනෙක්ව මානසිකව වැටෙන්න ඒ තරම් දිග කාලයක් ගතවෙන්නෙ නෑ.

තවත් එක ගුණාංගයක් තමයි ඔවුන් ඉර පෙන්නලා **"අන්! අර තියෙන්නේ හඳ"** කියලා කිව්වත් ඔබට ඒක විශ්වාස කරන්න සිද්ධ වෙනවා. ඒ වගේම ඔවුන් ඔබෙන් ඉල්ලන දේවල් ඔබට කොහොමහරි කරලා දෙන්නත් සිද්ධ වෙනවා. එහෙම නැති වුණොත් එක්කෝ ඔබට හොඳටම බනීවි. එහෙම නැතිනම් ඔබ ඉදිරියේ හරිම දුක සහිත මූඩ් එකක් දාගෙන සෑහෙන කාලයක් ඔබව රිදවන්න උත්සාහ කරාවි.

බොහෝ අවස්ථාවලදී Toxic Person කෙනෙක් එහෙමත් නැත්නම් විෂ සහිත පුද්ගලයෙක් බිහිවන්නේ ඔහුගේ හෝ ඇයගේ තියෙන පෞරුෂත්වයේ දුර්වලතා (Insecurity) නිසයි. ඉතින් සමහර විෂ සහිත මිනිස්සු ඔවුන්ගේ පෞරුෂත්වයේ තියෙන දුර්වලතා වහගන්න නිරන්තරයෙන්ම ඔබ මත රඳා පවතින්න උත්සාහ කරනවා.

හදිස්සියේවත් ඔබට ඔහු හෝ ඇය සමඟ තිබෙන සම්බන්ධතාවය එපාවෙලා ඔයා එතැනින් එළියට යන්න තීරණය කළොත්, ඔවුන් ඔබ ඉදිරියේ වැඳ වැටිලා **"අනේ යන්න එපා! ඔයා ගියොත් මම පැනඩෝල් බීලා මැරෙනවා! මට ඔයා නැතුව ඉන්න බැහැ!"** කියලා අඬන්න පටන් ගනීවි. ඉන්නකම් ඔබව පහලට ඇද දාන්න, ඔබව මානසිකව වට්ටන්න උත්සාහ කළාට යනවා කිව්ව ගමන් හැමදේම හරි ඉක්මනට වෙනස් වෙනවා. ඔව්! හරිම පුදුමයි!

විෂ සහිත මිනිස්සුන්ගෙ Controlling Part එකත් සෑහෙන්න තියෙනවා. **"ඔයා ගවුම් අඳින්න එපා!"**, **"වෙන කිසිම පිරිමි ළමයෙක් එක්ක කතා කරන්න එපා!"**, **"Facebook, Instagram පාවිච්චි කරන්න එපා"**, **"ඔයා යන එන හැමතැනකම Photo ගහලා එවන්න මට"**, **"යාළුවෝ එක්ක කතා කරන හැම චැට් එකකම Screen Shots ගහලා එවන්න මට"** වාගේ වාක්‍ය (පදනමකින් තොරව) නිතර කියනවානම් ඔහු හෝ ඇය විෂ සහිත වෙන්න තියෙන සම්භාවිතාව සෑහෙන්න වැඩියි. ඒකට අපි කියනවා Emotionally Control කරනවා කියලා.

උදාහරණයක් විදිහට ඔයාගේ සහකරුවා ඔයාට කියනවා නම් **"මට ආදරෙයි නම් ඔය ජොබ් එකෙන් අයින් වෙන්න"**, **"ඔයාට මාව ඕනනම් ඔයාගේ පවුලෙන් ඈත් වෙන්න"** වගේ දේවල් ඒ තැන්වල තියෙන්නෙත් Emotional Controlling Level එකක්.

Toxic මිනිස්සු ගාව තියෙන තවත් භයානකම ගුණාංගයක් තමයි හැමවෙලාවෙම අන් අයව විනිශ්චයට ලක් කිරීම. ඔවුන් හැමවෙලාවෙම ඔබෙන් දේවල් ප්‍රශ්න කරනවා.

ඔබ කෙළින් උත්තරයක් දුන්නත් නැවත නැවතත් ප්‍රශ්න කරනවා. කිසිම වැරැද්දක් නොකර වුණත් ඔබට සෑහෙන කතන්දර අහගන්න සිද්ධ වෙනවා.

ඔයාගේ සහකරු හෝ සහකාරිය සමඟ විතරක් නෙමෙයි බැඳීමක් තිබෙන ඕනම කෙනෙක් සමඟ විෂ සහිත සම්බන්ධතාවයක් ඇති වෙන්න පුළුවන්. සාමාන්‍යයෙන් මිනිසුන්ගේ තිබෙන ගතිගුණ සහ ආකල්ප කාලයත් සමඟ වෙනස් වෙනවා.

නමුත් Toxic මිනිසුන්ගේ තිබෙන ගතිගුණ සහ ආකල්ප ඔවුන්ගේ පෞරුෂත්වයේම කොටසක්.

ඔබ ළඟම සිටිමින් ඇසුරු කරන සහකරු, නෑදෑයන් හෝ යහළුවන් විෂ සහිත නම් ඔවුන්ගේ බලපෑමෙන් ඔබ තුළ තිබෙන ධනාත්මක බව සම්පූර්ණයෙන්ම සෘණාත්මක බවකට හැරී පසුකාලීනව ඔබට විශාදය වැනි තත්ත්ව පවා හැදෙන්න පුළුවන්. විෂ සහිත මිනිසුන්ගේ තියෙන මෙම මනෝභාවයන් සහ හැසිරීම් Mental Therapies හරහා යථා තත්ත්වයට පත් කරන්න පුළුවන්. හැබැයි ඔවුන් යථාර්ථය සහ ඔවුන්ගේ මනස වැඩ කරන ආකාරය තේරුම්ගෙන ඒ සඳහා ඉදිරිපත් නොවන්නේ නම් ඔබ කළ යුත්තේ ඔවුන්ගෙන් ඉවත් වීමයි. නැතහොත් විනාශයට පත් වන්නේ ඔබමයි.

ඔබත් විෂ සහිත සම්බන්ධතාවක සිරවී සිටිනවා යැයි ඔබට හැඟෙනවානම් හෝ තනිව ඉන් මිදීමට නොහැකියැයි සිතනවා නම් හෝ ඔබත් විෂ සහිත පුද්ගලයකු යැයි හැඟේ නම් ඔබ කළ යුත්තේ ඉක්මනින්ම Counselor හෝ Psychologist කෙනෙකු මුණගැසීමයි.

2022 වසර සර්වප්‍රකාරයෙන්ම සාර්ථක වෙන්න නම් පිළිපැදිය යුතු නීතියක් ගැනත් අන්තිමට කියලා දෙන්නම්.

ඒ තමයි කවදාවත්, තිබහක් ඇති වූ පමණින් වස පානය කරන්න යන්න එපා! ඒ වගේම තනිකමක් දැනුණු පමණින්, විෂ සහිත මිනිසුන් ඇසුරු කරන්න එපා!



හසින්ත හේවාවසම්



# කුජ මාරුවෙන් ලග්න පහකට වාසනාව උතුරයි





## මානසික පීඩනයෙන් මුදවන අපූරු යෝග ආසනයක්

උදේට ඇඳෙන් බහින්න බැරි යටි පතුලේ වේදනාව නිට්ටාවට සුව කරන්න පුළුවන්

බලවත් යෝග පොකුරක් ඇතිව උපන් පුංචි මිනිසාගේ කට ඇති පුතා **ගාල්ලේ දහනායක**

සියලු දොස් නසන පොකුරු යෝග පිරුණු බලවත් නැකතක් උදා වේ

ලග්න පලාපල ගොවි නැකැත් සමග විශේෂාංග රැසක්

වාස්තුවත් ජ්‍යොතිෂයත් එකක් කියා බොර දියේ මාළු අල්ලන අය ඉන්නවා

කේන්ද්‍රයේ 'රාජයෝග' තිබූ පමණින් රජ වෙන්න හදන්න එපා

ජන: 06

තරුව

දැන් වෙළෙඳපොළේ




# කවුරුහරි ඔයා ලස්සනයි කිව්වට කමක් නෑ හැබැයි ටෝන් එක අවුල්ද කියලා බලන්න



මාතර මූලස්ථාන පොලිසියේ ළමා හා කාන්තා කාර්යාංශයේ ස්ථානාධිපතිනි ප්‍රධාන පොලිස් පරීක්ෂිකා වරුණි බෝගහවත්ත

බසයට නැගුනු සංදීපනීත් භාග්‍යාත් ආගිය තොරතුරු කතා කරන්නට වූයේ දෙදෙනා කාලයකින් මුණ නොගැසුණු නිසාය. තම පාසල් මිතුරු මිතුරියන් ගැනත්, පාසලේ වූ රසවත් සිදුවීම් ගැනත් භාග්‍යා මතක් කරද්දී සංදීපනීද මනසින් ඒ කාලයට පියමැන්නාය.

බසය මගීන්ගෙන් පිරී යමින් තිබුණද දෙමිතුරියෝ සිටියේ පාසල් මතකයේ උත්කර්ෂය විඳිමිනි. තවත් ටික වෙලාවක් ගතවුණි. සංදීපනීට දැනුණේ තමා පිටුපසින් සිටින අයෙකු තම සිරුරට දැඩිව තෙරපෙන බවයි. ඒ මදිවාට ඔහුගේ අතින් තම ඉන පෙදෙස ස්පර්ශ කරනු ඇයට දැනුණාය. ඇය ක්ෂණිකවම පිටුපසට හැරී ඔහු දෙස රවා බැලුවාය.

**"මේ ජැක්සන් අයියේ ටිකක් එහාට වෙලා යනවද?"**

සංදීපනී තරමක හඬින් කීවේ රැවීමෙන් පලක් නැතිබව දැනුණ නිසාය. මිතුරියද ළඟ සිටින හෙයින් ඇයට බියක් දැනුණේ නැත. තම සිරුරට තෙරපෙමින් සිටි පුද්ගලයා අත ඉවතට ගත්තද ඇය කී දේ නොඇසුනා සේ සිටියේය. සංදීපනීත්, භාග්‍යාත් රවමින් ගස්සමින් ඔහු දෙස බලද්දී ටික වෙලාවකින් ඔහු ඉවතට ගියේ ඇණුම්පදයක් කියමිනි.

**"ඇගේ නොගෑවී යන්න ඕනනම් කාර් එකක යන්නයි තිබුණේ... කුමාරිහාමිලනේ..."**

**"අනේ මේ ජැකී අන්කල් ඔයා කාරෙකක යන්නකෝ... එතකොට මේ බස් එකේ යන කිසිම කාන්තාවකට කරදරයක් නෑ."**

භාග්‍යා උස් හඬින් කීවාය. බසයේ සිටින අයටද එම කතාව ඇසුණාත්, ඔවුන් සිදුවුණ දේ සියැසින්ම දැක්කත් ඊට විරුද්ධව වචනයක් හෝ කතා කරන්නට නම් ඉදිරිපත් වූයේ නැත.

**"මටත් ගිය සතියේ ඔහොමම වැඩක් වුණා. ෆයිල් එකක් දෙද්දී අපේ බොසා ඕනෑකමින් මගේ අත අතගෑවා වගේ දැනුණා. වැරදීමකින් එහෙම වෙන්නැති කියලා හිතෙද්දිම, මෙන්න මේකා ඇස් යටින් බලලා 'භාගි අද හරිම ලස්සනයි, ඔයාව දැක්කම පිස්සු හැදෙනවනේ' කියපි. ඇත්තමයි මට මාර ලැජ්ජා හිතුනා."**

භාග්‍යා, සංදීපනීගේ කනට කර කීවාය. දෙමිතුරියෝ බසයෙන් බසිනාතුරුම මාතෘකාව වූයේ එවන් දේය. මෙවැනි කාරණා ඉවසා සිටින්නන් සිටියද, ඒවාට එරෙහිව ගත හැකි නීතිමය පියවරයන් තිබේ. විටෙක ලැජ්ජාව නිසා ඇතැම් කතා එළියට එන්නේ නැත. එළියට එන ඇතැම් කතා නිසාද විටෙක අපහසුතාවයට පත්වන්නේ කාන්තාවම යැයි මතයක් ඇතත් තමාට සිදුවන ඕනෑම ආකාරයක ලිංගික හිංසනයක් සම්බන්ධයෙන්, නීතිමය ආරක්ෂාවක් ඇයට තිබේ.

පසුගියද ආධුනික පොලිස් කොස්තාපල්වරියකට, ගන්දර පොලිස් ස්ථානාධිපතිවරයාගෙන් වූ අකටයුත්තද එවන් එකකි. ඔහු පොලිස් කොස්තාපල්වරියට අතවරයක් සිදු කරන්නේ තම නිල නිවසේදී වන අතර, ඔහු ඇයව තම අරමුණු උදෙසා නතු කරගන්නට කාලයක සිටම සැලසුම් කර තිබූ බව කියැවේ. විවිධ කෑමබීම ලබාදෙමින්, ඇය වෙත විශේෂ සැළකිල්ලක් දක්වන බව පෙන්වමින් ඒ අරමුණ වෙත ළඟාවීමට උත්සුක වුවත්, ඉන් පලක් නොවූ තැන ඔහු භාවිතා කළේ තම නිල බලයයි.

**බස් එකේදි ජැක් ගහන්න එනවානම් කෙළින්ම ඔහුගේ ඇස් දිහා බලන්න**

දිනක ඉකුත් දෙසැම්බර් විසිහතර වනදය. පාන්දර හයයි තිහට පමණ නිල ඇඳුමින් සැරසුණු කොස්තාපල්වරිය තම ඇඳුම් කිහිපයක් වේලෙන්නට වැලට දැමුවාය. ස්ථානාධිපතිවරයා කොස්තාපල්වරියට දුරකතන ඇමතුමක් දී තම නිල නිවසට එන්නැයි කියන්නේ මේ වෙලාවේය. ඒ කතා කරන්නේ රාජකාරි අවශ්‍යතාවයකට යැයි සිතූ ඇය එහි ගියාය. ඔහු ඇතුළට එන ලෙස ඇයට අතින් සංඥා කළේය. ඇය ඇතුළට ගිය සැණින් පොලිස් ස්ථානාධිපතිවරයා කළේ දොර වසා දැමීමයි. අනතුරුව ඔහු ඇයව වැළඳගන්නට උත්සුක වෙද්දී ඇය බිය වූවාය. උමතු වූවෙකු මෙන් ස්ථානාධිපතිවරයා තම උඩුකය නිරාවරණය කර අතවර කරද්දී, කොස්තාපල්වරිය කියන ලද්දේ තමා අසනීපයෙන් පසුවන බැවින් කරදර නොකරනා ලෙසය. ඇය එම ඉල්ලීම කළේ හඬා වැටෙමිනි. අධිකරණ වෛද්‍ය වාර්තාවට අනුවද ඇය ලිංගික අපයෝජනයකට ලක්ව ඇතැයි සඳහන්ය.

මෙම සිදුවීමද රහසේ යටපත් වීමට තිබූ කාරණයක් නමුදු, කොස්තාපල්වරිය මෙම සිදුවීම තම පෙම්වතාට පැවසීමෙන් පසු, පොලිසියේ වගකිව යුතු අංශ වෙත ඔවුන් මේ ගැන දැනුම් දී තිබේ. සැකකරු එදිනම අත්අඩංගුවට ගත් අතර, ඒ පිළිබඳව පරීක්ෂණ සිදු කරන්නට පැවරුණේ මාතර මූලස්ථාන පොලිසියේ ළමා හා කාන්තා කාර්යාංශයේ ස්ථානාධිපතිනි ප්‍රධාන පොලිස් පරීක්ෂිකා වරුණි බෝගහවත්තටය. ඒ මාතර කොට්ඨාස භාර ජ්‍යේෂ්ඨ පොලිස් අධිකාරී නිශාන් ද සොයිසාගේ නියෝගයකට අනුවය.

දැන් මේ කියන පොලිස් ස්ථානාධිපතිවරයා සිටින්නේ රක්ෂිත බන්ධනාගාරගතවය. ඔහුට එරෙහිව නැගී ඇති චෝදනා වන්නේ ආධුනික පොලිස් කොස්තාපල්වරියක අයුතු ලෙස සිරකර තබා ගනිමින් බරපතළ ලිංගික අපයෝජනයක් සිදුකිරීමයි. පොලිස් කොස්තාපල්වරිය දැඩි මානසික පීඩනයකින් පසුවන බවද, පොලිසිය අධිකරණයට පවසා තිබේ.

අතවර, බරපතළ ලිංගික අපයෝජන හා ස්ත්‍රී දූෂණයක් වන වරදක් සිදුවන අවස්ථා ගැන ප්‍රධාන පොලිස් පරීක්ෂිකා වරුණි බෝගහවත්තගෙන් අප විමසුවේ ඉහත කරුණු සැළකිල්ලට ගනිමිනි.

**"1995 අංක 22 දරණ දණ්ඩ නීති සංග්‍රහය (සංශෝධන) පනතට අනුව, වැඩ කරන ස්ථානයක බලය දරණ තැනැත්තෙකු විසින්, එම ස්ථානයේදී හෝ වෙනත් ස්ථානයකදී වචනයෙන් හෝ ක්‍රියාවෙන් තම සේවිකාවකට කරනු ලබන 'අනනුඥාත' ලිංගික ප්‍රයත්නයකදී ලිංගික අතවර කිරීමේ වරද සම්පූර්ණ වෙනවා.**

**උදාහරණයක් විදියට ආයතනයක බලතල දරණ පුද්ගලයෙක්, 'ඔයා හරි ලස්සනයිනේ' කියනකොට ඒ වචන උච්චාරණය කරන ආකාරය තුළ කාන්තාවන්ට යම් අපහසුවක්, ලැජ්ජාවක් ඇති විය හැකියි. ඒ වෙනස තුළ අතවරය කියන කාරණාව සම්පූර්ණ වෙනවා. තවත් දවසක ඇඟිල්ලේ කොණක් ස්පර්ශ කරමින් ඉඟි ලබාදෙනවා. එහෙම නැත්නම් අත තදින් ස්පර්ශ කරමින් තමන්ගේ කැමැත්ත පෙන්වනවා. තවත් වෙලාවක තොලපිට පෙරලලා මට ඔයාව දකිද්දි මෙහෙම වෙනවා, අරහෙම වෙනවා කියලා කියනවා, බස් රථවලදී අශෝභන ලෙස සිරුරට හේත්තුවීම (ජැක් ගැසීම), ස්පර්ශ කිරීම මේ සියල්ල 'අතවර' යටතටයි ගැනෙන්නේ."**

බරපතළ ලිංගික අපයෝජනයකදී, ශරීරයේ ඕනෑම අවයවයක්, විවරයක් භාවිතා කරමින් ලිංගික තෘප්තියක් ලැබීම එම වරද සම්පූර්ණ වීමට හේතු වේ. එහිදී අත, මුඛය, ගුද මාර්ගය, දෙකකුල් ආදී අවයව භාවිතයෙන් කාන්තාවගේ කැමැත්තකින් තොරව ලිංගික තෘප්තියක් ලැබීම මේ වරද යටතට ගැනේ.

**"ස්ත්‍රී දූෂණයක් කියලා අපි කියන්නේ කාන්තාවගේ කැමැත්තන් තොරව යෝනි මාර්ගය තුළට පුරුෂ ලිංගය ප්‍රවේශ කරවීමයි."**

**බරපතළ ස්ත්‍රී දූෂණ සම්බන්ධයෙන්ද වසර විස්සක සිර දඬුවම් නියම කළ හැකිය.**

වරුණි බෝගහවත්ත මහත්මිය පෙන්වා දෙන්නේ ලිංගික අතවරයකදී (දණ්ඩ නීති සංග්‍රහයේ 345 වගන්තියට අනුව) අඩන්තේට්ටම් කිරීමෙන් හෝ සාපරාධී බලහත්කාරය පෑමෙන් යම් තැනැත්තෙකුට ලිංගික අතවර කරන හෝ වචනයෙන් හෝ ක්‍රියාවෙන් ලිංගික අතවරයක් කරන තැනැත්තෙකුට 'ලිංගික අතවර' කිරීමේ වරද සම්පූර්ණ වන බවයි. අදාළ පුද්ගලයාට වසර පහක සිර දඬුවමක් හෝ දඩයක්, නොඑසේනම් මේ දඬුවම් හා දඩය යන දෙකටම යටත් කළ හැකිය. තවද එම වරද සිදුකරන ලද තැනැත්තාට සිදුවන හානිය අනුව වන්දි මුදලක්ද ගෙවීමට අධිකරණය නියෝග කරන අවස්ථා ඇත. බරපතළ ස්ත්‍රී දූෂණ සම්බන්ධයෙන්ද වසර විස්සක සිර දඬුවම් නියම කළ හැකිය. මීට අමතරව වයස 16ට අඩු දරුවන් අකමැත්තෙන් නොව කැමැත්තෙන් වුවද ලිංගික කාර්යය සඳහා යොදවා ගැනීම, පැහැර ගැනීම නීතියෙන් බරපතළ වරදකි.

විශේෂයෙන්ම කාන්තාවන් වන ඔබට, මේ අතවරයන්ගෙන් බේරී සිටීමට සියුම් නුවණක් වාගේම ඊට එරෙහිව නැගී සිටීමේ ශක්තියද වැදගත්ය.

**"බස් එකේදී කෙනෙක් ඇඟට එනවානම්, කෙළින්ම ඒ පුද්ගලයාගේ ඇස් දෙක දිහා බලන්න. දෙපාරක් එහෙම බලද්දි ඔහු අදහස් කරන දේ වෙනස් කරගන්න ඔහුට සිදුවෙනවා. කතා කරන්න ඕන තැනදී කතා කරන්න. කාන්තාවට නීතියේ පිහිට ලබන්න අවස්ථාව තිබෙනවා."**

ඇය කියන්නේ තමාට සිදුවන කුමන ආකාරයේ අකටයුත්තක් වෙනුවෙන් වුව නීතියේ පිහිටක් ඇති බවය. ළමා හා කාන්තා කාර්යාංශය මෙන්ම විවිධ උපකාරක සේවා ඒ සඳහා ඇති අතර, අවශ්‍ය වන්නේ තමාට වන අසාධාරණය සම්බන්ධයෙන් ඉදිරියට ඒමේ ධෛර්යයයි.

දීපා වසන්ති එදිරිසිංහ



Skin Care with Malinga

# දෙවියන් ඉදිරියට යන්න කලින් ඉඹිනවා
# දාඩිය ගඳනම් මරනවා

**"ගැහැනියගේ සුවඳ සහ මනුෂ්‍යත්වයේ සුවඳ කියන්නේ පුදුමාකාර සුවඳක්. කෑදර හිතෙන දිව්‍යමය සුවඳක්."**

මේ පැට්‍රික් සස්කයින්ඩ්ගේ 'Perfume' කියන පොතෙන් උපුටාගත්තු කොටසක්. ඇත්ත. හැම මනුස්සයෙකුටම ආවේණික වෙච්ච සුවඳක් තියෙනවා. ඒක විද්‍යාත්මකව පැහැදිලි කරන්න පුළුවන් කාරණාවක්. අපිට නොදැනුණාට ඒක හරිම ප්‍රසන්න සියුම් සුවඳක්ලු.

මේ කතාවේ ප්‍රධාන චරිතය ග්‍රොනෙවි කියන පුද්ගලයාට අමුතුම හැකියාවක් තියෙනවා. ඒක තමයි මිනිස්සුන්ට ආවේණික ඒ සුවඳ වෙන්කරලා අඳුනගන්න පුළුවන්කම. ඉතින් ඔහු කාන්තාවන් කිහිපදෙනෙක් මරලා ඔවුන්ගේ සුවඳ උකහාගෙන සුවඳ විලවුන් කුප්පියක් නිර්මාණය කරනවා.

දැන් හිතන්නකෝ බොහොම නරක විදියට දහඩිය ගඳ හමන කෙනෙක් ළඟට ග්‍රොනෙවි ආවොත් මොනවා වෙයිද? සමහරවිට මනුස්සයාට කලන්තේ හැදෙන්න වුණත් පුළුවන්. මේ වගේ කෙනෙක්ගෙන් ගැලවෙන්න නම් දහඩිය ගඳ හොඳයි තමයි. ඒත් හිතන්නකෝ ඔයා ආදරේ කරන කෙනෙක්ට ඔයාගේ ළඟ දඩිය ගඳයි කියලා දැනුණොත්? ඒ මතකය එයාගේ හිතේ අප්‍රසන්න මතකයක් ඉතිරි කරන්නත් බැරි නෑ.

බිරිඳගේ සැමියාගේ දහඩිය ගඳ නිසා විවාහ ජීවිතය ඇතුළේ ප්‍රශ්න ඇතිකරගත්තු, දික්කසාදය දක්වා ගියපු සිද්ධි පවා වාර්තා වෙනවා. ගොඩක්දෙනා නොසළකා හැරියත් මේවා බොහොම සංකීර්ණ විදියට කෙනෙක්ගේ ජීවිතේට බලපාන්න පුළුවන් දේවල් කියන එක නොකියා බැහැ.ඒ කාලේ අය නම් හරි අමාරුවෙන් අනුන්ගේ දහඩිය දුගඳ ඉවසගෙන හිටියා කියලා දැනගන්න කිසිම සාක්ෂියක් නැහැ. පැරණි යුරෝපයේ ආගමික චාරිත්‍ර අනුව හැම පුද්ගලයෙක්ම දෙවියන් ඉදිරියේ තමන්ගේ ශරීරයෙන් හමන දහඩිය දුගඳ වසන් කරන්න ඕනැලු. දේව පිළිම ඉස්සරහට යන්න කලින් සුවඳ දුම් සාරය අල්ලලා ඒ කෙනාව ඉඹලා බලනවලු. සුවඳ දුම් ඇල්ලුවට පස්සෙත් දහඩිය ගඳ එනවා නම් ඒ කෙනාගේ ආත්මය අපිරිසිදුයි කියලා ඒ කෙනාව මරණයට පත්කරනවලු. ඉතින් අද කාලේ ඒ කාලේ වගේ දඩිය ගඳ ගැහුවා කියලා මරන්නෙ නැති වුණාට, ඒ නිසා ලැජ්ජාවට පත්වෙන අය නම් බොහොමයි. මේ කියන්න යන්නේ අන්න ඒ හතර විලිලැජ්ජාවෙන් ගැලවෙන විදියක් ගැන.

අපිට දඩිය දන්නේ ඇයි කියන කාරණාව ගැන මුලින්ම බලමු. දහඩිය කියන්නේ අපේ ශරීරයෙන් පිටවෙන බහිස්‍රාවීය ද්‍රව්‍යයක්. අපේ ශරීරය ඕනෑවට වඩා උණුසුම් වුණහම සිරුරේ සිසිල් බව රැකගන්න යාන්ත්‍රණයක් විදියට දහඩිය ග්‍රන්ථිවලින් දහඩිය පිටවෙනවා. සාමාන්‍ය ප්‍රමාණයේ මනුස්සයෙකුගේ ඇඟෙන් දවසකට දහඩිය ගැලුම් 2-3ක් වුණත් බැහැර වෙන්න පුළුවන්ලු.

**ඩියෝඩ්‍රන්ට්, පර්ෆියුම් වුණත් ආලේප කරන්න ඕනේ ශරීරය පිරිසිදු කළාට පසුව විතරයි**

අපේ ඇඟේ දහඩිය ග්‍රන්ථි කිහිපයක්ම තියෙනවා. ලිංගේන්ද්‍රිය සහ කිහිල්ල ප්‍රදේශයේ ගැඹුරට පැතිරුණු රෝම කූප තියෙන නිසා ඒ ප්‍රදේශයේ තියෙන දහඩිය ග්‍රන්ථිවලින් වැඩිපුර දහඩිය පිටවෙනවා. ඔහොම පිටවෙන දහඩියට කිසිම ගඳක් සුවඳක් නැහැ. ශරීරය මතුපිට ජීවත්වෙන බැක්ටීරියා එක්ක සංයෝජනය වුණාට පස්සේ තමයි දහඩියට යම් ගන්ධයක් එක්වෙන්නේ. අර කලින් කිව් ප්‍රදේශවල ජීවත්වෙන බැක්ටීරියා ප්‍රමාණය වැඩියි. ඉතින් ඒ නිසා ලිංගාශ්‍රිත ප්‍රදේශයේ සහ කිහිල්ල ප්‍රදේශයේ හමන දහඩිය දුගඳ වඩාත් තීව්‍ර වෙන්න ඉඩ තියෙනවා.

මේකට බලපාන ප්‍රධානම කාරණාවක් තමයි අපිරිසිදුකම. ඉස්සර ඊජිප්තුවේ අයට ආගමික හා සමාජ චාරිත්‍රයක් විදියට දිනපතාම දවසට තුන්වරක් ස්නානය කිරීම අනිවාර්යයිලු. දිනපතාම තුන්වරක් ස්නානය කරන්න කියලා නම් අපි ඔයාලට කියන්නේ නැහැ. ඒත් දවසට දෙපාරක්වත් ශරීරය පිරිසිදු කරන්න පුළුවන් නම් මේ ප්‍රශ්නය බොහෝදුරට විසඳගන්න පුළුවන්.

ඒ වගේම කිහිල්ල සහ ලිංගේන්ද්‍රිය ප්‍රදේශයේ තියෙන අනවශ්‍ය රෝම ඉවත් කරලා ඒ තැන් නිතරම පිරිසිදුව වියළිව තියාගන්න එකෙනුත් දහඩිය දුගඳ යම්තාක් දුරට පාලනය කරගන්න පුළුවන්.

ඒ වගේම සිල්ක්, නයිලෝන් වගේ දහඩිය උරා නොගන්න යටඇඳුම් වෙනුවට නිතරම කපු යටඇඳුම් භාවිතා කරන්න කියන එකත් කියන්න ඕනේ.

ඊළඟ වැදගත්ම දේ අපේ ආහාර රටාව. දවසකට අවශ්‍ය කරන වතුර ටික, එළවලු, පළා ටික ඇඟට වැටෙන්නේ නැතිකොට විටමින් ඌණතාව, මළබද්ධය වගේ ප්‍රශ්න ඇතිවෙලා දහඩිය දුගඳ වෙන්න බලපානවා.

ඒ වගේම මානසික ආතතිය, තයිරොක්සින් ග්‍රන්ථිය ආශ්‍රිත ගැටළු, අධික ස්ථූලතාවය, දියවැඩියාව ඇතුළු ශරීර අභ්‍යන්තර හේතු නිසාත් කෙනෙක්ගේ දහඩිය ආසාමාන්‍ය ලෙස දුගඳ වෙන්න පුළුවන්.

සමහරු ඩියෝඩ්‍රන්ට් භාවිතා කරලා දහඩිය ගඳ පාලනය කරන්න හදනවා. දහඩිය ගඳ දැනෙන්න ගත්තු හැටියේ එහෙන් මෙහෙන් පර්ෆියුම් ටිකක් ස්ප්‍රේ කරන නෝනා මහත්තුරුත් ඉන්නවා. ඒවා ඉතින් තාවකාලික පැලැස්තර විතරයි.

අනික ඩියෝඩ්‍රන්ට්, පර්ෆියුම් වුණත් ආලේප කරන්න ඕනේ ශරීරය පිරිසිදු කළාට පසුව විතරයි. ශරීරයේ දහඩිය තියෙද්දිම ඕවා ගාන්න ගියොත් වැඩේ දෙල් වෙලා අර තිබ්බ දුර්ගන්ධය දෙගුණ තෙගුණ වෙන්නත් බැරි නැහැ.

ඒ දේවල් වෙනුවට දහඩිය දුගඳ නිට්ටාවටම අඩු කරගන්න ගෙදරදී කරගන්න පුළුවන් සත්කාර කිහිපයක් දැන් බලමු.

**දවසට දෙපාරක්වත් ශරීරය පිරිසිදු කරන්න පුළුවන් නම් මේ ප්‍රශ්නය බොහෝදුරට විසඳගන්න පුළුවන්**

මඳ උණුසුම් ජලය පිරුණු වතුර බාල්දියකට ලුණු ස්වල්පයක් දාලා ඒ වතුරෙන් ඇඟ සෝදන්න. ඊටපස්සේ ජලය නොපිසද සුළඟින් වේළෙන්න අරින්න.

සුදු හඳුන්, සුවඳ කොට්ටන්, වෙනිවැල්ගැට, ලොත්සුඹුළු, අමු කහ, කොහොඹ දළු හොඳට මිශ්‍ර කරලා මුළු ශරීරයේම ආලේප කරලා විනාඩි 30ක් විතර ඉඳලා හෝදලා අරින්න. මෙන්න මේ සත්කාරය සතියට දවස් දෙකක් විතර කරගන්න පුළුවන් නම් හොඳයි.

දහඩිය දුගඳ නැති කරගන්න ඊජිප්තුවේ ක්ලියෝපැට්‍රා රැජිනිය මානෙල්, රෝස, කුරුඳු වගේ සුවඳැති ශාකවලින් ලබාගත්තු තෙල් ආලේප කරලා තියෙනවා. ඉතින් කරන්න පුළුවන් නම් මේ සත්කාර දැන් කාලෙටත් වලංගුයි.

ඇපල් විනාකිරි කෝප්ප එකකට වතුර මිශ්‍ර කරලා රාත්‍රී නින්දට කලින් වැඩිපුර දහඩිය දන තැන්වල ආලේප කරලා පසුදින සෝදහරින්න.

තක්කාලි යුෂ, ලෙමන් යුෂ සහ ඇපල් විනාකිරි එකට මිශ්‍ර කරලා කිහිල්ල ප්‍රදේශයේ ආලේප කරලා විනාඩි පහළොවක් විතර තියලා පස්සේ සීතල වතුරෙන් සෝදලා හරින්න.

සේපාලිකා මල්, වද මල්, මධාරා පොතු, කොහොඹ කොළ, නිදිකුම්බා වගේ ඖෂධ තැම්බූ ජලයෙන් නිතරම ශරීරය සෝදන එකත් ගුණදායකයි.

ඒ වගේම මේ ලිපියෙන්ම තව කාරණාවක් කියන්න ඕනේ. දහඩිය දුගඳ සහ අධිකව දහඩිය දැමීම කියන්නේ කාරණා දෙකක්. සමකාසන්න රටක ජීවත්වෙන නිසා තරමක් අධිකව දහඩිය දන එක අපිට තියා සක්කරයාගේ පුතා වයිමටවත් නවත්තන්න බැරි වෙයි. හැබැයි අධික ලෙස දහඩිය දැම්ම පලියට දහඩිය දුගඳ ඇතිවෙනවා කියන්න බැහැ.

හැබැයි තමන්ගේ එදිනෙදා වැඩකටයුතු ටික කරගන්න බැරි තරමට දහඩිය දන අය ඉන්නවා. ගොඩක් වෙලාවට එහෙම වෙන්නේ ශරීර අභ්‍යන්තර හේතු නිසා වෙන්න වෙන්න පුළුවන්. වෛද්‍යවරයෙක් වෙත යොමු වෙන්න කියන එක තමයි එහෙම කෙනෙක්ට දෙන්න තියෙන හොඳම උපදේශය.

අනික දහඩිය දුගඳ වුණත් මේ කිසිම දේකින් පාලනය වෙන්නේ නැතිනම් වෛද්‍යවරයෙක් හරි පිළිගත් රූපලාවණ්‍යය උපදේශකවරයෙකු හරි මුණගැහෙන්න කියන එකත් මතක් කරන්න ඕනේ.




ප්‍රවීණ රූපලාවන්‍ය උපදේශක
මාලිංග ප්‍රනාන්දු
(Personal Grooming
fernando.malinga

නදීෂා නිර්මාණි

හිතේ හයියෙන් ජීවිතය දිනන්න කැමති කොයිකාටත් අතහිත දෙන්න ‘ධරණී’ හැමදාමත් කැමතියි. නිකරුණේ ගෙවිලා යන කාලය තමන්ගේම කියලා ස්වයං රැකියාවක් වෙනුවෙන් යොදවන්න කැමති කාන්තාවන්ට ගෙදරදී පහසුවෙන්ම අත්කම් නිර්මාණ කරන හැටි පියවරෙන් පියවර කියලා දෙන්න අපි හිතුවේ ඒකයි. කඩදාසි, මැටි, පොල්කටු, රෙදි වගේ විවිධ දේ වලින් විවිධ නිර්මාණ කරන විදිය ගැන සහ ඒවා වෙළඳපොළ වෙත යොමුකරන ආකාරය ගැන මේ ලිපි මාලාව හරහා ඔබව දැනුවත් කරනවා. ඉතින් ස්වයං රැකියාවක් වශයෙන් කෘත්‍රිම අරලියා මල් නිර්මාණය කරගන්නා හැටි තමයි අද අපි කියලා දෙන්නේ.

## ස්වයං රැකියා

**පාරම්පරික උඩරට ඔසරිය අඳින ගොඩාක් මනාලියන් අරලියවලින් හදන මල් කළඹට ලොකු ප්‍රියතාවයක් දක්වනවා. ඒ නිසා ඔවුන්ගෙනුත් කෘතිම අරලිය මල්වලට ඉල්ලුමක් තියෙනවා**















# බඹරු නොඑන මලක් හදා පොහොසතෙක් වෙන මග

පිවිතුරු බවේ වගේම චාම් බවේත් සංකේතයක් විදියට හඳුන්වන මලක් තමයි අරලිය මල.

හැබැයි අරලිය මලට රේණු නැති නිසා මේ මලෙන් රොන් ගන්න බඹරු එන්නේ නැහැ. ඒ නිසා බුදුන්ට පූජා කරන්න මේ පිවිතුරු මල බොහොම පංකාදුයි කියලා බොහෝ අය කියනවා.

මේ කාරණාව නිසාදෝ ආගමික කටයුතුවලට වැඩි වශයෙන් අරලිය මල යොදාගන්නවා.

ඒ නිසාම මේ මල **‘පන්සල් මල’** කියලත් හඳුන්වනවා. ඒ වගේම ඉංග්‍රීසියෙන් **‘ෆ්‍රැන්ජිපානි’** කියලා කියන්නෙත් අරලිය මලට.

අපේ සංස්කෘතියටත් බොහොම සමීප මලක් විදියට සැළකෙන නිසා නිවෙස්වල සහ උත්සව ශාලාවල අමුත්තන් පිළිගන්න ජල බඳුන්වලටත් අරලිය මල් දානවා. ඒ වගේම වාස්තු විද්‍යාවේ කියැවෙන විදියට අරලිය මල කියන්නේ ධනය ආකර්ශනය කර දෙන මලක්ලු.

ඒ නිසා අරලිය මලක් ගෙදර හදලා ඒක ඔබේ ආදායම් මාර්ගයක් බවට පත් කරගන්න හැටියි අද අපි කියලා දෙන්නේ.

අරලිය මලෙන් එන පහන් සුවඳ දෙන්න බැරි වුණත් බොහොම විමසිල්ලෙන් හොයන තාක්කල් බොරු මලක් කියලා අඳුනගන්න බැරිවෙන විදියට ඒක හදන හැටි කියලා දෙන්න අපිට පුළුවන්.

මේකට සුදු කපුරෙදි මීටරයක්, කම්බි මීටර් දෙක තුනක්, කහ ඩයි (සුදු, රෝස, කහ, රතු වගේ පාට කිහිපයකින් අරලිය මල් තියෙනවනේ. ඒ නිසා මේ මල හදන්න ඒ අතරින් ඔයා කැමති පාටක් යොදාගන්න පුළුවන්.) සවි ග්‍රෑම් පනහක්, සවි කඩදාසියක්, ගම් වගේ අමුද්‍රව්‍ය ටිකක් අවශ්‍ය කරනවා.

කලින් පාඩම්වලදී කියලා දුන්නා වගේ මුලින්ම වතුර ලීටරයකට සවි ටික දලා හොඳට ඝනකම් වෙනකල් රත් කරලා කපු රෙදි කෑල්ල සවිවල ඔබ්බවලා වේලලා රෙද්ද කැඳ කරගන්න.

හරි දැන් අපි මල හදාගමු.

### 1 පියවර

පෙත්තේ මැද කොටසේ පළල 3.5cm සහ දිග 5cm වෙන මල් පෙත්තක බ්ලොක් එකක් කපාගන්න.

ඒක තියලා අරලිය මලට පෙති පහක් කපාගන්න.

### 2 පියවර

දැන් කරන්න තියෙන්නේ කපාගත්තු පෙත්ත වර්ණ ගන්වන එකයි.

අරලිය මලක වර්ණ සංයෝජනය වෙලා තියෙන්නේ බොහොම වෙනස් විදියටනේ.

ඉතින් පෙත්තේ අගින් පටන් අරන් උඩට යද්දි වර්ණ අඩුවෙන විදියට පෙත්ත පාට කරගන්න.

### 3 පියවර

කම්බි කෑල්ලකට සවි කඩදාසි ඔතලා මල් පෙත්තේ එක පැත්තක තියලා නටුව අලවගන්න.

ඊටපස්සේ හොඳට නැවිලා හිටින විදියට පෙත්ත අගිස්සෙන් හැඩ කරගන්න.



### 4 පියවර

මේ වගේ හදාගත්තු පෙති පහ එකට එකතු කරලා ගම්ටේප්වලින් හරි සවි කඩදාසිවලින් හරි නටුව අලවගන්න.

**පාඩම් අංක 03**

බාගෙට පිපිච්ච අරලිය පොහොට්ටු හදාගන්න අවශ්‍ය නම් එක අරලිය පෙත්තක් ලා කොළ පාටින් පාට කරලා රෝල් කරලා නටුව අලවගන්න.

මෙහෙම හදාගන්න එක අරලිය මලක් රුපියල් 30කට අලෙවි කරන්න පුළුවන්. පාරම්පරික උඩරට ඔසරිය අඳින ගොඩාක් මනාලියන් අරලියවලින් හදන මල් කළඹට ලොකු ප්‍රියතාවයක් දක්වනවා.

ඒ නිසා ඔවුන්ගෙනුත් කෘතිම අරලිය මල්වලට ඉල්ලුමක් තියෙනවා.

මල් කළඹකට අරලිය මල් 70-100ක වගේ ප්‍රමාණයක් ඇතුළත් වෙන නිසා අරලිය මල් අලෙවියෙන් අපේ කාන්තාවට හොඳ මුදලක් උපයගන්න පුළුවන්.

ඒ වගේම මල් කිනිති වශයෙන් හදලා රුපියල් දෙසීයකට තුන්සීයකට අලෙවි කරන්නත් පුළුවන්.

ඒ සඳහා ලක්සැල වගේම ජාතික ශිල්ප සභාවේ අලෙවිපොළවලුත් ඔබ වෙනුවෙන් විවෘතයි.

මේ සම්බන්ධයෙන් වැඩිදුර විස්තර දැනගන්න අවශ්‍ය කෙනෙක් ඉන්නවා නම් 0115 200 900 යන අංකයට කතා කරන්නත් අමතක කරන්න එපා.



අත්කම් නිර්මාණ උපදේශිකා
ශ්‍රියානි පුෂ්පලතා
ජාතික ශිල්ප සභාව

සෙව්වන්දි හෙට්ටිආරච්චි

# අවුරුදු දහයක් රෝද පුටුවේ ඉඳලා

## අන්තිමට මම කැලණිය කැම්පස් එකට ආවා

**ධනංජය සම්පත් විජේරත්න**



‘රිදී තිරයම පරාදයි’ කියලා නළුවෙක් වගේ පෙනුමක් තියෙන කඩවසම් තරුණයෙකුගේ පින්තූර කීපයක් දැන් දින කිහිපයක ඉඳන් මුහුණුපොතේ එහා මෙහා වෙනවා. වැඩිම ප්‍රතිචාර තිබුණොත් කාන්තා පාර්ශවයෙන් නිසා අපිත් ඒ පින්තූරවල ඉන්න තරුණයා ගැන ටිකක් අවධානයෙන් හිටියේ. ඒ වගේම අපි දැකපු ඔහුගේ පින්තූර සියල්ලේම වගේ එක විශේෂත්වයක් තිබුණා. ඒ තමයි ඔහු රෝද පුටුවක ඉඳගෙන සිටීම. ඒ නිසාම රෝද පුටුවකට වෙලා ලස්සන හිනාවක් එක්ක ගෑනු ළමයි පිස්සු වට්ටන මේ තරුණයා එක්ක ටිකක් කතා කරන්න ඕන කියලා අපි හිතුවා. ඔහුගේ හිනාව පිටුපස සැඟවුණු ලොකු කතාවක් තියෙනවා කියලා අපි දැනගත්තෙ ඒ කතාබහට පස්සෙ. ඒ කතාව තමයි මේ.

“මගේ ගම මල්වාන. එතකොට මට වයස අවුරුදු 15යි. හංවැල්ල රාජසිංහ මධ්‍ය විද්‍යාලයේ 10 පන්තියේ මම හිටියේ. ඉස්කෝලේ ඇතුළේ මං අධ්‍යාපනයට වගේම ක්‍රීඩාව පැත්තටත් බරයි. ක්‍රීඩා තරඟවලින් ලොකු ජයග්‍රහණයත් අරන් තියෙනවා. ඒ වෙනකොට සාමාන්‍ය පෙළ විභාගයට තිබුණේ හරියටම අවුරුදු එකහමාරක් වගේ කාලයක්. ඒ නිසා



මොන දේ කළත් විභාගයට මූලිකත්වය දුන්නා. මගේ ලොකුම හීනය වුණේ කැම්පස් යන එක. සාමාන්‍ය පෙළ ගොඩදාගන්න බැරිවුණොත් ඒ හීනය බොඳවෙනවා. ඒ නිසා පුළුවන් හැම විදිහටම මං සාමාන්‍ය පෙළ විභාගය වෙනුවෙන් මහන්සි වුණා.

එදා පොසොන් පෝය දවසක්. අපේ ගමේත් බත් දන්සලක් දෙන්න ලෑස්ති වෙලා හිටියේ. මමත් එතැනට ගිහින් පුළුවන් විදිහට උදව් කළා. මොකද මම ඒ වගේ පින් අතේ වැඩවලට හරි ආසයි. ගමේ එහෙම කටයුත්තක් තිබුණොත් කවදාවත් ඒක මඟඇරියේ නැතුව ගියා. ගිහින් දුවලා පැනලා මට පුළුවන් දේ කළා. කොහොම හරි එදා දන්සලේ බටු ව්‍යංජනයට වම්බටු කපන වැඩේ තව කීපදෙනෙක් එක්ක මං බාරගත්තා. ඒත් කරුමෙට වගේ බටු ගෙඩි තුන හතරයි කපන්න ලැබුනේ. අත ලිස්සලා ගිහින් මගේ අතේ ඇඟිලි දෙකක් පිහියට කැපුනා. ඒක දැනෙන්නම කැපුනා. අන්තිමේ බෙහෙත් දාන්න රෝහලට යන්න වුණා. අඳුරන අයියා කෙනෙක් එක්ක බයික් එකක ගියේ. ඒත් ටික දුරයි යන්න ලැබුණේ අපිව හැප්පුනා.

මට මතක අපි හැප්පෙනවා විතරයි. හැප්පුනේ මොකේද කියලවත් මං දැක්කේ නෑ. මං හිතන්නේ ඒ ගමන්ම මට සිහිය නැතිවුණා. මාව අරන් ගිහින් තිබුණේ කොළඹ මහරෝහලට. රෝහලේ මාස ගාණක්ම ඉන්න වුණා. මතුපිටින් පෙනුණේ කොන්දේ පොඩි තුවාලයකුයි දණහිසේ පොඩි තුවාලෙකුයි විතරයි. හැබැයි ඇඟ ඇතුළේ ලොකු ඩැමේජ් එකක් වෙලා කියලා වෛද්‍යවරු කිව්වා. එක දිගටම මාස ගාණක් මං හිටියේ ඇඳ උඩ. ලොකු පාලුවක් තනිකමක් දැනුණා. මානසික මට්ටම වුණත් ගොඩාක් පහළට වැටුණා.

හිටියම කොන්දේ තුවාලේ පෑරෙනවා. ඒත් ඒ ඔක්කෝම අමාරුකම් ඉවසගෙන මං සාමාන්‍ය පෙළ විභාගය ලියන්න ගියා. ඒ වෙනකොටත් මට විභාගය අවුරුදු දෙකක් පහුවෙලා. කොහොමින් හරි දවස් හතක් අමාරුකම් දරාගෙන මං විභාගේ ලිව්වා. තව ලියන්න තිබු ණේ විෂයන් දෙකයි. ඔය අතරේ තමයි මට උණ ගැනෙන්නේ. එහෙන් සීතලයි. මෙහෙන් වෙව්ලනවා. ඒත් මං ජැකට් එකක් දාගෙන කෝපි බිබී ඒ විෂයන් දෙකත් ලිව්වා. පස්සේ දැනගත්තා උණ ගැනුණේ තුවාලෙට විෂබීජයක් ගිහින් තිබුණු හින්දා කියලා.

> මට කැම්පස් එකේ යාළුවෝ ගොඩාක් උදව් කරනවා. ඔවුන් නොහිටින්න මට කැම්පස් ජීවිතේ ගොඩාක් අමාරු වෙන්න තිබුණා

කොච්චර අමාරුකම් මැද්දේ වුණත් 2015 අවුරුද්දේ මං සාමාන්‍ය පෙළ හොඳට පාස් වුණා. A2 යි, B1 යි, C4 යි, S2 යි විදියට ප්‍රතිඵල තිබුණේ. S2 ඇවිත් තිබුණේ උණ ගැනිලා තිබුණු දවසේ ලියපු විෂයන් දෙකට. මං උසස් පෙළට තෝරගත්තේ වාණිජ විෂය ධාරාව. ඒත් ඊළඟට තව ප්‍රශ්නයක් ආවා. ඒ තමයි ගමේ ඉස්කෝලේ උසස් පෙළ නොතිබුණු එක. ඒ නිසා මට ආයෙත් හංවැල්ල රාජසිංහ මධ්‍ය විද්‍යාලයට යන්න වුණා. සතියට දවස් දෙකක් වගේ ඉස්කෝලේ ගියේ. ඒ යන හැමදාම ත්‍රීවිල්වල යන්නත් ඕනේ. ඉතින් ආර්ථික අපහසුකම් පවා සෑහෙන්න ආවා. කොහොමින් හරි 2018 අවුරුද්දේ උසස් පෙළ ලියන්න ඔන්න මෙන්න තියෙද්දි කොන්දට දාලා තිබුණු යකඩ ප්ලේට් එක අයින් කරන සැත්කමකට මුහුණදෙන්න වුණා. ඔය වගේ ප්‍රශ්න ගොඩාක් එක ළඟ වැටුණු නිසා නිසා මට ඒ සැරේ හොඳ ප්‍රතිඵලයක් ගන්න බැරිවුණා.

ඔය අතරේ තමයි දෙපයින් ඇවිදපු කිසිම මනුස්සයෙක්ට වැරදිලාවත් ඇහෙන්න එපා කියලා ප්‍රාර්ථනා කරන කතාවක් වෛද්‍යවරු මට කිව්වේ. ඒ ආයෙත් මට ඇවිදින්න බෑ කියලා. එදා මට දැනුණු ඒ අසරණකම මට මෙහෙම කියන්න තේරෙන්නේ නෑ.

මාස කීපයකට පස්සේ මං ගෙදර ආවේ රෝද පුටුවෙන්. ඒක හරි වේදනාකාරී අත්දැකීමක්. එදා ඉඳන් වෙනදා දෙපයින් ඇවිදන් ගිය ගොඩාක් තැන්වලට මට යන්න වුණේ රෝද පුටුවෙන්. ඒ නිසාම මට ඉස්කෝල ගමන මඟඇරුණා. මුල් කාලේ පාසල් යන්නම වුණේ නෑ. ඒත් ඉගෙනගන්න තියෙන කැමැත්ත උඩ මට ආයෙමත් ඉස්කෝලේ යන්න ඕනේ වුණා. මං තීරණය කළා ඒ වෙනකොට යමින් තිබුණු හංවැල්ල රාජසිංහ මධ්‍ය විද්‍යාලයෙන් අයින්වෙලා ගමේ ඉස්කෝලෙට යන්න. මොකද ඒක ලොකු පහසුවක් කියලා හිතුනා.

රෝහලෙන් ගෙදර ඇවිත් මට ඉන්න ලේසි වුණේ නෑ. එහෙන් අතීතය මතක් වෙනවා. මෙහෙන් ඉස්කෝලේ යන්න ලොකු වෙහෙසක් දරන්න ඕනේ. ඒ අස්සේ මට එක දිගට ගොඩාක් වෙලා ඉඳගෙන ඉන්න අමාරුයි. එහෙම

එතැනින් මං පොඩ්ඩක් මානසිකව වැටුණා. මොකද කැම්පස් යන්න බැරිවෙයි කියලා මට හිතුනා. ඒ නිසා මං හිතාගත්තා ලබන සැරේ කොහොම හරි උසස් පෙළ ගොඩදාගන්නවා කියලා. එහෙම හිතලා උසස් පෙළට ආයෙමත් සෑහෙන්න මහන්සි වුණා. අන්තිමේ උසස් පෙළ පාස්වෙලා මට කැලණිය කැම්පස් එකට එන්න හැකියාව ලැබුණා. මං කැම්පස් කියලා දැනගත්ත දවසේ මට පුදුම සතුටක් දැනුණේ. දැන් මං කැලණිය කැම්පස් එකේ වාණිජ හා මූල්‍ය කළමනාකරණ අධ්‍යයන අංශයේ පළවෙනි වසරේ ශිෂ්‍යයෙක්. මට කැම්පස් එකේ යාළුවෝ ගොඩාක් උදව් කරනවා. ඔවුන් නොහිටින්න මට කැම්පස් ජීවිතේ ගොඩාක් අමාරු වෙන්න තිබුණා. මට මගේ ගෙදර අය තමයි ලොකුම හයිය. ඒ අය නොහිටින්න මං ගොඩාක් මානසිකව වැටිලා. ඒ වගේම මගේ යාළුවෝ. එයාලට කවදාවත් මං බරක් වුණේ නෑ. එයාලා ට්‍රිප් එකක් ගියත් මාව උස්සන් හරි එක්ක යනවා.

ජීවිතය කියන්නේ මොකක්ද කියලා මට ඇත්තටම තේරුම් ගියේ කකුල් දෙක තිබිලත් ඇවිදින්න බැහැයි කියලා දැනගත්තු දවසේ. ඒත් කවදා හරි මට ඇවිදින්න පුළුවන් වෙයි කියලා මගේ හිතේ පොඩි බලාපොරොත්තුවක් තියෙනවා. එහෙම හිතාගෙන මං ජීවත් වෙනවා. දැන් මං අවුරුදු දහයකට කිට්ටුවෙන්න ජීවත්වුණේ රෝද පුටුවේ. ඇත්තටම ආයෙත් ඇවිදින්න තියෙනවා නම් පුදුම ආසයි. බෙහෙත් නම් කරනවා. ඒත් ඉතින් තාමත් හරියට සුවයක් නෑ. හිතේ විශ්වාසය තමයි තියෙන්නේ. හැබැයි මං ජීවිතේ ගැන දැන් තේරුම් අරන් ඉන්නේ. අපි හැමෝම ඉපදිලා මැරෙන මිනිස්සු. ඒ නිසා මේ ජීවත්වෙලා ඉන්න පොඩි කාලේ රෝද පුටුවේ හිටියත් මං හිනාවෙලා ඉන්න ගොඩාක් උත්සාහ කරනවා. ඇත්තටම හිනාවෙනවා.”



> එහෙන් සීතලයි. මෙහෙන් වෙව්ලනවා. ඒත් මං ජැකට් එකක් දාගෙන කෝපි බිබී ඒ විෂයන් දෙකත් ලිව්වා. පස්සේ දැනගත්තා උණ ගැනුණේ තුවාලෙට විෂබීජයක් ගිහින් තිබුණු හින්දා කියලා


ඔහු තමයි මල්වානේ පදිංචි ධනංජය සම්පත් විජේරත්න. කොච්චර ලස්සනට හිනාවෙන්න හැදුවත් ධනංජයගේ හිනාව අස්සේ අපි හැංගිලා තිබුණු කතාවක් දැක්කා. ඒ තමයි ඔහු රෝද පුටුවක ඉඳගෙන මෙච්චර ලස්සනට හිනාවෙනවා නම් ඔහුට ආයෙත් කකුල් දෙකෙන් ඇවිදින්න පුළුවන් වුණොත් ඔහු කොච්චර නම් ලස්සනට හිනාවෙයිද? ඔහුව දෙපයින් නැගිට්ටවලා ඔහුගේ මූණට ඒ හිනාව ගේන්න පුළුවන් එකම එක මනුස්සයෙක් හරි මේ පුංචි රටේ ඇති. ඒත් අවාසනාවට වගේ ඔහුට තවමත් ධනංජයව මුණගැහිලා නෑ. ඉතින් මේ ලිපියෙන් පස්සෙවත් ඔහුට ධනංජයව මුණගැහෙයි කියලා අපිත් බලාගෙන ඉන්නවා. ඒ, මෙච්චර වෛද්‍ය තාක්ෂණය දියුණු කාලේ ඔහුගේ හෝ ඇයගේ පිහිටෙන් මේ පුංචි කොල්ලට ආයෙත් දෙපයින් හිටගන්න පුළුවන් වෙයි කියන විශ්වාසය අපිටත් තියෙන නිසා.

*රුවන් එස්.සෙනවිරත්න*

# අවසරයි

බියංකා නානායක්කාර ලියයි

52 කොටස



**මෙතෙක් කතාව**

*විදුහල්පතිවරයෙකු වූ සෙනරත් ඇල්ලේපොලගේත්, සේපාලිකා ඇල්ලෙපොලගේත් වැඩිමල් දියණිය වන අංජනා සරසවි සිසුවියකි. ඇමතිවරයකු වන බණ්ඩාර තෙන්නකෝන්ගේත්, සෙනෙහෙලතා මැණිකේ තෙන්නකෝන්ගේත් බාල පුතා වූ තේනුක ඇය හා පෙමින් බැඳෙන්නේ දුටු සියලු තරුණියන් අතරින් ඈ ළඟ හිත සෙවූ පෙම්වතිය දුටු නිසාය. දේශපාලනය නොරුස්සන ඔහු ගෙදරින් ඈත්ව ඔහුගේම ව්‍යාපාරයක් කරගෙන යන්නේ ජපානයේ සිට පැමිණියාට පසුවය. සෙනෙහෙලතා මැණිකේ දියණියට හා වැඩිමල් පුතුට වඩා තේනුකට ආදරය කළාය. එත් ඔහුගේ වැඩිමල් සහෝදරයා වූ මේනක බණ්ඩාර හැමවිටම ඔහු හා තරඟයට ආ අතර මේනක විසින් තෙන්නකෝන් බණ්ඩාර ඇමතිවරයා නිතර රටේ කතාබහට ලක් කරන පුවත් මැව්වේය. සෙනරත් ඇල්ලේපොල හෘදයාබාධයකින් හදිසියේ මියයාමත් සමඟ රැකියාවක් නොකළ සෙපාලිකාත්, අංජනා, නංගී සහ මල්ලීත් අසරණ වෙද්දී ඔවුනට පිහිට වූයේද තේනුකය. ඒ වනවිට ඔහු කඩවත පියාගේ නිවසේ පදිංචිව සිටි අතර මේනක, තෙන්නකෝන් බණ්ඩාර ඇමතිවරයා රවටමින් ඒ නිවසේ ගෙවත්ත එළවළු වගාවට ඉල්ලා සිටියේය. ඔහුට ඊට ඉඩදීමේ ප්‍රතිඵලයක් ලෙසින් තේනුකට ඒ නිවසේ සිටින්න බැරිවුණේය. ඔහු පදිංචි වන්නට කුලී ගෙයක් සොයද්දී සෙනෙහෙලතා බණ්ඩාර ඇගේ ගමේ ඉඩමක් සහෝදරයාට විකුණා ගත් මුදල් තේනුකට දුන්නේ නිවසක් මිලට ගන්න කියාය. ඒ අනුව ඔහු දිප්පිටිගොඩ පාරෙන් නිවසක් මිලට ගත් අතර ඒ බවක් අංජනාට සැඟවූයේ දිනෙක ඈ පුදුමකරනු සඳහාය. ඒ නිසා ඔහු ඉන්නේ කුලී නිවසක බව කී තේනුක ඒ නිවසේම පහත මහළ අංජනාගේ පවුලේ අයට ලබා දුන්නේය. දරුවන් සම්පූර්ණයෙන් මාතලේ ඉගෙනීම් කටයුතු නැවැත්වූ පසු කොළඹ එන්නට බලාගෙන සේපාලිකා ඇල්ලේපොල යළි මාතලේ ගියාය. මේ අතර තේනුකගේ ජපානයේ සිටි මිතුරියන් කීපදෙනෙක් මසක සංචාරයක් සඳහා ලංකාවට එයි.*

**අද එතැන් සිට**

## සල්ලිකාරයෙක්ගෙ පවුලකට එකතු වුණාම

# සල්ලි හොයන්න ඔච්චර මහන්සි වෙන්න ඕන නෑ

බණ්ඩාර තෙන්නකෝන් ඇමතිවරයා කරමින් සිටි සාකච්ඡාව බිඳ ද බිරිඳට යන්නට නොදුන්නේය. ඔහු ඇයව නැවතත් කැඳවා අසුනෙහිම ඉන්දෙව්වේය. සෙනෙහෙලතා මැණිකේගේ සිත නොසන්සුන් වී තිබුණි. අප්පච්චි දෙයක් කීවොත් කීවා වර්ගයේ මිනිසෙකි. පුතාද එසේය. මොනවා කීවත් කරත් විවාහය පිළිබඳ තීන්දුව ගැනීමට ඉඩ දිය යුත්තේ දරුවන්ටය. දෙමාපියන්ගේ සතුටට විවාහා කර දුක් විඳින අය ඕනෑතරම් සෙනෙහෙලතා මැණිකේ දැක ඇත. ඇයද එක්කෙනෙකි. අම්මාත් අප්පච්චිත් කතා කර කසාද බඳින්නැයි කී නිසා බණ්ඩාර තෙන්නකෝන් හා විවාහ වූවත් ඔහු ජීවත්වන්නේ මුදල් මත්තේ මිස පවුල මත්තේ නොවේ කියා විවාහ වී නොබෝ කලකින්ම ඇය තේරුම් ගත්තාය. ඊට විසඳුම ඇය සෙව්වේ ඉවසීමෙනි. තමන් එසේ කළත් හැම කෙනෙකුටම එසේ කරන්නට බැරිය.

**"මැණිකෙට මං කතාව කියන්නත් කලින් ගස්සලා පුප්පලා කඩාගෙන ගිහිල්ලත් ඉවරයි..."**

ඇගේ මුහුණේ තවමත් නැති සිනා පොදක් ගෙන්වන්නට ලෝ බණ්ඩාර තෙන්නකෝන් හඬින් සිනාසුණේය. එත් ඇගේ දෙතොල සිරවීම තිබුණා මිස සිනාවක් ඇඳුණේ නැත.

**"තේනුක මැණිකෙ කියන දේ අහනවා. කොහොමහරි කතා කරමු විසෙන්තිආරච්චිගෙ දුව ගැන..."**

සෙනෙහෙලතා මැණිකේ සැමියා දෙස හැරී බැලුවේ කෝපයෙනි. ඔහුගේ මුහුණේ ඇති කපටි පෙනුමට ඒ කේන්තියෙන් තවත් ඈ දැවුණාය.

**"පුතාගේ හැටි නොදැනද මහත්තයා මට ඔය වගේ දෙයක් අහන්න කියන්නේ...? කොල්ලව ආපහු මේ රටෙනුත් යවා ගන්න ඕනි වෙලා වගේ..."**

**"මැණිකේ... දරුවොන්ට බය වෙන්නෙ ඇයි? දරුවො දෙමාපියෝ කියන දේ අහන්න ඕනි. අනික කොල්ලට කෙල්ලෙකුත් නැත්තම්, මේකට කැමති වෙන්න බැරිකමක් නෑනේ...?"**

> **ලොකු පුතාටම ඔය කියන ගෑනු ළමයා බන්දන්න. ලොකු පුතාටත් හොඳ අනාගතයක් හැදෙයිනෙ ඉතින් එතකොට**

සෙනෙහෙලතා මැණිකේගේ හිතේ වූ කේන්තිය පුපුරා ගියේ ඔහුගේ ඒ කතාවටය. ඇය මේ ජීවිතයේ ඔහුගේ නොරුස්නා සිද්ධීන් බොහෝ දුටුවත් මේ තරමින් කේන්ති ආ දිනයක් නැත.

**"දෙමාපියෝ කියන දේවල් දරුවො අහන්න ඕනි නම්, ඉස්සරවෙලා ලොකු ළමයා කියලා හඳගෙන ඉන්න. මං නෙවෙයි ඔයයි දරුවන්ට බය. එකනේ ලොකු පුතා කරන කියන දේවල්වලට ඉඩදීගෙන ළමයගෙ ජීවිතේ නැති නාස්ති වෙනකල් බලාගෙන ඉන්නේ..."**

ඇය කියන දේ ඔහු නිහඬවම අසා සිටියේ ඈ කියන්නේ ඇත්ත නිසාය.

**"ලොකු පුතා සල්ලි හොයන්නයි, වියදම් කරන්නයි ගෝරිවලටයි කැමති වුණාට පොඩි එක්කෙනා ඕවට කැමති නෑ. ඒ දරුවා බොහොම හෙමින් ගමනක් යන්නේ."**

**"ඒක තමයි කියන්නේ. සල්ලිකාරයෙක්ගෙ පවුලකට එකතුවුණාම සල්ලි හොයන්න ඔච්චර මහන්සිවෙන්න ඕනි නෑ කියලා..."**

**"පොඩි පුතාට එහෙම උවමනා වෙන එකක් නෑ කියලා මං දන්නවා. ඕගොල්ලො කතා කරගත්ත විදිහට ලොකු පුතාටම ඔය කියන ගෑනු ළමයා බන්දන්න. ලොකු පුතාටත් හොඳ අනාගතයක් හැදෙයිනෙ ඉතින් එතකොට."**

**"මැණිකේ... මැණිකේ... කියන දේ තේරුම් ගන්න. මේ මෝඩයාගේ වැඩ හින්ද ඒ මිනිස්සුන්ට ලොකු පුතා ගැන පැහැදීමක් නෑ. එයාලට අපේ පවුලට එකතුවෙන්න උවමනාව තියෙනවා. ඒකට තමා පොඩි පුතාට යෝජනාව ආවේ."**

සෙනෙහෙලතා මැණිකේ ඇත්තටම අසරණ වුණාය. ඔහු කියන්නේ අසාධාරණ කතාවකි. ඊට කිසිසේත් එකඟ විය නොහැක.

**"මට ඔය කතාවට එකඟ වෙන්න බෑ මහත්තයා. ඒ ගොල්ලන්ට ලොකු පුතා හරියන්නෙ නැත්තම් ඕක අතරලා දන්න..."**

සෙනෙහෙලතා මැණිකේ තීර හඬින් කීවේ වෙනතක බලාගෙනය.

**"හත්... මැණිකෙට බැරිනම් මං තේනුකට කියන්නම්. මං එයාගෙ අප්පච්චි."**

බණ්ඩාර තෙන්නකෝන් ඇමතිවරයා හිඳ සිටි තැනින් නැගිට්ටේය. ඔහු ඉදිරි දෙරෙන් පිටව යන දෙස සෙනෙහෙලතා මැණිකේ බලා සිටියේ බරවූ හදවතෙනි. පුතුට ඔහු මේ යෝජනාව කෙසේ කියාවිද ඔහු කෙසේ එය බාරගනීවිද කියා ඇයට සිතා ගන්නට බැරිවිය. ඇය හිඳ සිටි තැනම ඉඳ කල්පනා කළේ සිද්ධවෙන්නේ මොකද්ද කියාය. සෙනසුරාද දිනයේ තේනුක දකින්නට සහෝදරයා පැමිණෙනවා කීවෙත් එවන් ඉඟි කිරීමකටය. ඊට නම් සෙනෙහෙලතා මැණිකේද කැමතිය. එකක් ඒ ඔවුන් නෑනා මස්සිනාලා වීමය. අනෙක ඔය කියන විසෙන්තිආරච්චිට වඩා දේපළ, ගේදොර, යානවාහන සහෝදරයාට තිබීමය. උමන්ද පවුලේ එකම දරුවාය. ඒ නිසා පවුලේ සියලු දේපල හිමිවන්නේ ඇයටය. ඊටද ඇය ලස්සනය. තරුණ වියට එනතුරු වරින් වර දුටුවත් දැන් අවුරුදු ගණනාවකින් ඇය දැක්කේ නැත.

ඒ පාසලින් ඉවත්වූ සැනින් ඇය විදෙස්ගතවූ නිසාය. අධ්‍යාපන කටයුතු නිමවා තවත් වසර කීපයක් ඇය එරටේම රැඳී රැකියාවක්ද කළාය. උමන්ද ඊයේ පෙරේද ලංකාවට පැමිණියේ වසර ගණනාවකට පසුය. ඒ ආවාට පසු ටෙලිෆෝනයෙන් කතා කළා මිස තාමත් දුටුවේ නැත. එන සතිඅන්තයේ ඔවුන් එන බව කී මොහොතේ පටන් සෙනෙහෙලතා මැණිකේගේ හිත නොඉවසිල්ලෙන් සිටියේ ඈ දකින්නටයි.

> **කොල්ලට කෙල්ලෙකුත් නැත්තම්, මේකට කැමති වෙන්න බැරිකමක් නෑනේ**

පොඩි කාලෙත් තේනුකයි උමන්දයි එක වගේය. ඔවුන් පොඩි කාලේ කාගෙ හෝ මංගල්ලයකට මල්කුමරාට හා මල්කුමරියට ඇඳ එකට ගත් පින්තූරය තවමත් සෙනෙහෙලතා මැණිකේගේ පවුලේ ඇල්බමයේ ඇත.

ඇමතිවරයාගේ වාහනය පිටව යන හඬ ඇසුණි. ඔහු යන්නේ අමාත්‍යාංශයටද පුතු හමුවන්නටද වෙනත් ගමනක් දැයි කීවේ නැත. ඉඳහිට එහෙම කියා ගියත් හැමදම එහෙම කියා යන පුරුද්දක්ද නැත්තේය. මේ ගමනින් නොගියත් අද දවසේ කොයි වෙලාවක හෝ ඔහු එහි යනු ඇත. ඒ නිසා බණ්ඩාර තෙන්නකෝන් තේනුකගේ හිත ගිනි තබන්නට පෙර ඒ ගැන කියා ඔහුව දැනුවත් කරන්නට සෙනෙහෙලතා මැණිකේ සිතුවාය. ඇය පුතුට කතා කරන්නට ඇමතුමක් ගනිමින් සිටියදී නිවස තුළ දුරකතනය නාද වුණේය.

ඈ ගන්නට ගිය ඇමතුම නවතා ටීපෝව මත තිබූ නාදවන අනෙක් දුරකතනය අතට ගත්තාය. ඇමතුම ගේට්ටුවේ ආරක්ෂක අංශයෙනි.

**"මැඩම් නුවරින් කට්ටියක් ඇවිත්... මැඩම්ගේ නෑදෑයො කියලා කියන්නේ..."**

ආරක්ෂක නිලධාරියාගේ කතාවෙන් සෙනෙහෙලතා මැණිකේට උතුර දකුණ මාරුවුණා සේය. නුවරින් තමන් හමුවන්නට එන්නට එහෙම කෙනෙක් නැත. සිටින්නේ සහෝදරයා පමණි. ඔහු එනවා කිව්වේ සතිඅන්තයේය.

ඇය ආයෙත් ආරක්ෂක නිලධාරියාට කතා කළාය.

**"කවුද කියලා අහන්න ජයරත්න."**

**"ඉන්න මැඩම් නෝනා කෙනෙක් වාහනෙන් බැහැලා මෙතන ඉන්නවා. අහලා කියන්නම්."**

දුරකතන ඇමතුම විසන්ධි වී ගියත් සෙනෙහෙලතා මැණිකේ ටෙලිෆෝනය අත තබාගෙනම එහි සිටගෙන සිටියාය.

**ලබන සතියට...**



# දරුවො තාත්තට වැඩිපුර ආදරේ වෙයි කියලා

# සමහර අම්මලා බයයි

දවසක් මගේ හිතවතෙක් වැඩ ඇරිලා ඇවිල්ලා කෑම කන්න බලනකොට කෑම එකට කවුදෝ ලුණු හලලලු. අනවශ්‍ය ප්‍රශ්නයක් ඇතිවෙයි කියලා හිතපු නිසා එදා ඔහු ඒ ගැන බිරිඳගෙන් අහන්න ගිහින් තිබුණෙත් නැහැ.

ඊටපස්සෙත් දවස් දෙක තුනක්ම මේ වැඩේ වෙච්චි නිසා කවුද මේක කරන්නේ කියලා දැනගන්න දවසක් මේ තාත්තා හොරෙන් බලාගෙන ඉඳලා තියෙනවා. පුංචි දුව තමයි බත්පතට ලුණු හලන්නේ කියන එක එදා මේ තාත්තා දැනගන්නවා. දරුවට ගහනවා බණිනවා වෙනුවට ඔහු බොහොම නුවණක්කාර වැඩක් කළා. ඒ තමයි අවුරුදු 11ක් වෙන දුවව මනෝවිද්‍යා උපදේශකයෙක් වුණු මට මුණගස්වපු එක.

දුවගේ හිතේ තාත්තා ගැන බොහොම දරුණු තරහක් පැලපදියම් වෙලා තියෙන වග කතාබහේදි මට තේරුණා. ඉතින් ඇයත් එක්ක ටිකක් කතා කරනකොට මේ තත්ත්වය ඇතිවෙන්න බලපාපු හේතුව තේරුම්ගන්න අමාරු වුණේ නැහැ.

තාත්තා රෑ බෝ වෙලා නිවසට එන නිසා දරුවා වැඩි කාලයක් ඉඳලා තිබුණේ අම්මා එක්ක. මෑතක ඉඳලා මේ අම්මා නිතර නිතර ඇයට තාත්තා ගැන වැරදි කියන්න පටන් අරගෙන.

මව සහ පියා ගෙන්වගෙන කරුණු හොයාබලද්දී මව එහෙම කරන්න හේතුව අනාවරණය වුණා. ඇගේ අනියම් සම්බන්ධතාවයට දරුවාගෙන් බාධාවක් නොවෙන්න ඕන නිසා තමයි එහෙම කරලා තිබුණේ. පස්සේ දරුවගේ ප්‍රශ්නය වගේම ඒ පවුලේ ප්‍රශ්නයත් උපදේශනය මගින් විසඳන්න මට පුළුවන් වුණා.

ගොඩක් දෙමව්පියන් මේ විදියට නොදැනුවත්කම නිසා හෝ වෙනයම් අරමුණු උදෙසා සැමියගේ, බිරිඳගේ වැරදි දරුවන්ගේ ඔලුවලට දනවා. දුරදිග නොහිතා නොබලා කරන ඒ වගේ දේවල් දරුවන්ට වගේම අම්මා තාත්තාටත් බොහොම නරක විදියට බලපාන්න පුළුවන් කියන එක පැහැදිලි කරන්නයි මම සමාධි දුවගේ කතාව උදාහරණයට ගත්තේ.

**"දෙන්නා අතර ඇතිවෙන විරසකවලට දරුවන්ව ආයුධයක් කරගන්නවා නම් අනිවාර්යයෙන්ම එහි භයානක ප්‍රතිඵලවලට මුහුණදෙන්න දෙමාපියන් සූදනමින් ඉන්න"** කියලා සුප්‍රකට මනෝවිද්‍යාඥයෙක් වෙච්ච ජීන් පියගෙට් කියලා තියෙනවා.

සාමාන්‍යයෙන් ගෙවල්වල දරුවොත් එක්ක වැඩිවෙලාවක් රැඳෙන්නේ අම්මලා. ඒ නිසා මේ කියන කාරණාව වැඩිපුරම අදාළ වෙන්නේ අම්මලාට. තාත්තලා දරුවොත් එක්ක අම්මගේ වැරදි කියන්නේ නැහැ කියලා ඒකෙන් අදහස් වෙන්නෙ නැහැ. එහෙම තාත්තලාත් ඕනතරම් ඉන්නවා.

සැමියා බිරිඳ එක්ක පුංචි හිත් අමනාපකම් ඇති කරගන්න අවස්ථා තියෙනවා. බොහොම ආදරෙන් ඉන්න අඹු-සැමි යුවළක් අතර ඉඳලා හිටලා පුංචි බහින්බස්වීමක් ඇතිවෙනවා කියලා හිතන්නකෝ. ඔන්න ඊටපස්සෙ අර අම්මා හිතේ තියෙන විස්සෝපය මකාගන්නත් එක්ක තාත්තගේ වැරදි දරුවා එක්ක කියනවා. දවසකින් දෙකකින් ආයෙත් හිත් පෑහුණාම අම්මට සේරම අමතකයි. හැබැයි දරුවට ලේසියකට ඒවා අමතක වෙන්නෙ නෑ. ඉතින් අම්මා තාත්තා යාළු වුණත් දරුවගේ හිතේ තාත්තා ගැන ඇතිවෙච්ච අමනාපය ගලේ කෙටූ අකුරු වගේ තැන්පත් වෙන්න පුළුවන්.

ඊළඟට තාවකාලිකව වෙන්වුණු අම්මලා තාත්තලා. මේ අයත් දරුවන්ට සහකරුගේ වැරදි කියනවා. එහෙම නැත්නම් **"මම ඔයාගේ තාත්තා එක්ක කතා කරන්නේ නැහැ, මම මෙහෙම කිව්වා කියලා එයාට කියන්න"** කියලා දරුවන්ව ඒ දෙන්නගේ ප්‍රශ්නෙට මැදිකර ගන්නවා. තාත්තා කියන්නේ කතා කරන්න හොඳ නැති කෙනෙක් කියලයි එතකොට අර දරුවා හිතන්නේ.



අනිත් කොට්ඨාසය තමයි නීතියෙන් වෙන්වුණු උදවිය. තමන්ගේ බිරිඳගේ, සැමියාගේ වැරදි දරුවන්ට කිය කිය අමුතු සතුටක් ලබන්න මේ අයත් දක්ෂයි. අම්මගේ හරි තාත්තගේ හරි වැරදි දරුවන් එක්ක කියන එකට සමහරුන්ට වෙන වෙන යටි අරමුණුත් තියෙනවා.

දරුවා තමන්ට වඩා තාත්තට ආදරේ වෙයි කියලා හිතන අම්මලා ඉන්නවා. එහෙම අය මට මුණගැහිලත් තියෙනවා. සැමියා/බිරිඳ එක්ක ඇති කරගන්න ඊර්ෂ්‍යාවක් නැත්නම් ආත්මාර්ථකාමී හැඟීමක් නිසා කෙනෙක්ට ඔය වගේ සිතුවිලි ඇතිවෙන්න පුළුවන්.

තාත්තගේ වැරදි සේරම දරුවට කියලා දරුවගේ හිත බින්දම දරුවගේ ආදර සැළකුම් සේරම තමන්ට කියලා ඔය පිරිස හිතනවා. **'මම තමයි හොඳම'** කියලා ලකුණු දාගන්න කැමති අයත් මේ වැරැද්ද කරනවා. ඒ වගේම දරුවන්ගෙන් අනුකම්පාව බලාපොරොත්තු වෙන අයත් ඉන්නවා. අම්මා තාත්තා නීතියෙන් වෙන්වෙලා නම් වරැද්ද තමන්ගේ නෙවේ අනිත් කෙනාගේ කියලා දරුවට පෙන්නලා දරුවා තමන්ගේ පැත්තට නම්මගන්න හදනවා. අම්මා තාත්තගේ කඹ ඇදීමට දරවෝ එකතු කරගන්න එක බොහොම අමානුෂික දෙයක් හැටියටයි මට නම් පේන්නේ.

අම්මා, තාත්තා ගැන නිතර වැරදි කියනවා නම් දරුවන්ගේ හිතේ තාත්තා ගැන තරහකුත්, අම්මා ගැන අනුකම්පාවකුත් ඇතිවෙනවා. ඊටපස්සේ ඒ දරුවා තාත්තා ගැන වෛර බැඳගන්න එක නවත්තන්න අමාරුයි. මේකෙ අනිත් පැත්තත් මේ වගේ තමයි.

තව සමහරු ඉන්නවා තාත්තාගේ වැරදි අහද්දි ඒ අය තාත්තගේ චරිතයට වීරත්වයක් ආරෝපණය කරගන්නවා. තාත්තයි, පුතයි දෙන්නම එකතු වෙලා මවට පහරදෙන සිද්ධියක් මගේ ළඟට ආවා. අම්මා නිතරම තාත්තගේ වැරදි කියපු නිසා අම්මා දුර්වලයි කියලා හිතලා තමයි අර දරුවත් අම්මට පහර දීලා තිබුණේ. නැත්නම් තාත්තා **'චණ්ඩියෙක්' 'නරක කෙනෙක්'** කියලා හිතට අමුතුම අභිප්‍රේරකයක් ලබාගන්න දරුවොත් ඉන්නවා. එවැනි දරුවෙක් තුළ ගුණයහපත්කම් දියුණුවීම සිදුවන්නේ හරි අඩුවෙන්. අනික අම්මා තාත්තාට වැරදි කරන්න පුළුවන් නම් ඇයි මට බැරි කියලා හිතුවොත් දරුවා කෙරෙහි වැරදි කිරීමට තියෙන බය නැතිවෙනවා.

මේ කාරණාව නිසා අම්මගේ පැත්ත ගන්නද තාත්තගේ පැත්ත ගන්නද කියලා අසරණ වෙන දරුවොත් ඉන්නවා. දරුවෙක්ට අම්මද? තාත්තද? කියලා තෝරන්න කියන එකේ මානසික පීඩනය පැහැදිලි කරන්න නම් මට උදාහරණ නැහැ.

මේ ඇතිවෙන පීඩනය එක්ක දරුවෙක්ගේ අධ්‍යාපනය කඩාකප්පල් වෙන්න පුළුවන්. ඒ වගේම අම්මා තාත්තා ගැන, සමාජය ගැන මේ දරුවාත් වෛර බැඳගන්නවා. එහි ප්‍රතිඵලය විදියට සමාජ කාංසාව, සමාජ භීතිකාව වගේ මානසික ගැටලු ඇති දරුවන් වගේම පෞරුෂ අඩුපාඩු සහිත දරුවන් බිහිවෙන්න පුළුවන්. ඒ වගේම මේ පීඩනය නිසා දරුවෝ මත්ද්‍රව්‍ය, මත්පැන්වලට නැතිනම් වෙනත් අයථා සබඳතාවලට යොමුවෙන්නත් බැරි නැහැ.

දරුවෙක් බිහිවෙන්නේ අම්මා තාත්තා දෙන්නම නිසානේ. ඉතින් තමන්ගේ හිතේ කොච්චර වෛරයක් තිබ්බත් දරුවගේ හිතට අම්මා තාත්තා ගැන විෂ පුරවන්න එපා.

සහකරුගේ සහකාරියගේ ප්‍රශ්නයක්, ගැටලුවක් තියෙනවා නම් ඒවා උපදේශනය නැතිනම් නීතිමය වශයෙන් විසඳගන්න. එහෙම නැතුව මුකුත් නොකර දරුවෝ එක්ක ඒවා විවේචනය කළා කියලා ඒ ප්‍රශ්නවලට විසඳුම් ලැබෙන්නේ නෑ.



ජ්‍යෙෂ්ඨ මනෝවිද්‍යා උපදේශක/මනෝ චිකිත්සක
ආචාර්ය සුරංග අමරකෝන්

සෙව්වන්දි හෙට්ටිආරච්චි

# මැරෙන්න කියලා පාරට ගෙනත්දාපු රෙක්ස් දැන් ලස්සන කොල්ලෙක්

ගෙදරට හොරෙක් ආ කල කාට වුණත් මුලින්ම මතක් වන්නේ නිවසේ ආරක්ෂකයා වන සුනඛයාය. ඒත් අදින් වසර හතළිහකට පෙර දවසක නෙලුම් පෙරේරලාගේ ගෙදරට හොරු පනිද්දී බල්ලෙක් තබා ඒ ගෙදර කපුටෙක්වත් සිටියේ නැත. එදවස බොහෝ සුවපහසුවට ජීවත්වුණු ඔවුන්ගේ නිවසේ දෙර, බල්ලෙකුට පූසෙකුට තියා මැස්සෙකුට, මදුරුවෙකුටවත් නොඇරුණ තරම්ය. ඒත් හදිසියේම නිවසට හොරු පැන වටිනා බඩුමුට්ටු රැසක් සොරාගෙන ගොස් තිබුණු මොහොතේ කවුරුත් මතක් කළේ බල්ලෙකුගේ වටිනාකමය.

**"බල්ලෙක්වත් හිටියනම් හොරු එනකොට බුරලා හරි කියනවා..."**

**"දැන්වත් බල්ලෙක් හදන්න අනේ..."**

හිතවත් අයගෙන් එවැනි ආරාධනා එද්දී නෙලුම්ගේ හිතේත් බලු පැටියෙක් හැදීමට ආසාවක් ඇතිවුණේය.

**"ඉතින් බලු පැටියෙක් හදන්න හිතුණට පස්සෙ ආයෙත් කීපදෙනෙක් කිව්වා, එක්කෙනෙක් නෙවේ දෙන්නෙක්ම හදන්න කියලා. ඉතින් ඒකටත් 'හා' කියලා පැටව් දෙන්නෙක්ම ගේන්න කිව්වා. ඊටපස්සෙ සපත්තු පෙට්ටියකට දාලා ඔන්න චූටිම චූටි බලු පැටව් දෙන්නෙක් මට ගෙදරට ගෙනත් දුන්නා. එයාලා දෙන්නට නම් දෙකකුත් ලැබුණා, 'වයිටියි, බ්‍රවුනියි' කියලා. පුදුම වැඩේ කියන්නේ මේ දෙන්නා ගෙදරට ආවට පස්සෙ මට ජීවිතේ මොකද්දෝ වෙනසක් දැනුණා. ඒක අමුතු ජීව ගුණයක් වුණා. එයාලා නටන, සෙල්ලම් කරන, දුවන පනින දිහා බලා ඉන්නකොට හිත පුදුමාකාර විදිහට සැහැල්ලු වුණා. ඒත් එක්ක මට හිතුනා සත්තුන්ට අපි කරුණාවන්ත වෙන එකෙන් ඒ ගොල්ලො කොයිතරම් සතුටක් ලබනවද කියලා."**

ඒ නිසාම ඇය මේ පැටවුන් දෙන්නාට කෑම දී ඉතුරුවෙන කෑම ටික ගේට්ටුවෙන් පිට තබන්නට ගත්තාය. පාරේ කුසගින්නේ සිටි බල්ලෙක් පැමිණ හැමදාම ඒ කෑම ටික කෑවේය. දින ගතවෙද්දී ගේට්ටුවෙන් පිටත තබන කෑම කන්නට තවත් බඩගිනිකාරයෝ එතැන ඉව අල්ලමින් සිටිනු නෙලුම් දුටුවාය.

**"ඔය විදිහට දවසින් දවස එක්කෙනා දෙන්නා වැඩිවුණා. කොහොමහරි දවසකට බල්ලො දෙළහක් දහතුනක් විතර ගේට්ටුව ළඟට එන්න පටන් ගත්තා. මං අපේ දෙන්නට හදන කෑමවලටම තව හාල් ටිකක් වැඩියෙන් දාලා ඒ ගොල්ලන්ට හැමදාම කෑම දුන්නා. හැබැයි බේකරිය හන්දියේ හිටපු අයට කලාපුර පාරෙ අය එන්න දෙන්නෙ නෑ. එයාලා එද්දි මෙයාලා හපලා රණ්ඩු වෙනවා. ඉතින් ඒ හින්දා මං ඒ අයටත් කෑම හදලා කා අතේ හරි යවනවා."**

මේ අවුරුදු තිස්පහටම ඇය ඒ පුරුද්ද නොකඩවා කරන්නීය. අදටද ගල්කිස්ස බේකරි හන්දියේ ඉන්නා බල්ලන් දස දෙනෙකුට පමණ ඇය හදාදෙන කෑම ටික ගෙන ගොස් දෙන්නේ සීටීබීයේ රියදුරු මහතෙකි.

**"වයිටියි බ්‍රවුනියි හදන්න ගත්තට පස්සෙ ගෙදරත් තව බල්ලො හැදුවා. සමහර වතාවල්වල දාහතරක් ඉඳලා තියෙනවා. ඒ කාලෙ මං පාරවල්වල දාලා යන පැටව් ගෙනල්ලා බේත් විදලා පත්තරේ ඇඩ් දානවා, 'එන්නත් කරන ලද බලු පැටවුන් නොමිලේ දෙනු ලැබේ' කියලා. හොඳ තැන්වල නෝනලා මහත්තුරු ඇවිත් පොතයි බලු පැටවිනුයි අරන් යනවා. වතාවක් සිබිල් වෙත්තසිංහ නෝනත් ඇවිත් බලු පැටව් දෙන්නෙක් අරන් ගියා. මගේ පොතක් තියෙනවා 'බලු පොත' කියලා. ඒ පොතේ එදා මෙදාතුර මම ගෙවල්වලට දුන්න සියලු බලු පැටවින්ගෙ සහ ගත්ත අයගෙ විස්තර තියෙනවා. ඔය දේවල් කරනකොට මිනිස්සු ඒ කාලෙ මගෙ ගේට්ටුව ළඟින් බලු පැටව් පෙට්ටි පිටින් තියලා ගියේ. තව ගෑනු කෙනෙක් බල්ලෙක්ව මගේ ගේට්ටුවේ ලණුවකින් ගැටගහලා ගිහින් තියෙනවා. ඒ ඔක්කොටමත් හොඳ ගෙවල් හොයලා දුන්නා. ඒ තත්ත්වය අඩු කරගත්තේ සීසීටීවී හයිකරලයි."**

පාරේ අසනීපෙන් සිටින සතුන්ට ප්‍රතිකාර කිරීමත්, නිවෙස් හොයනතුරු තාවකාලික තැන්වල නවත්වා බලාගැනීමත් ඇය විසින් කළාය. ඇයට මුලින්ම රෙක්ස් හමුවන්නේ එවන් තැනකට ගිය අවස්ථාවකයි. ඒ 2015දීය.



**"ටෙම්ප්ලර්ස් පාරේ සත්තු නවත්තන බෝඩිමකදී තමයි මං රෙක්ස් මුලින් දැක්කෙ. හරි ලස්සන ජර්මන් ෂෙපර්ඩ් කෙනෙක්. ගාර්ඩ්න් එකේ තනියම තමයි හිටියෙ. හිටිහැටියෙ එයාව පේන්න නැතුව ගියා. මං එයා කෝ කියලා ඇහුවත් පිළිතුර වුණේ දන්නෙ නෑ කියන එක. බාර දුන්න අය එන්නෙත් නෑ කිව්වා. සල්ලි ගෙවන්නෙත් නෑ කිව්වා. එච්චර කැමැත්තකින් සතා ගැන කතා කළේ නෑ. දවස් දෙකකට පස්සෙ මං වාහනෙන් යද්දි දැක්කා රෙක්ස් ඒ කිට්ටුව කාණුවකට වැටිලා දඟලනවා. මට පපුව පත්තුවුණා. මං සතා හිටපු තැන අයට කතා කළා. එයාලා කිව්වෙ මට ඕන නම් ගන්න කියලා. ඒත් ඒ වෙනකොට මටත් ගෙදරින් තවත් බල්ලො ගේන්න එපා කියලා තහනම් කරලා හිටියෙ. මං ගෙදර ගිහින් කට්ටියට මොකුත් නොකියා අඬන්න ගත්තා."**

ඇගේ ඇඬුමට හේතු අසා, කාරණාව දැන වාද විවාද කොට අවසානයේ රෙක්ස්ව නිවසට ගෙන එන්නට කැමැත්ත ලැබුණේය. ඇය ගෙදර සේවිකාව සමඟ ත්‍රීරෝද රියකින් ගොස් කාණුවේ වැටී දඟලමින් සිටි රෙක්ස් නිවසට ගෙන ආවාය.

**"එයා ජරාව නාගෙන දඟල දඟල හිටියෙ. ඒ වෙනකොට මං තේරුම් ගත්තා එයාට ලෙඩක් කියලා. නැගිටින්න බෑ. පැත්ත වැටිලා හිටියෙ. මං එයාව ඩොක්ටර්ස්ලා දෙන්නෙක් ගාවට අරන් ගියා. දෙන්නම කිව්වෙ එයා සනීප කරන්න බෑ. මොළය ඩැමේජ් වෙලා තියෙන්නේ, සතියයි ජීවත්වෙන්නෙ කියලා. මෙයා හරිම කෙට්ටුවට හිටියෙ. මං ගෙදර අරන් ආවා. දුන්න බෙහෙත් පොවන ගමන් මිනිස්සු ශක්තිය එන්න බොන විටමින් එකක් දුන්නා. සතියෙන් මැරෙයි කියපු රෙක්ස් දවස් තුනෙන් නැගිටලා ඇවිදින්න ගත්තා. ඊටපස්සෙ ආයෙ ඩොක්ටර් ළඟට අරන් ගියා. එයා ප්‍රකෘති තත්ත්වයට පත්වෙයි. හැබැයි ෆිට් එක හොඳවෙන්නෙ නෑ. මෙයාව නිතරම අඳුරු තැනක තියන්න කිව්වා. ගෙදර ඇවිත් මමයි, නංගිගෙ දුවයි ගෙදර කොරිඩෝරයක් රෙදි වටකරලා අඳුරු කරලා රෙක්ස් ඒකෙ තිබ්බා."**

සතිය, දෙක මාස ගණන් අවුරුදු හතරක්ම ගෙවුණේය. නෙලුම්ගේ ජීවිතේ වැඩි හරියක් රෙක්ස්ට ඇරුණේය. අසනීපව සිටි රෙක්ස් හැඩවැටී ලස්සනම ලස්සන බව් කොල්ලෙක් වුණේය.

**"දැන් අවුරුදු හතරක්. රෙක්ස් ඉතාම හොඳින් ඉන්නවා. හැමදාම දෙන්න බෙහෙත් තියෙනවා. ඒවා නොදුන්නොත් ෆිට් එක හැදෙනවා. මාත් එක්ක සමහර වෙලාවට තරහයි. හැමතිස්සෙම බේත් පොවන නිසා. මාව හොඳට අඳුරනවා. කොහේ හරි ගිහින් ඇවිත් ගේට්ටුව ඇරගෙන එද්දි දුවගෙන එනවා. ආදරේ පෙන්නනවා. ඒ වගේමයි හිටපු ගමන් මාව හපනවා. එයා ඇක්ටිව් වෙන්න හැදුවට සාමාන්‍ය බල්ලො අතරෙ අසාමාන්‍යයි. මිනිස්සු සත්තු හදලා ලෙඩ දුක් හැදුනම පාරට විසි කරන්නෙ නැති කාලයක් කවදා එයිද?"**

එසේ ගෙදර හැදූ සතෙක් ලෙඩ වී පාරට දැමූ පසු සතාට දැනෙන හැඟීම නෙලුම් නම් දන්නේය. අනෙක් අයටත් එය අවබෝධවන්නේ නම් රෙක්ස් වැනි තවත් සතුන් පාරට වැටීම වැළකී යනු ඇත. නෙලුම්ලා වැනි අයෙකුගේ ඇස නොගැසුණහොත් එවැනි සතුන්ට සිදුවන්නේ දුක් විඳ මහමග හෝ කාණුපල්ලක දුක් විඳ අවසන් ගමන් යන්නටය.

**බියංකා නානායක්කාර**



එයා ජරාව නාගෙන දඟල දඟල හිටියෙ. ඒ වෙනකොට මං තේරුම් ගත්තා එයාට ලෙඩක් කියලා. නැගිටින්න බෑ. පැත්ත වැටිලා හිටියෙ. මං එයාව ඩොක්ටර්ස්ලා දෙන්නෙක් ගාවට අරන් ගියා. දෙන්නම කිව්වෙ එයා සනීප කරන්න බෑ. මොළය ඩැමේජ් වෙලා තියෙන්නේ. සතියයි මෙයා ජීවත්වෙන්නෙ කියලා

# දෙවියෝ අපිට දරුවෝ දුන්නේ

## අපිට බැරිවුණ දේවල් එයාල ලවා කරගන්න නෙවෙයි



**අද බොහෝ කාන්තාවන් කාර්යබහුලය. ඒ නිසාම දැනුවත්ව හෝ නොදැනුවත්ව ඒ අයගේ ජීවිතවලින් සතුට සහ ආදරය අන් හැමදේටම පෙර පලා යයි. නමුත් පුංචි පුංචි දේවල්වලින් සතුටු වෙන්නට පුරුදු විය හැකිනම් ඒ ඕනෑම කෙනෙකුගේ ජීවිතය හිතනවාට වඩා සුන්දර එකක් වනු ඇත. විදෙස් රටක ජීවත් වන හෂිනි මේ කියන්නේ ඕනෑම අම්මා කෙනෙකුට, ඕනෑම බිරිඳකට එසේ සතුටින් දිවි ගෙවිය හැකි ආකාරයයි.**

ඉස්කෝලෙ යන කාලේ මම ඉගෙනගන්න වැඩවලට ගොඩක් දක්ෂ කෙනෙක් නෙවෙයි. සාමාන්‍ය පෙළ පාස් කරගත්තෙත් කොහොමහරි උසස් පෙළ විභාගය කරන්න ඕන නිසා. හැබැයි ඊට වඩා උනන්දුවෙන් ඉගෙනගත්තා නම් අරම කරන්න තිබ්බා, මෙහෙම කරන්න තිබ්බා කියලා පස්සෙ කාලෙක හිතුන අවස්ථා නැතුවම නෙමෙයි. ඒ නිසාමද කොහෙද මගේ දරුවන්ට හොඳින් ඉගෙනගන්න කියලා කරන පොඩි පොඩි බලපෑම් මගෙන් වුණා.

**තරඟකාරී බවට ඔරොත්තු දෙන දරුවෙක් හැදුවොත් එයා අනිත් මිනිස්සුන්ට මොනවා වුණත් කමක් නෑ කියලා එයාගෙ ගමන යයි. හැබැයි හොඳ ගුණධර්ම ඇති දරුවෙක් හැදුවොත් එයා අනිත් මිනිස්සුන්ගෙ දුක වේදනාව අඳුනන කෙනෙක් වෙයි**

අපි මැලේසියාවේ හිටියේ කොරෝනා දරුණුවට ව්‍යාප්ත වෙන කාලෙක. ඉස්කෝල වහලා, ඔන්ලයින් ක්‍රමයටයි ඉගැන්වීම් කළේ. සමහර දවස්වලට දහම් වුණත් ගෙදර ඉඳගෙනයි වැඩ කළේ. එහෙම එක දවසක ගෙදර පාන් පැකට් දෙකක්ම තිබ්බ නිසා දවල්ට පාන් කන්න තීරණය කරලා, සැන්ඩ්විච් හදන්න ලෑස්ති වුණා. නතාරී දූ මට කිව්වා එයාගේ දවල් කෑම විවේකේ එනකල් ඉන්න, එයාට සැන්ඩ්විච් හදන්න ආසයි කියලා. මේ පින්තූරේ තියන සැන්ඩ්විච් මං එක්ක එකතු වෙලා හැදුවේ එයා. මං පාන්වලට බටර් ගාද්දී එයත් ඒක බලන්ම කළා. සැන්ඩ්විච් ටික කපන්න ලෑස්ති වෙද්දි ඒකත් එයාටම කරන්න ඕන කිව්වා. එයාගේ අතින් අල්ලන් මං සැන්ඩ්විච් ටික පිහියෙන් කැපුවා. අන්තිම එක එයාට තනියෙන් කපන්න දුන්නා. මං කෑම මේසෙට යවන්නෙ හැඩවැඩ දාලා නිසා එයාටත් එහෙම කරන්න ඕන කියලා පොඩි මිංචි කොළයකුත් තියලා හරි ආඩම්බරෙන් අරන් ගිහින් මේසෙන් තිබ්බා. දහම් එදා නතාරී දුවට හරියට ප්‍රශංසා කළා. එතකොට මූණේ හිනාව තවත් වැඩි වුණා.

එදාම මං නතාරී දූගෙ යාළුවාගෙ වැඩක් එයාගෙ වැඩක් එක්ක සංසන්දනේ කරලා කියපු කතාවක් දහම් අහගෙන ඉඳලා තිබුණා. ඊටපස්සෙ දරුවෝ ළඟ නැති වෙලාවක කතා කරලා මෙන්න මේ විදියට කිව්වා.

**“රෝසි කවදාවත් අපේ දරුවන්ව තව දරුවෙක් එක්ක සංසන්දනය කරන්න එපා, මං ඒකට ආස නෑ. හැම දරුවාම ඉගෙනගන්න දක්ෂ නෑ. දක්ෂ නැති දේකට පොළඹවලා දරුවට ඒ වැඩේ එපා කරන්න එපා. ආස හිතෙන විදියට ඒ වැඩ කරන්න ආදෙරෙන් කියලා දෙන්න. මට මගේ දරුවෝ පන්තියේ පළවෙනියා වෙන්න ඕන නෑ, එයාලට සාමාන්‍ය දැනීම, සමාජ දැනීම තිබ්බාම හොඳටම ඇති. අනිත් ළමයි එක්ක තරඟ කරන දරුවෙක් හදන්න මට ඕන නෑ. අපි කැමති දේ එයාලා ලව්වා කරවන්නෙ නැතුව, එයාලා කරන්න ආස දේට උදව් කරලා ඒකෙන් එයාලා දිනන විදිය බලලා සතුටු වෙමු. එයාලා ඉගෙනගන්න ආසයි නම් ඒකටත් උපරිම සහයෝගය දෙමු, ඉගෙනගන්න වැඩවලට බලෙන් යොමු කරන්නෙ නැතුව, ඉගෙනගන්න දේවල්වලින් ජීවිතේට අවශ්‍ය මූලික දැනුම තේරුම් කරලා දෙමු. අද ඔයා නතාරීට ලස්සනට සැන්ඩ්විච් හදන්න කියලා දුන්න එක කොච්චර ශෝක්ද? දවසක් ඔයා ලිප ගැන දූලා දෙන්නාට කියලා දුන්නා. මයික්‍රෝවේව් එක ඔන් ඕෆ් කරන විදිය කියලා දුන්නා. දවසක් නතාරී උදේ වරුවක ඔයා ගෙදර නැති වෙලාවක අපි තුන්දෙනාටම පාන්වලට ජෑම් ගාලා දුන්නා. ඒ ඔයාගෙන් පුරුදු වෙලා. ඒවා හොඳ දේවල්. එයාට අවුරුදු හතයි. අපි මේ තුන්දෙනා ආස දේවල් කරන්න උදව් කරමු. එතකොට එයාලට අපි ගැන ලස්සන මතක ඉතුරු වේවී.”** ලොකු පාඩමක් හරිම ආදරෙන් දහම් මට කියලා දුන්නෙ එහෙමයි. අම්මලා අතර මාව හොඳ අම්මා කෙනෙක් කරන්නේ එයා කියලා කලින් ලිපියකත් මං ලිව්වේ ඒකයි. මේවා දහම් මට කිව්වෙ දරුවෝ නිදාගත්තාම, ඒ සිද්ධිය වුණ වෙලාවෙදිම නෙවෙයි. එවලෙම කිව්වා නම් ඒකෙන් මගෙයි දරුවාගෙයි බැඳීම පලුදු වෙලා මං ගැන අමිහිරි මතකයක් දරුවාගේ හිතේ ඉතුරු වෙන්න තිබ්බා.

**දහම් එදා දරුවා ඉස්සරහම මට ඒ කතාව කිව්වා නම් දරුවාගෙයි මගෙයි බැඳීම පලුදු වෙන්නත් තිබුණා**



නතාරී දූගෙන් ලොකු වුණාම කවුරු වෙන්න ආසද කියලා ඇහුවාම එයා කියන්නේ Cake Shop එකක් දාන්න ඕනේ කියලා. ලොකු වෙද්දි මේ දේවල් වෙනස් වෙයිද කියන්න දන්නේ නෑ. ඒත් මං හිතාගත්තා එයා ආස හොඳ දේට උදව් කරලා එයාව දිනවනවා මිසක්, මට කරන්න බැරි වුණ දේ එයා ලව්වා කරවගෙන මගේ හිත සතුටු කරන් දරුවාගේ හිතට දුකක් දෙන්නේ නෑ කියලා.

මං මේ කියන්නේ දරුවට උයන්න පුරුදු කරන්න කියලා නෙවෙයි. වැරදි දෙයක් නෙවෙයිනම් එයාලා ආස දේ කරලා ජීවිතේ ජයගන්න දෙමව්පියෝ විදියට උපරිම සහයෝගය දෙන්න කියලා. අනිත් වැදගත්ම දේ අපි දරුවෝ වෙනුවෙන් කැපවෙනවා කියලා කරන්නෙම දරුවන්ගෙ සතුට නැතිවෙන දේවල් නම්, එයාලගෙ පුංචි මනසට වදදෙන දේවල් නම් ඒ කැපකරීම්වල වටිනාකමක් නැතුව යනවා. ඒ වගේම අපි කරන කියන දේවල් වෙනුවෙන් ආපස්සට දරුවන්ගෙන් දේවල් බලාපොරොත්තු නොවී ඉන්න පුළුවන්නම් හොඳයි. දරුවන්ට අනවශ්‍ය පීඩනයක් දීලා තරඟකාරී බවට ඔරොත්තු දෙන දරුවෙක් හැදුවොත් එයා අනිත් මිනිස්සුන්ට මොනවා වුණත් කමක් නෑ කියලා එයාගෙ ගමන යයි.

හැබැයි හොඳ ගුණධර්ම ඇති දරුවෙක් හැදුවොත් එයා අනිත් මිනිස්සුන්ගෙ දුක වේදනාව අඳුනන කෙනෙක් වෙයි. ඉල්ලුවෙ නැතත්, බලාපොරොත්තු නොවුණත් දෙමව්පියන්ට ආදරෙන් සළකන දරුවෙක් වෙයි. ඒ නිසා දෙමව්පියන්ට ආදරෙන් සළකන දරුවෙක් වෙයි. ඒ නිසා දෙමව්පියෝ විදියට දරුවන් වෙනුවෙන් කරන අසීමිත කැපකිරීම් අතරේ පුළුවන් තරම් ඒ ගැනත් හිතන්න.

**හෂිණී මනමේන්ද්‍ර**



## ‘මෙන්න ඔයාගෙ අලුත් ප්‍රභාකරන්’ කියලා

# නර්ස් පුතාව මගේ අතට දුන්නා



කොටි සැකකාරියක් ලෙස අත්අඩංගුවට ගත් ලෝජිනීට එරෙහිව ඒ වනවිට නීතිය ක්‍රියාත්මක වෙමින් තිබුණි. එකල හදිසි නීතිය ක්‍රියාත්මක වෙමින් පැවති යුගයකි. ඒ නිසා ලෝජිනී ඇතුළු පිරිස අත්අඩංගුවට ගෙන රිමාන්ඩ් භාරයේ සිටියද එය නීතියට යටත්ව කළ යුතු විය.

**“රත්ගමට ගියාම ලොකු පාළුවක් දැනුණා. වරාය පොලිසියේ ඉද්දී සෙල්වි ළඟ හිටියා. පොලිසිය ඇතුලේ නිදහසේ කාලය ගත කරන්න ලැබුණා. රත්ගමට ගියාම ඒ නිදහස නැති වුණා. ඔහොම ඉද්දි දවසක කූඩුව ඇරලා මාව කාමරයකට එක්කරගෙන ගියා. මම හිතුවේ තවත් තැනකට ගෙනියන්නද දන්නෙ නැහැ කියලා. ඒ කාමරයේ පවුල් සෞඛ්‍ය සේවිකාවක් හිටියා.**

**‘ඔයාද ලෝජිනී කියන්නෙ?’**

**ඔව් කියන්න වගේ මම ඔලුව වැනුවා.**

**ඊටපස්සේ විස්තර අහලා ලියාගත්තා. මට එච්චර සිංහල බැරි නිසා තේරෙන විදියට කීවා. පොලිසියේ අයත් කීවා. අන්තිමේදී මට ‘ක්ලිනික්’ කාඩ් දීලා උපදෙස් දුන්නා. එතැනින් පස්සෙ ඒ නිලධාරිනිය ඇවිත් මාව බලලා විස්තර අහලා උපදෙස් එහෙම දීලා යනවා. ක්ලිනික් ලීවේ මහමෝදර ඉස්පිරිතාලයට. ඔය අතර දවසක මට පීජ් එකට නගින්න කීවා. අල්ලපු කූඩුවේ ඉඳපු පිරිමි අයත් හිටියා. අපි සේරම උසාවියට එක්කරගෙන ගියා. පස්සෙ තමයි දැනගත්තෙ උසාවියට ඉදිරිපත් කරලා DO (Detection Order) ගැහුවා කියලා. රඳවාගැනීමේ නියෝග ගන්න මාසයකට සැරයක් වගේ අපිව උසාවියට එක්කගෙන යනවා. රත්ගම පොලිසිය ඇතුළෙ මාසයකට වඩා කාලයක් හිටියා. එහෙම ඉද්දි ආයෙත් මාව ගාල්ල වරාය පොලිසියට එක්කරගෙන ආවා.”**

වරාය පොලිසිය තුළදී පොලිස් නිලධාරියෙකු බැණ බැදීම නිසා රත්ගම පොලිසිය වෙත යාමට සිදුවූ බැවින් නැවත වරාය පොලිසියට ඇය පැමිණියේ මදක් චකිතයෙනි.

**“පොලිසියට ආවට පස්සේ දැනගත්තා මට බැණපු නිලධාරියා තාවකාලිකව ඇවිල්ලා හිටියා කියලත්, එයා ස්ථාන මාරුවක් ලබලා ගියා කියලත්. වරාය පොලිසිය ගෙදර වගේ පුරුදු නිසා සංතෝෂයෙන් හිටියා. බබෙක් ලැබෙන්න ඉන්න නිසා සැළකිලිත් ලැබුණා. ඔය අතර මහමෝදර රෝහලට මාව ක්ලිනික් එක්කරගෙන යනවා. එහෙම යද්දි කාන්තා නිලධාරිනියකුයි පිරිමි නිලධාරියෙකුයි යනවා. ඒ අය මගේ ගැන හිතලා එයාලත් සාමාන්‍ය ඇඳුමෙන් ඇවිත් තමයි ඩොක්ටර්ට මාව පෙන්වන්නෙ. මම එද්දි ක්ලිනික් ආපු සිංහල අම්මලා ගොඩක් ඉන්නවා. ඒත් මම සිරකාරියක් කියලා ඒ අම්මලාට තේරෙන්නෙ නැති විදියට තමයි මාව තියාගෙන හිටියේ. ඩොක්ටර් මා ගැන දන්නවා. ඒත් එයාගෙත් කිසිම වෙනසක් නැහැ. හැබැයි මට නම් දුක හිතෙන දේවල් සිදුවුණා.”**

**“ඒ මොනවාද?”**

**“ගොඩක් අම්මලා ක්ලිනික් එන්නෙ එයාගෙ සැමියත් එක්ක. ඉතින් වෙලාව එනකම් එයාලගෙ දේවල් කතා කර කර ඉන්නවා. ඒ අතර ඒ අම්මට ඕන දේවල් සැමියා ගෙනල්ලා දෙනවා. ඒ වෙලාවට ‘රූබන් මගේ ළඟ හිටියනම්’ කියලා හිතෙනවා. හැබැයි ඒ වෙද්දි සති දෙකකට සැරයක් රූබන්ට ගාල්ලට ඇවිත් මාව හමුවෙන්න අවසර දීලා තිබුණෙ. ඒ නිසා රූබන් ආවම මගේ අඩුපාඩු බලනවා. බබා ලැබෙද්දි ඉස්පිරිතාලයට ගෙනියන්න ඕන බඩු ලැයිස්තුව ක්ලිනික් එකේදි මට ලැබුණා. ඒ ලැයිස්තුවෙ තිබුණ බඩු සේරම රූබන් මට ගෙනැල්ලා දුන්නා. ඔය විදියට යද්දි දන්නෙම නැතිව බබා ලැබෙන්න ඕන කාලයත් ළංවුණා. පොලිසියේ OIC මහත්තයා ඒක අහලා පොලිසියේ අයව දැනුවත් කරලා තිබුණෙ මගේ ගැන සෝදිසියෙන් ඉඳලා උදව් කරන්න කියලා. OIC මහත්තයාගේ කාර් එක තිබුණොත් පොලිසියේ. ‘මේ ළමයව හදිසියේම ඉස්පිරිතාලයට අරගෙන යන්න වුණොත් මගේ කාර් එකේ එක්කරගෙන යන්න’ කියලා කාර් එකේ යතුරක් දීලා තමයි ගෙදර යන්නෙ. මට දිනය දීලා තිබුණෙ 2010 මැයි 25ද. මැයි 07ද ක්ලිනික් යන්න තිබුණා. පහුවෙනිද ක්ලිනික් යන්න සූදනමින් ඉද්දි පාන්දර 4.30ට විතර ටිකක් අසනීප ගතිය ආවා. මම ඒක අපිත් එක්ක ඉඳපු කාන්තා නිලධාරිනියට කීවා. එයා අවුරුදු 20-22ක විතර වෙන පොලිසියට අලුතෙන් බැඳුන ළමයෙක්. එයාට වැඩි තේරුමක් නැහැ. එයත් කල්පනා කරනවා. ඊටපස්සෙ මාත් එක්ක ඉඳපු සෙල්වි අක්කට කීවා.”**

### එල්.ටී.ටී.ඊ මරාගෙන මැරෙන කොටි කාන්තාවක් ධරණී ට කියයි

**මෙතෙක් කතාව**

*ලෝජිනීගේ උපන්ගම කොටි සංවිධානයේ යුද මර්මස්ථානයක් වූ මුලතිව් මුල්ලියවලෙයි ග්‍රාමයයි. ලෝජිනීව රවටාගෙන එල්.ටී.ටී.ඊ සංවිධානයට බඳවා ගන්නා අතර පුහුණුවෙන් පසු සෝදියා බලකායට අනුයුක්ත කරයි.*

*සංවිධානය තුළ සිටියදී නොයෙකුත් හැළහැප්පීම් මැද දිවි ගෙවන ලෝජිනී සංවිධානය තුළ සිටි තම හොඳම මිතුරියන්ගේ වියෝවෙන් පසු මරාගෙන මැරෙන සෙබළියක ලෙස පුහුණුවීම් අරඹා එම පුහුණුව සාර්ථකව නිම කරයි. හමුදා ප්‍රහාර හමුවේ කඩා වැටෙන එල්.ටී.ටී.ඊ සංවිධානය අවසාන මාස කිහිපයේදී ලෝජිනී වව්නියාවට සංක්‍රමණය කරවන්නේ ඇගේ මරාගෙන මැරෙන ඉලක්කය ලැබෙන තෙක් එහි සිටින ලෙස දන්වමිනි.*

*එහිදී ඇගේ බාරකරු වන්නේ සුගන්දන් නම් ඕලන්දයේ සිටින දෙමළ ජාතිකයකු වන අතර දිනෙන් දින සිදුවූ එල්.ටී.ටී.ඊ සංවිධානයේ කඩාවැටීම හමුවේ ඔහුද ලෝජිනී පිළිබඳ සොයා බැලීම නවතා දමයි.*

*ඒ අතර වව්නියාවේදී දැන හඳුනා ගන්නා රූබන් නම් ත්‍රිරෝද රථ රියදුරා සමග ප්‍රේම සබඳතාවයක් අරඹන ලෝජිනී තමන් මරාගෙන මැරෙන සෙබළියක් බව ඔහුට සඟවා ඔහු සමග විවාහ වෙයි. උතුරේ යුද හමුදා ප්‍රහාර දරුණු වීමත් සමඟ කොටින්ගේ සංවිධාන ජාලය බිඳ වැටීම නිසා ලෝජිනී හා කොටි සංවිධානය අතර සන්නිවේදනයද බිඳ වැටේ. එහිදී LTTE සංවිධානයේ නීතිරීතිවලට පටහැනිව කටයුතු කරමින් ලෝජිනී රූබන් සමඟ විවාහ වේ. ඒත් සමඟ හමුදා අත්අඩංගුවට පත්වීමේ අවදානම සමඟ LTTE විසින් තමාව ඝාතනය කරතැයි බිය සමඟ ලෝජිනී සිය විවාහ දිවිය ගත කරන්නීය.*

*මේ අතර කොටි ත්‍රස්තවාදය පරාජය කර ජයගත් රජයේ ඊළඟ අරමුණ වන්නේ සඟවා සිටින අවි ආයුධ හා එල්.ටී.ටී.ඊ. සාමාජිකයින් අත්අඩංගුවට ගැනීමයි. එහි ප්‍රතිඵලයක් ලෙස ලෝජිනීගේ හිතවතියක වූ කවිදා ත්‍රස්තවාදී විමර්ශන ඒකකයේ නිලධාරීන්ගේ අත්අඩංගුවට පත්වේ.*



ලෝජිනී

**අද එතැන් සිට....**

සෙල්වි යනු කොටි සංවිධානය විසින් මරාගෙන මැරෙන්න පුහුණු කරන ලද කාන්තාවක වූ බැවින් ගැබිනි මවකගේ තත්ත්වය පිළිබඳව කිසිඳු දැනුමක් තිබුණේ නැත.

**“ඉස්සරහ ඉන්න සර්ට කියන්න.”**

ලෝජිනී එලෙස පවසන ලද්දේ රාත්‍රී පැමිණිලි අංශය භාරව සිටින පොලිස් නිලධාරියා පිළිබඳවය. එහි සිටි නිලධාරියාවරයා සිය ස්ථානාධිපතිවරයා දැනුවත් කිරීමට ක්‍රියා කළේය.

**“මේ සිද්ධි වෙද්දි දුරකතනයක් ඉල්ලාගෙන ගෙදරට කතා කරලා විස්තරය කීවා. ඒ එක්කම පොලිසියේ කෙනෙක් ඇවිත් ඉක්මනට හොස්පිටල් යමු කියලා කාන්තා නිලධාරිනිය එක්ක මට OIC මහත්තයාගේ කාර් එකට නගින්න කීවා. මහමෝදර ඉස්පිරිතාලයට යද්දි එළිවෙලා. එහෙමම ලේබර් රූම් (සූතිකාගාරය) එකට ගනිද්දි උදේ 6.30යි. උදේ 6.55ට බබා ලැබුණා. එතන හිටපු නර්ස් කෙනෙක් ‘මෙන්න ඔයාගෙ අලුත් ප්‍රභාකරන්’ කියලා හිනාවෙලා පෙන්නුවා. එතකොට මට හිතුණා පුතෙක් තමයි කියලා. රෝහලේ ඉඳපු අය මම කවුද කියලා දන්නවා. ඒත් කිසිම වෙනසක් නැතිව හොඳට සැළකුවා. ගෙදරට විස්තරය කියලා පණිවිඩය දුන්නා.**

**‘මම දැන්මම පිටත්වෙනවා ලෝජිනී. ඔයා පරිස්සමින්’ කියලා රූබන් කීවා.**

**රූබන් එවෙලෙ පිටත්වෙලා තිබුණා. රෑ වෙද්දි ඉස්පිරිතාලෙට ආවා. එදා රෑ රූබන් ගාල්ලෙ හෝටලයක නැවතුණා. උදේ වෙද්දි මට කිසිම අමාරුවක් නැහැ. මට තේරුණා මම රෝහලේ ඉද්දි මගේ ආරක්ෂාව ගැන පොලිසියට ප්‍රශ්නයක් කියලා. එයාලා වෛද්‍යවරු එක්ක ඒ ගැන කතා කළා. රූබන් උදේම ඇවිත් ඉස්පිරිතාලෙ පොතේ අත්සන් කරලා මගේ ටිකට් කැපුවා. එතැනින් කෙළින්ම ගියේ වරාය පොලිසියට. හරියට බැලුවොත් රෝහලට ගිහින් දවසක් ඇතුළත දරුවත් ලැබිලා ටිකට් කපාගෙන ආවා. රෑ වෙද්දි තාත්තා, අක්කා, අක්කගෙ දරුවො එහෙම ආවා.”**

### ක්ලිනික් ආපු සිංහල අම්මලා ගොඩක් ඉන්නවා. ඒත් මම සිරකාරියක් කියලා ඒ අම්මලාට තේරෙන්නෙ නැති විදියට තමයි මාව තියාගෙන හිටියේ

සිය සැමියා, පියා, සහෝදරියන් පැමිණි පසු සියලුදෙනා කාලය ගතකරන ලද්දේ සතුටිනි.

**“දැන් කොයිවෙලාවේ හරි ඔයාලට යන්න කියාවි. එතකොට මේ සතුට ඉවරයි.”** ලෝජිනී කීවාය.

නමුත් පොලිස් නිලධාරීහු එතරම් අකාරුණික වූයේ නැත.

**“ලෝජිනී ඔයාගෙ මහත්තයා, තාත්තා, අක්කාට මෙහෙම අද රෑ ඉන්න කියන්න. පුළුවන් විදියට පහසුකම් දෙන්නම්.”**

පොලිසියෙන් කීවේය.

**“එදා රෑ මගේ ජීවිතේ සතුටුම රාත්‍රිය. මම සිරකාරියක්. ඒත් අලුත උපන් කිරිකැටි පුතා එක්ක මගේ මහත්තයා, තාත්තා, පවුලේ අය එක්ක රාත්‍රිය ගත කරන්න ලැබුණ ලෝකේ එකම සිරකාරිය මම වෙන්න ඇති කියලා මට හිතෙනවා. එදා රෑ අපි ඉඳපු කාමරය මම දැක්කෙ සුරවිමනක් වගේ. ඒ අතර මගේ පුතාව කට්ටිය සැරින් සැරේ අත ගානවා, ඉඹිනවා. ඊට වඩා සතුටක් අම්මා කෙනෙක්ට තියෙනවාද?”**

ලෝජිනී කීවාය.

**සනත් ප්‍රියන්ත**

# චූටි දූට ලස්සන ගවුමක්

මෙම ගවුම් මෝස්තරයේ බ්ලවුසය සහ සාය වෙන් වෙන් වශයෙන් නිර්මාණය කරගන්න.

බ්ලවුස් එක නිර්මාණය කරගැනීමේදී සාමාන්‍ය බ්ලවුස් එක නිර්මාණය කරගත් ආකාරයට ඉන දක්වා උස ගෙන පිටුපස සහ ඉදිරිපස නිර්මාණය කරගන්න.




පිටුපස සාදා ගැනීමේදී පිටුපස මැද්දට ෂිපර් එකක් ඇල්ලීම සඳහා මැදට මැහුම් වාසිය 1/2ක් වෙන්කර ඉදිරිපස පලුව නිර්මාණය කරගන්න.


සාය සෑදීමේදී ප්ලෙයාඩ් සාය නිර්මාණය කරගෙන බ්ලවුස් එකට තබා ඉන මූට්ටු කරගන්න.


සායේ ඉන රැලි කරගැනීමට අවශ්‍යයි නම් ඉන මිම්මට තවත් ඉනෙන් බාගයක් එකතු කර එන අගය 3න් බෙදා අරගන්න.


**පාඩම් අංක 25**








ප්‍රවීණ ඇඳුම් මෝස්තර නිර්මාණ පුහුණු දේශක
සහ බතික් කලාව පිළිබඳව පුහුණු දේශක
**චමින්ද කුමාර**
*You tube -*
*Smart Fashion Lanka*

# පවුල් ප්‍රශ්න නිසා ඔබ සිත් තැවුලෙන්ද ?

- පවුලේ ඇති වන සියලුම ගැටලු වලට විසඳුම්
- මත් කුඩු සුරාව නවතා දැමීමට
- පවුලේ දියුණුවට
- අඹු සැමියන් අතර ආරවුල් වලට විසඳුම්
- ව්‍යාපාර දියුණුවට හා නොවිකිණෙන ඉඩම් විකිණීමට
- 2022 / 2023 සියලු විභාග සමත් වීම සඳහා විමසන්න
- නිවාස ආරක්ෂාවට හා පවුලේ දියුණුවට
- රැකියා ලබාගනීමට
- හැරගිය අය ගෙන්වීමට
- අයුතු සබඳතා නැවැත්වීමට

**ක්ෂණික ඇමතුම් -0777 444908**

බිංගිරියේ ගුරු හාමුදුරුවෝ
සමග සේන මහතා 037 22 48 828
(පූජා භාණ්ඩ ඔබ විසින් සැපයිය යුතුය)

**හමුවීම**
සෙනසුරාදා - ඉරිදා
උදේ 8.00 සවස
- 3.00 දක්වා

ගමන් මාර්ගය නාරම්මල සිට කුලියාපිටිය පාර, වැවගම හෙට්ටිපොළ කුලියාපිටිය බසයක නැග හොරොම්බා හන්දියෙන් බැස මැට්වල ගෙදර පාරේ මීටර් 50 ඉදිරියෙන් ගුරුගල්ගොඩ මෝලවත්ත කාර්යාලය පිහිටා ඇත.

careteker
— Guru Dewa Shanthi Services —
Post Code No ' 60181
Gurugalagoda "Molawatta"
Horombawa

භාරකාරතුමා
"ගුරුදේව ශාන්ති සේවාව"
තැ. ස අංකය 60181
ගුරුගල්ගොඩ
මෝලවත්ත
හොරොම්බාව

විදේශගත අයගේ රැකියා, ගේ දොර ඕනෑම ප්‍රශ්නයක් සඳහා මුහුදෙන් එතරට බලපාන පරිදි සකසා DHL මගින් ඔබ අතට ඉක්මනින් එවනු ඇත
0094 37 22 48828

## නවක
**නළු නිලියන් අවශ්‍යයි**

මේ මස අගදී වෙන්නප්පුව අවට රූපගත කිරීමට නියමිත "වැලිකුලිය" ටෙලි නාට්‍යයේ ප්‍රධාන, වෙනත් චරිත සඳහා වයස 16 -27 තරුණ තරුණියන් අවශ්‍යයි.

21 බී, වයිඑම්බිඒ කොළඹ 08
0770 555 121
0701 658 125

## පංති
කතිර මැහුම් පංති
එක් පාඩමකට
RS. 350/-
076 28 84 448
කුමාරි වීරසේකර

## මල් බීජ
දේශීය කාළගුණයට හොඳින් ගැළපෙන හොඳින් මල් හටගන්නා නිරෝගී මල් බීජ අපෙන් .. අමතන්න
077 5413081

## ග්ලූකෝමා ඇතුළු සියලු ඇස් රෝග සඳහා ප්‍රතිකාර

පාරම්පරික අක්ෂි වෛද්‍ය
**බන්දු ලන්දෙගෙදර**



ලන්දේ ගෙදර වෙද පියස
ගැළණිගම අධිවේගී පිවිසුම් මාර්ගය අභියස, බණ්ඩාරගම.
071 141 3348 / 071 894 1027 / 038 225 6454
ප්‍රතිකාර කරන වේලාවන් උදෑසන 9.00 සිට සවස 7.00 දක්වා
Search on Youtube Dr. Landegedara

## උකස් රන් භාණ්ඩ
බේරාදී වැඩිම මිලට මිලදී ගනු ලැබේ.
කැරට් 24 - 121,000/-,
කැරට් 22 - 110,500/-
කැරට් 21 - 102,000/-
කැරට් 20, 18,14, 09. රජයේ ලියාපදිංචි ආයතනයකි.
077 28 49 889

## උකස් තැබූ රන් භාණ්ඩ
රන් වාසනා ගෝල්ඩ් හවුස් වෙතින් කැරට් 22 රන් පවුමකට
රු. 110,000/-
බොරු වලට හසු නොවන්න පොරොන්දු වූ මිලට ස්ථානයට පැමිණ මිලදී ගනු ලැබේ.
0770 53 58 42

## බැංකු ඇබෑර්තු
★ වාණිජ බැංකු ක්ෂේත්‍රයේ පවතින පුරප්පාඩු සඳහා ප්‍රාදේශීය මට්ටමින් විවිධ තනතුරු කිහිපයක අයදුම්පත් කැඳවේ.
★ අවම සුදුසුකම් O/L වේ.
★ වැටුප් සමග පුහුණුව.
★ රැකියාව තම ප්‍රදේශයටම.

මූ 35,000/-
18/40 ගැ/පි
(මෑන් පවර් නොවේ)

0702 231 694 | 0718 853 997
0712 564 715 | 0774 024 155
0715 947 191 | 0702 725 731

## රත්තරං-උකස්
සින්නවීමට යන රන් භාණ්ඩ ඔබ උකස් කල ආයතනයට පැමිණ වැඩිම මුදලට මිලදී ගෙන ඉතිරි මුදල ඔබ අතට
076 948 6355

## උකස් තැබූ
රන් භාණ්ඩ බේරාදී වැඩිම මිලට ගනුලැබේ
(රජයේ ලියාපදිංචි සහතික ඇත)
0773 593 380

## මෙවර සාමාන්‍ය පෙළ / උසස් පෙළ / ශිෂ්‍යත්වය ඇතුළු සියලුම විභාගවලින්

**විශිෂ්ට ජයග්‍රහණ ලබා ගැනීම සඳහා පැමිණ හමුවන්න.**

නැතහොත් ලිපියක් මගින් විමසන්න.
(පූජා භාණ්ඩ ඔබ විසින් සැපයිය යුතුයි.)

## ප්‍රේම සබඳතා බිඳවැටෙන්නේ ඇයි?
## ව්‍යාපාර/ගේ දොර පාළු වී යන්නේ ඇයි?
## අයුතු සම්බන්ධතා නිසා පවුල් අවුල් වන්නේ ඇයි?

# මෙන්න!
එයින් මිදෙන්න නිසි මඟක්...

අයුතු සම්බන්ධතා නැවතීම
- නිවාස ආරක්ෂා
- නඩුහබ දිනීමට
- දරුඵල ලබීමට

මත්කුඩු සහ සුරාව
- රැකියා ලබා ගැනීමට
- සියලු විභාග සඳහා
- නොවිකිණෙන ඉඩම් විකිණීමට

- විවාහ පමා අයට
- හැරගිය අය ගෙන්වීම
- අසාර්ථක ව්‍යාපාර දියුණුවට

# මාතර වෙද හාමුදුරුවෝ

ඔබ කුමන හෝ මත්ද්‍රව්‍යකට
**ඇබ්බැහි වූ අයෙක් ද?**
එසේ නම් ඉන් මිදීමට අමතන්න.
වරු තුනෙන් ප්‍රතිඵල පැමිණ හමුවන්න
**අමතන්න 077 362 77 14**

**හමුවීම**
බදාදා, සෙනසුරාදා
පෙ.ව. 8.00 සිට
ප.ව. 3.00 දක්වා

කුරුණෑගල, පොතුහැර චන්ද්‍රසේල පිරිවෙන් පුරාණ විහාරයේදී

ශාස්ත්‍රවේදී පණ්ඩිත **මාතර වෙද හාමුදුරුවෝ**

භාරකාරතුමා, ජනසෙත වෙද මැදුර, චන්ද්‍රසේල පිරිවෙන් විහාරය, කොළඹ පාර, පොතුහැර, කුරුණෑගල, පොතුහැර චන්ද්‍රසේල පිරිවෙන් පුරාණ විහාරයේදී

## පුතු ආ දිනය

මිහිරි මතක අලුත් වෙලා
පුතු ආවා අපෙ තුරුලට
පුතුනි ඔබේ සිනහව දැක
සිත යයි මගෙ
අතීතයට

පුතුනි ඔබේ පියාණනුත්
නුඹ වගේම සිනාසිසී
ආ දිනයද අද
වගේය

කාලය ඉගිලිලා ගියා
අපි දැන් වියපත්
වීලා

නුඹෙ සිනහව දකින විටදී
අතීතයම
මා ඉදිරියෙ

● **ශ්‍රියාණී හේවාවසම්**
**රත්නපුර**

## ආර්ථිකය

අනදි කල සිටම ලක්දිව බත බුලතින් සරු වී තිබුණා
සාඩම්බරයෙන් ඉන්දියන් සාගරයේ මුතු ඇටයයි කීවා
නොසිතූ නොපැතූ විලස මාරක වසංගතයක් ආවා
ජාති කුල භේද නොතකා වසංගතයට බිලි වූවා

මිල මුදල් රැකී රක්ෂා ක්‍රම ක්‍රමයෙන් නැති වූවා
දිනෙන් දිනම රට තුළ හිඟයක් ඇති වූවා
ඇස් කන් පියා ගත් පාලකයින් රට තුළ වැජඹීලා
අනාගත පරම්පරාවට අරාජික රටක් ඉතිරි කරලා

වැසියන් ඉදිරියේ මුසා බස් පවසා රවටාලා
දින දිනම ඔවුනොවුන්ගේ මඩි තර කරලා
ඉදින් කාටද කියන්නේ අප මෙම වියෝවා
දැන්වත් ඇස් හැර බලාපන් පාලකයනි එක්වීලා

● **වාසනා මායාදුන්නේ**
**රත්නපුර**

## අම්මෙ මං ඉක්මනට එනවා

අමාවකටත් සඳක් පායා සිනාසෙයි මන්දරමේ
තඹර පෙතිවන් දෙනෙත් අතරින් වැස්සෙයි කරුණා සෙනේ
සිනිඳු සළු රජ බොජුන් නැතුවට දංකුඩෙන් කුස පිරෙව්වේ
නුඹයි පෙර සිට පතාගෙන එන මැණී මගෙ සංසාරයේ

සෙවණැල්ල සේ ඉඳින් මා හා සසර සක්මන් කරපු දේවී
මගේ සැප ගැන මටත් වැඩියෙන් හොඳින් විමසුම් කරපු දේවී
හිතේ ශක්තිය කයට අරගෙන රකින්නට අප වෙහෙසුනී
තාම ඒ සෙනෙහසින් දෙතනේ කිරි එරෙනවද මගේ මැණී

සරසවියෙ තුරු සෙවණටත් වඩා ඔබේ උණුහුම මට සැපයි
මෙහේ දෙන පිටිකිරි එකට වඩා ඔබේ තේ එක මට රසයි
හැඳි අරන් මේසයට ඉඳගෙන මෙහෙම කන එක විකාරයි
ඊට වැඩියෙන් අම්මෙ ඔබ මට අනලා කැව් බත් කට රසයි

සිරි යහන් නෑ පන්පැදුරෙ රෑ ගුලිවෙලා හිඳ ඔබ ළඟින්
සවන් පිනවන ගී ගියූ හැටි තාම ඇසෙනවා සිහිනයෙන්
කොයිතරම් අය ළඟින් හිටියත් මං ඉන්නෙ හරි පාළුවෙන්
අම්මෙ මං ඉක්මනට ඇවිදින් ඉඳිම් සැමද ඔබ ළඟින්

● **තක්ෂිලා දිල්රුක්ෂි**
**මාර/දෙයියන්දර ජා.පා.**
**දෙයියන්දර**

## කිඩාරම් මලක්

ලස්සන සුදු කුසුම කී
නෙතඟට සුව දසුන කී
මුදු පහසක් විඳින්න බැරි
වෙන අයෙකුගෙ මැණික කී

සමනලයෙකු හට ඉඩ
නොමවෙයි තව බොරු වැඩ
රඟ පෙන්වයි ළංවීලා
නොගැසිය හැකි වෙයි මඩ

පා ආඩම්බර ගති
අන් කෙනෙකුට හිමි නැති
අතු අග පිපි දුහුල් මලකි
ළං වෙන්නට ඉඩ නැති

නොසිතුව දෙය සිදු වෙලා
මේ මල මුකුලිත වෙලා
මයුර රැඟුම රඟපෑවට
වෙන බඹරෙක් ළං වෙලා

බඹරෙකු ළං වී හොරා
මෙම කුසුමෙනි පැණි උරා
තිබුණ සුවඳ විසුරුණේය
අව ලස්සන ගති පෙරා

පෙන්වුව පිවිතුරු කම
නැහැ දැකුමට සිතු වම
ඇලී තැලී පොඩි වුණ පසු
දුගඳයි දැන් බැලු වම

● **ක.ආ.ජයරත්න සිරිසේන**
**කොටිකාවත්ත**

## අම්මේ නුඹයි මගෙ අප්පා

අහසින් දෙවියො බැස ගිය එක සමයකදී
ඔබ තනි වුණා යා යුතු එක ගමනකදී
පිරිවර නැයො හැරගිය එක් යුගයකදී
ඔබ මට දිවිය දුන්නා එක මොහොතකදී

සම් මස් නහර පතුලේ කිමිදී ඉන්න
ඔබ මට ඇතින්නකි දිවියේ අත දුන්න
ඔබෙ නෙත් කෙවෙනි පැරී උතුරා යන්න
කඳුළැලි දුන්නෙ කවුරුන් දැයි පවසන්න

පිය නැති පුතෙක් හැදුවත් නුඹ දුක් විඳලා
ලෝකෙට පෙනුණෙ නුඹ යක්ෂණියක් කියලා
ඇහු දුටු එවුන් තැන තැන නුඹෙ ගතු ගොතලා
කිව්වත් අම්මෙ ඉන්නම් වැල මෙන් එතිලා

සසරින් සසර හමුවන හැම භවයකම
එන්නෙමි පුරුදු විලසින් ඔබ පසුපසම
අප්පා කුමට නුඹමයි මගෙ හැම සැපම
ඉන්නම් අම්මෙ ඔබෙ සිත ළඟ හැමදම

● **ජී.ජේ.අමරා ජයකොඩි**
**වැල්ලව**



## කවි යාය

ඔබේ කවි නිර්මාණ පහත
ලිපිනයට එවන්න.

"කවි යාය"
'ධරණී' කර්තෘ මණ්ඩලය,
අංක 91,
විජේරාම මාවත,
කොළඹ 07
නැතිනම්
dharanee.editor@liberty.lk
ලිපිනයට ඊමේල් කරන්න

සංස්කරණය - මනෝරා ප්‍රේමතිලක

## රාගය

දුෂ්ඨ අසංවර
රාග සිත
දුවයි හැමතැන
කෙසේ එක්තැන් කරන්න ද
මහ සයුරේ
වෙරළේ ගැටී
එහෙ මෙහෙ විසිරෙන
රළ මෙන්
රාගයෙන් මත්වී
දුවයි හැමතැන

● **වැලිකලගේ සිරිපාල**
**මතුගම**

## පෝද ගෙවෙයි

පුන්සඳ එළියයි - සදහම් සුවඳයි
පෝ දින ගෙවි ගෙවි යන්නේ
පන්සල අත ළඟ බුදු හිමි පුද දී
කෙලසද පින් කරගන්නේ

දිගු කලකින් නෑ - බුදුහිමි දුටුවේ
විහාරගෙයි බුදු හිමි තනිවී
දන් පැන් නෑ - පූජා කරගත්තේ
අහෝ දුකකි කළ පව් පලදී

වසංගතය දරුණුව පැතිරෙන්නේ
මරුකට ළඟ මනුසත බියවී
නිවන් දකින්නට පෙරුම් පුරන්නේ
කොහොමද බුදු හිමියනි නොදනී

● **නිරෝෂා ශ්‍යාමලී**
**කොටදෙණියාව**

අධික තරබාරුව හා
අධික කෙට්ටුවීම
සඳහා වෛද්‍ය ප්‍රතිකාර
ප්‍රවීන වෛද්‍යවරියකගෙන්
සෙත් රෝහල - හෝමගම
සක්යා - මාතර
0113 031 717 / 0112 748 808 / 070 387 6241

සමීර ගජකේෂරි කරල්
තාරුණ්‍යයේ චමත්කාරය
ලිංගික ශක්තිය වර්ධනයට
සහ ස්නායු දුබලතාවයට
ස්ත්‍රී/පුරුෂ
දෙපක්ෂයටම සුදුසුයි


කරල් 40
රු.500
ලිංගික රෝග පිළිබඳ සායන
බදාදා, බ්‍රහස්පතින්දා, සිකුරාදා
(පෙ.ව. 9.00 - ප.ව. 3.00)
නොමිලේ පැවැත්වේ.
දින වෙන්කරගෙන පැමිණෙන්න.
සුගත රසායනාගාරය (පුද්) සමාගම
E-Mail: suensuherbals@gmail.com
138/6, අඟුරුවාතොට පාර, හොරණ
034-22 61 306

ඔබ කණස්සල්ලෙන්ද?
❖ දරුඵල ප්‍රමාදවීමට
❖ ස්ත්‍රී පුරුෂ මදසරු බව
❖ අධික කාෂ හා තරබාරු බවට

නොවරදින ප්‍රතිකාර
ඔසුසෙත ආයුර්වේද වෛද්‍ය මධ්‍යස්ථානය
වින්සන්ට් ලැන්ඩ්, මල්කඩුවාව, කුරුණෑගල
දුරකථන : 071 057 8666

සුදු කබර / පොතු කබර
විශේෂ ප්‍රතිකාර
චර්ම රෝග විශේෂ වෛද්‍යවරයෙක් විසින්
සහන චැනල් සෙන්ටර්
68, පේරාදෙණිය පාර, මහනුවර, (වෙබ්ලි සිනමා අසල)
හමුවීම ඉරිදා 8.00 සිට 10.00 දක්වා
විමසීම්: 0777 488932, 0718202297, 0727900990
ශාඛාවන් :- හෝමාගම / මීගමුව
පළමු දින පැමිණ සුව වූ රෝගීන්ගෙන් විමසා බලා ප්‍රතිකාර ලබා ගන්න




කොළඹ 7 විජේරාම මාවත අංක 91 හි පිහිටි ලිබර්ටි පබ්ලිෂර්ස් (පෞද්ගලික) සමාගම විසින්, මල්වාන කළුකොඳයාවේ පිහිටි සිය මුද්‍රණාලයේ මුද්‍රණය කර ප්‍රසිද්ධ කරන ලදී.